# වාර්ෂික කාර්යසාධන වාර්තාව

# 2021

කම්කරු අමාත්‍යාංශය

# වාර්ෂික කාර්යසාධන වාර්තාව

## 2021

කම්කරු අමාත්‍යාංශය

(කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය)

# වාර්ෂික කාර්යසාධන වාර්තාව 2021

වැය ශීර්ෂ අංක 193

සියලු හිමිකම් ඇවිරිණි
2022 ජූනි

**සම්පාදනය**
සැලසුම්, පර්යේෂණ හා සංවර්ධන අංශය

**ප්‍රකාශනය**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය
7 මහළ, "මෙහෙවර පියෙස"
නාරාහේන්පිට
කොළඹ 05
දුරකථනය: 011 2581991





## ගරු කම්කරු අමාත්‍යතුමාගේ පණිවුඩය

**මනුෂ නානායක්කාර (පා.ම.)**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය

කම්කරු අමාත්‍යාංශය 2021 වර්ෂය තුළ අත්පත් කරගත් ප්‍රගතිය ඇතුළත් කාර්යසාධන වාර්තාවට පණිවුඩයක් එක් කිරීමට ලැබීම පිළිබඳව මම අතිශයින් සතුටු වෙමි.

රටේ ආර්ථිකයේ ජීවනාලිය වන වැඩ කරන ජනතාවගේ, වෘත්තීය අයිතිවාසිකම් ආරක්ෂා කිරීම හා සේවා සුරක්ෂිතතාව තහවුරු කිරීම කම්කරු අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යයකි. එසේම, පෞද්ගලික අංශයේ සේවක ආරක්ෂාව ඇති කිරීම හා නිපුණ විදේශ ශ්‍රමික බලකායක් ඇති කිරීම යන ක්ෂේත්‍රයන් යටතේ වූ කාර්යයන් සුවිශේෂී ප්‍රමුඛතා ලෙස හඳුනා ගනිමින් වැඩ කරන ජනතාවගේ අයිතිවාසිකම් සුරක්ෂිත කරමින් ඵලදායිතාවය හා සුභසාධනය ඉහළ නැංවීමටත් කම්කරු අමාත්‍යාංශය හා ඊට අනුබද්ධ ආයතන වන කම්කරු දෙපාර්තමේන්තුව, ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය, ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය, කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය හා ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය විසින් කටයුතු කරනු ලබයි.

ඒ යටතේ කම්කරු ජනතාවගේ අයිතිවාසිකම් සුරක්ෂිත කරනු වස් අනාගත අභියෝගයන්ට සාර්ථකව මුහුණු දීමට හැකි වන සේ වර්තමානයට ගැලපෙන පරිදි, යල්පැන ගිය කම්කරු අණපනත් සංශෝධනය කිරීමට දැනටමත් පියවර ගෙන ඇත. තවද, රට තුළට ආයෝජන ගලා ඒමට හිතකර පරිසරයක් ඇති කිරීමට යෝග්‍ය වන පරිදි මෙන්ම කම්කරු නීති හා අණපනත් අතර පවත්නා සංකීර්ණතා ඉවත් කරමින් සංගතභාවය ආරක්ෂා වන පරිදි සරල කිරීම තුළින් සියලු පාර්ශවයන්ට ප්‍රතිලාභ ලැබෙන පරිදි මෙකී අණපනත් සංශෝධනය කිරීමට අවශ්‍ය කටයුතු කර ඇති බවත්, කම්කරු ජනතාවට ලැබෙන ප්‍රතිලාභ තවදුරටත් පුළුල් කිරීමට කටයුතු කර අති බවත් සතුටින් ප්‍රකාශ කරමි.

කොවිඩ් 19 වසංගතය හේතුවෙන් මෙම අමාත්‍යාංශයේ මෙහෙවර නව දිශාවකට යොමු කිරීමට සිදුවිය. වැඩ කරන ජනතාවගේ ආරක්ෂාව සැලසීම මෙන්ම ඔවුන්ගේ සෞඛ්‍ය ආරක්ෂිතබව තහවුරු කරමින් නිෂ්පාදන ක්‍රියාවලිය ශක්තිමත් කරනු ලබන ක්‍රමවේදය සවිමත් කිරීමේ අභියෝගය අප වෙත පැවරිණි. දේශීය මෙන්ම විදේශීය ශ්‍රමිකයන්ගේ රැකීරක්ෂා ආරක්ෂා කර ගැනීම සඳහාත්, ශ්‍රී ලංකාවේ රැකියා විරහිත වන අයට සහන සැලසීම සඳහාත් අප අමාත්‍යාංශයත්, ශ්‍රී

ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයත් එක්ව අදාළ පියවරයන් දැනටමත් සකස් කර ඇත. මෙරට ශ්‍රමිකයින්ගෙන් 60%ක් අවිධිමත් අංශය තුළ සේවය කරන අතර ඔවුන්ට සමාජ ආරක්ෂණ ක්‍රමවේදයක් හඳුන්වාදීම වැඩි අවධානයක් යොමු කළ යුතු තවත් අභියෝගයකි. ඒ සඳහා මෙන්ම අනපේක්ෂිත හේතූන් මත රැකියා අහිමි වූ සේවකයින්ට සහන සැලසීම සඳහා සමාජ ආරක්ෂණ අරමුදලක් පිහිටුවීම සම්බන්ධයෙන් අධ්‍යයනය කර යෝජනාවක් ඉදිරිපත් කිරීමට ජාතික කම්කරු උපදේශක සභාව මඟින් අනුකමිටුවක් පත් කර ඇත. අනුකමිටු නිර්දේශ මත මේ සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කරනු ලැබේ.

2021 වර්ෂය තුළ විශිෂ්ට කාර්යසාධනයක් අත්පත් කර ගැනීමට කටයුතු කළ හිටපු කම්කරු අමාත්‍ය ගරු නිමල් සිරිපාල ද සිල්වා මැතිඳුන් සහ හිටපු අමාත්‍යාංශ ලේකම් එම් පී ඩී යූ කේ මාපා පතිරණ මහතා වෙත කෘතඥතාව පළ කිරීමට මෙය අවස්ථාවක් කර ගනිමි. එසේම, මෙම කාර්යසාධනය අත්කර ගැනීමෙහිලා මහත් වූ කැපවීමෙන් ක්‍රියා කළ අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලයේ සියලුම නිලධාරීන්ටත්, අමාත්‍යාංශය යටතේ පවතින සියලුම ආයතන ප්‍රධානීන් ඇතුළු කාර්ය මණ්ඩල නිලධාරීන්ටත් මාගේ කෘතඥතාව පිරිනමමි.

**මනූෂ නානායක්කාර (පා.ම.)**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය



## කම්කරු අමාත්‍යාංශ ලේකම්තුමාගේ පණිවුඩය

**ආර් පී ඒ විමලවීර**
ලේකම්

තෘප්තිමත් ඵලදායි ශ්‍රී ලාංකික ශ්‍රම බලකායක් බිහි කිරීමේ අරමුණින් කම්කරු අමාත්‍යාංශය සහ ඒ යටතේ ඇති දෙපාර්තමේන්තු හා ආයතන විසින් 2021 වර්ෂය තුළ අත්පත් කරගත් කාර්යසාධනය සහ ඉදිරි කාල පරිච්ඡේදයේ දී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත සැලසුම් පිළිබඳව ඉදිරිපත් කරන මෙම ප්‍රකාශනය ඔබ අතට පත් කරන්නේ ඉමහත් සතුටිනි.

"පෞද්ගලික අංශයේ සේවකයින්ගේ වෘත්තීමය ආරක්ෂාව ඇති කිරීම සහ නිපුණ ශ්‍රම බලකායක් විදේශ රැකියා වෙළඳපොළ සඳහා බිහිකිරීම" යන ක්ෂේත්‍රයන් යටතේ වූ කාර්යයන් හා සුවිශේෂී ප්‍රමුඛතා, තිරසර සංවර්ධන ඉලක්ක සහ ශ්‍රී ලංකාව එකඟත්වය පළ කර ඇති ජාත්‍යන්තර කම්කරු සම්මුතීන්ට අනුකූලව මෙම අමාත්‍යාංශයේ වැඩසටහන් සකස් කර ඇත.

කම්කරු අමාත්‍යාංශයේ ප්‍රධාන වගකීමක් වන, වැඩකරන ජනතාවගේ අයිතිවාසිකම් ආරක්ෂා කර දීම මෙන්ම ඔවුන්ගේ සේවා සුරක්ෂිතභාවය සැලසෙන පරිදි රට තුළට ආයෝජන ගලා ඒමට හිතකර පරිසරයක් ඇති කිරීමට යෝග්‍ය වන අයුරින් අදාළ අණපනත් සංශෝධනය කිරීමට පියවර ගෙන ඇත. වර්තමාන හා අනාගත අභියෝගයන්ට සාර්ථකව මුහුණ දීමට හැකි වන පරිදි මෙන්ම අණපනත්හි පවත්නා සංකීර්ණතා ඉවත් කරමින් සහ සංගතභාවය ආරක්ෂා වන පරිදි සරල කිරීම තුළින් සියලු පාර්ශවයන්ට ප්‍රතිලාභ ලැබීම සහතික කරමින් අණපනත් සංශෝධන කටයුතු සිදු කරනු ලබයි. ප්‍රධාන අණපනත් කිහිපයක සංශෝධන කටයුතු 2021 වර්ෂය තුළ අවසන් කිරීමට හැකි වීම අප ලද ජයග්‍රහණයකි.

- රැකියාවන්හි යෙදීමේ අවම වයස අවුරුදු 14 සිට 16 දක්වා වැඩි කිරීම මඟින් දරුවන් අධ්‍යාපනයෙන් බැහැරවීම වළක්වා ආරක්ෂා කිරීම
- කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) පනත යටතේ එන වන්දි සූත්‍රයේ උපරිම වන්දි සීමාව රු. ලක්ෂ 12.5 සිට රු. ලක්ෂ 25 දක්වා වැඩි කිරීම
- රු. 10,000/- ලෙස පැවති ජාතික අවම වේතනය රු. 12,500/- දක්වා රු. 2,500/-කින් ඉහළ නැංවීම
- සේවක අර්ථසාධක අරමුදලේ සාමාජිකයන් සේවයට බැඳී දින දින 30ක් ඇතුළත ලියාපදිංචිය අනිවාර්යය කිරීමට සහ

සේවක අර්ථසාධක දායක මුදල් ගිණුම්ගත වීම පිළිබඳව සාමාජිකයන්ට කෙටි පණිවිඩයක් මඟින් (SMS) දැනුම් දීම
- තේ සහ රබර් වතු කම්කරුවන්ගේ අවම දෛනික වැටුප රු. 1,000/- දක්වා වැඩි කිරීම සඳහා අදාළ නීතිමය ප්‍රතිපාදන ඇති කිරීමේ කටයුතු
- සේවකයින් විශ්‍රාම ගැන්වීමේ අවම වයස් සීමාව අවුරුදු 60 දක්වා ඉහළ නැංවීම

එසේම, තවත් අණපනත් රාශියක සංශෝධන කටයුතු මේ වන විටත් සිදු කරමින් පවතින අතර ඒවා ඉදිරි වර්ෂය තුළ අවසන් කිරීමට අපේක්ෂිතය.

කොවිඩ් - 19 ගෝලීය වසංගත තත්වය හේතුවෙන් උද්ගත වූ අහිතකර බලපෑම් මධ්‍යයේ වුවද වැඩකරන කම්කරු ජනතාවගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමට ප්‍රමුඛතාවයක් දී කටයුතු කර ඇති අතර පවත්නා මූල්‍ය අභියෝග හමුවේ පවා පීඩාවට පත්ව සිටින සේවායෝජක ප්‍රජාව ද ආරක්ෂා කිරීමට හැකි සෑම උත්සාහයක්ම ගෙන ඇත. එසේම, උද්ගත වී ඇති ආර්ථික අභියෝග සඳහා සාර්ථකව මුහුණ දෙමින් රටෙහි ඉදිරි ආර්ථික දැක්මට අනුකූලව සැමට ප්‍රතිලාභ අත්කර දිය හැකි ක්ෂේත්‍රයන් පුළුල් කරමින් හා පසුබෑමට පත් වී ඇති අංශයන් නඟා සිටුවීමට අවශ්‍ය මංපෙත් විවර කර දෙමින් සේව්‍ය සේවක දෙපාර්ශවයේ යුතුකම්, වගකීම් හා අයිතිවාසිකම් තහවුරු කරමින් කාර්මික සාමය පවත්වා ගෙන යාම අප අමාත්‍යාංශයේ වගකීමකි.

එමෙන්ම, ජාත්‍යන්තර කම්කරු ප්‍රමිතීන්වලට ගරු කරමින් සුනිසි මෙහෙවර සංකල්පය මඟින් යහපත් වැඩ පරිසරයක් සහ යහපත් සේව්‍ය හා සේවක සම්බන්ධතාවයක් ගොඩනැඟීමේ අරමුණින් විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ සේව්‍ය සේවක දෙපාර්ශවයේම සහභාගීත්වය ඇතිව කම්කරුවන්ගේ අයිතීන් සුරක්ෂිත කිරීම හා කාර්මික සාමය පවත්වා ගෙන යාම සඳහා ජාතික කම්කරු උපදේශක සභාව නියමිත පරිදි පැවැත්වීම හා සියලු පාර්ශවයන් සමඟ නිරන්තර සංවාදයන්ට එළඹීම, ළමා ශ්‍රමය පිටු දැකීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ වැඩ කරන කාන්තාවන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත. අනපේක්ෂිත හේතූන් මත රැකියා අහිමි වූ සේවකයින්ට සහන සැලසීම සඳහා සමාජ ආරක්ෂණ අරමුදලක් පිහිටුවීම කාලීන අවශ්‍යතාවක් ලෙස හඳුනා ගෙන ඒ සම්බන්ධයෙන් අධ්‍යයනය කිරීම සඳහා ජාතික කම්කරු උපදේශක සභාව මඟින් අනුකමිටුවක් පත් කර ඇත. තවද, සේවක අර්ථසාධක අරමුදලේ ප්‍රතිලාභ ලබාදීම ඇතුළු කම්කරු දෙපාර්තමේන්තුව විසින් සිදු කරන සේවා සැපයීමේ කටයුතු ස්වයංක්‍රීයකරණය කිරීමේ හා සියලුම සේවාවන් එකම ස්ථානයකින් ලබා දීම සඳහා මූලික වැඩ කටයුතු දැනටමත් ආරම්භ කර ඇත. එසේම, මෙම අමාත්‍යාංශයට අනුබද්ධිත සියලුම ආයතන විසින් කම්කරු ප්‍රජාවගේ අයිතීන්, සුභසාධනය, සෞඛ්‍ය සහ අධ්‍යාපනය නඟා සිටුවීමේ වැඩසටහන් හා ව්‍යාපෘතින් ක්‍රියාත්මක කරනු ලබන අතර ඵලදායිතා සංකල්පය තුළින් පෞද්ගලික මෙන්ම රාජ්‍ය අංශයේ ආයතනයන් බල ගැන්වීම ද සිදු කරනු ලබයි.

ඉහත කාර්සාධනය ඉටු කිරීමට අවශ්‍ය නායකත්වය, මඟපෙන්වීම හා අනුශාසකත්වය ලබා දුන් හිටපු කම්කරු අමාත්‍ය ගරු නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමන් වෙත අප අමාත්‍යාංශයේ කෘතඥතාව පළ කරන අතර කම්කරු අමාත්‍යාංශයේ 2021 වර්ෂයේ කාර්යසාධනය අත්කර ගැනීමෙහිලා මහත් වූ කැපවීමෙන් ක්‍රියා කළ අමාත්‍යාංශයේ හිටපු ලේකම් එම් පී ඩී යූ කේ මාපා පතිරණ මහතාටත් කාර්ය මණ්ඩලයේ සියලුම නිලධාරීන්ටත්, අමාත්‍යාංශය යටතේ පවතින සියලුම ආයතන ප්‍රධානීන් ඇතුළු කාර්ය මණ්ඩල නිලධාරීන්ටත් මාගේ කෘතඥතාව පිරිනමමි.

**ආර් පී ඒ විමලවීර**
ලේකම්



# අන්තර්ගතය

ගරු කම්කරු අමාත්‍යතුමාගේ පණිවුඩය iii
කම්කරු අමාත්‍යාංශ ලේකම්තුමාගේ පණිවුඩය v
අන්තර්ගතය vii
වගු නාමාවලිය viii
ප්‍රස්තාර හා රූපසටහන් ix

**පළමු පරිච්ඡේදය 1**
**ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය 1**
කම්කරු අමාත්‍යාංශය 3
1.1 හැඳින්වීම 3
1.2 දැක්ම, මෙහෙවර හා අරමුණු 3
1.3 ප්‍රධාන කාර්යයන් 4
1.4 සංවිධාන සටහන 5
1.5 අමාත්‍යාංශය යටතේ පවතින අංශ 6
1.6 අමාත්‍යාංශය යටතේ පවතින ආයතන 8
1.6.1 කම්කරු දෙපාර්තමේන්තුව 8
1.6.2 ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය 9
1.6.3 ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය 10
1.6.4 කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය 10
1.6.5 ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය 11

**දෙවන පරිච්ඡේදය 13**
**ප්‍රගතිය හා ඉදිරි දැක්ම 13**
2.1 විශේෂ ජයග්‍රහණ, අභියෝග හා ඉදිරි දැක්ම 15
2.2 අමාත්‍යාංශයේ ප්‍රගතිය 24

**තුන්වන පරිච්ඡේදය 67**
**2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්යසාධනය 67**
3.1 2021.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය 69
3.2 2021.12.31 දිනට මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය 70
3.3 2021.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය 71
3.4 මූල්‍ය ප්‍රකාශ සටහන් 72
3.5 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය 72
3.6 වෙන් කරන ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය 72
3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම අමාත්‍යාංශයට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන 73
3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය 73
3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව 74

**සිව්වන පරිච්ඡේදය 89**
**කාර්යසාධන දර්ශක 89**
4.1 අමාත්‍යාංශයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව) 91

**පස්වන පරිච්ඡේදය 93**
**තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය 93**
5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු 95
5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනිමේ ජයග්‍රහණ හා අභියෝග 99

**සයවන පරිච්ඡේදය 101**
**මානව සම්පත් පැතිකඩ 101**
6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය 103
6.2 ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපා ඇති ආකාරය 103
6.3 මානව සම්පත් සංවර්ධනය 103

**සත්වන පරිච්ඡේදය 113**
**අනුකූලතා වාර්තාව 115**

# වගු නාමාවලිය


2-1 සමාජ කතිකා වැඩසටහන්වල ප්‍රගතිය - 2021 ... 27
2-2 වැඩ වර්ජන පිළිබඳ දත්ත වාර්තා - 2020 වසරට සාපේක්ෂව 2021 වර්ෂය ... 30
2-3 ශ්‍රමික අයිතීන් ප්‍රමිතිගත කිරීමේ ක්‍රියාකාරකම් - 2021 ... 31
2-4 අවම වැටුප් යාවත්කාලීන කළ පඩි පාලක සභා ... 32
2-5 සේවා ස්ථානවල සෞඛ්‍යාරක්ෂිත බව පරීක්ෂාවට ලක් කිරීම සඳහා සිදු කරනු ලැබූ ක්‍රියාකාරකම් - 2021 ... 33
2-6 සේවා ස්ථානවල සෞඛ්‍යාරක්ෂිත බව ආරක්ෂා කිරීමට අවශ්‍ය දැනුම ලබා දීම සහ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම - 2021 ... 34
2-7 වෘත්තීය සුරක්ෂිතතාව ඉහළ නැංවීම් සඳහා සිදු කරන ලද දැනුවත් කිරීමේ වැඩසටහන් - 2021 ... 35
2-8 වෘත්තීය සෞඛ්‍ය හා සුරක්ෂිතතාව පිළිබඳ ප්‍රවර්ධන වැඩසටහන් ... 36
2-9 වෘත්තීය ආරක්ෂාව සහ සෞඛ්‍ය පිළිබඳ පුහුණු වැඩසටහන් - ජා. වෘ. සු. හා සෞ. ආ. ... 37
2-10 රැකියාවක නියුතු කාන්තාවන්, තරුණ අය හා ළමුන් පිළිබඳ පවත්නා නීති ක්‍රියාත්මක කිරීම - 2021 ... 38
2-11 සේවක අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභ ලැබූ සංඛ්‍යාව - 2021 ... 44
2-12 අනුමත අර්ථසාධක අරමුදල් අධීක්ෂණ ප්‍රගතිය - 2021 ... 44
2-13 අධිකරණ අනුව නඩුවල කාර්යසාධනය - 2021 ... 45
2-14 ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ මූල්‍ය ප්‍රගතිය ... 48
2-15 වාර්තා වූ මාරක සහ මාරක නොවන අනතුරුවල ස්වභාවය ... 50
2-16 වාර්තා වූ මාරක නොවන අනතුරුවල හානියේ ස්වභාවය ... 51
2-17 වන්දි ගෙවීමේ කටයුතුවල භෞතික හා මූල්‍ය ප්‍රගතිය - 2021 ... 52
2-18 ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය විසින් පවත්වන ලද පුහුණු වැඩසටහන් ... 53
2-19 ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලයේ ආදායම් උත්පාදනය ... 54
2-20 සුනිසි මෙහෙවර වැඩසටහනෙහි ප්‍රගතිය ... 55
2-21 කම්කරු දෙපර්තමේන්තුවේ ධාරිතා වර්ධන ක්‍රියාකාරකම් සඳහා 2021.12.31 දිනට සමස්ත වියදම ... 59
2-22 ආයතන කටයුතුවල ප්‍රගතිය ... 61
2-23 කම්කරු දෙපාර්තමේන්තුවේ ඉදි කිරීම් කටයුතුවල ප්‍රගතිය ... 63
2-24 අමාත්‍යාංශයේ සමස්ත මූල්‍ය ප්‍රගතිය ... 65
3-1 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය ... 72
3-2 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය ... 72
3-3 වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම අමාත්‍යාංශයට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන ... 73
3-4 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය ... 73
4-1 අමාත්‍යාංශයේ කාර්යසාධන දර්ශක ... 91
5-1 අමාත්‍යාංශයට අදාළ තිරසර සංවර්ධන අරමුණු ... 95
6-1 2021.12.31 දිනට අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලය ... 103
6-2 අමාත්‍යාංශ නිලධරයන් දේශීය පුහුණු පාඨමාලා සඳහා සහභාගීත්වය ... 103
6-3 කම්කරු දෙපාර්තමේන්තුවේ නිලධරයන් දේශීය පුහුණු පාඨමාලා සඳහා සහභාගීත්වය ... 105
6-4 විදේශ පුහුණු පාඨමාලා සඳහා නිලධරයන්ගේ සහභාගීත්වය ... 109
7-1 අනුකූලතා වාර්තාව ... 115


# ප්‍රස්තාර හා රූපසටහන්

## ප්‍රස්තාර


2-1 කම්කරු පරීක්ෂණ - 2020 වර්ෂයේ ප්‍රගතියට සාපේක්ෂව 2021 වර්ෂයේ ප්‍රගතිය ... 28
2-2 2020 වර්ෂයට සාපේක්ෂව 2021 වර්ෂයේදී කාර්මික ආරවුල් සහ ව්‍යවස්ථාපිත නීති උල්ලංඝනය වීම් පිළිබඳ පැමිණිලි ලැබීම් හා විසඳීම් ... 29
2-3 දිස්ත්‍රික් හා උප කම්කරු කාර්යාල මඟින් පවරන ලද නඩු සහ විසඳී ඇති නඩු - 2021 ... 46
2-4 ජා. ශ්‍ර. අ. ආ. විසින් 2021 වර්ෂය තුළ පුහුණු කටයුතුවලින් ලද ආදායම ... 48
2-5 පුහුණු ක්‍රියාකාරකම්වලින් ලැබෙන ආදායම - ජා. ශ්‍ර. අ. ආ. ... 49
2-6 වාර්තා වූ මාරක අනතුරු සංඛ්‍යාව - 2021 ... 50
2-7 වාර්තා වූ මාරක නොවන අනතුරු සංඛ්‍යාව - 2021 ... 50
2-8 සංචාරක අධිකරණ ප්‍රදේශ අනුව වාර්තා වූ අනතුරු ප්‍රමාණය - 2021 ... 51
2-9 2016 සිට 2021 දක්වා සිදු කරන ලද කම්කරු පරීක්ෂණ සංඛ්‍යාව ... 58
2-10 සේවක අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභ ගෙවීම සඳහා ගතවූ කාලය - 2017 සිට 2021 දක්වා ... 59
2-11 අභ්‍යන්තර විගණන කටයුතුවල ප්‍රගතිය ... 66


## රූපසටහන්


රූපසටහන 1-1 අමාත්‍යාංශයේ සංවිධාන සටහන ... 5

## පළමු පරිච්ඡේදය

ආයතනික පැතිකඩ /
ක්‍රියාවට නැංවීමේ සාරාංශය

# කම්කරු අමාත්‍යාංශය

## 1.1 හැඳින්වීම

කම්කරු නීති ප්‍රඥප්ති ප්‍රමිති සම්බන්ධයෙන් ජාත්‍යන්තරය සමඟ සබඳතා පවත්වා ගනිමින්, කම්කරු ප්‍රජා ආරක්ෂණය, සුබසාධනය සිදු කිරීම හා කාර්මික සාමය හා සහයෝගීතාවය ප්‍රවර්ධනය කිරීම කම්කරු අමාත්‍යාංශයේ විෂයපථයට අයත් වේ. සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුකූලව සහ රජය මඟින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා "පෞද්ගලික අංශයේ සේවකයන්ගේ වෘත්තීමය ආරක්ෂාව ඇති කිරීම සහ නිපුණ ශ්‍රම බලකායක් විදේශ රැකියා වෙළඳපොළ සඳහා බිහිකිරීම" පිණිස රාජ්‍ය අමාත්‍යාංශය සඳහා ප්‍රතිපත්තිමය මඟ පෙන්වීම සිදු කිරීම සහ නියමිත නීති සහ අණපනත්වලට අනුකූලව කම්කරු විෂයට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් හා ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසුවිපරම් කිරීම හා ඇගයීම මඟින් අමාත්‍යාංශයේ දැක්ම සාක්ෂාත් කර ගැනීමට කටයුතු කරනු ලැබේ. ඒ අනුව, අමාත්‍යාංශයේ දැක්ම, මෙහෙවර හා අරමුණු පහත පරිදි වේ.

## 1.2 දැක්ම, මෙහෙවර හා අරමුණු

**දැක්ම**

තෘප්තිමත් ඵලදායි ශ්‍රී ලාංකික ශ්‍රම බලකායක්

**මෙහෙවර**

කාර්මික සාමය හා සහයෝගීතාව සමාජ සුරක්ෂිතතාවය, කම්කරු අයිතිවාසිකම් හා ඵලදායිතාව තුළින් සමාජ ආර්ථික සංවර්ධනයට දායක වීම

**අමාත්‍යාංශයේ අරමුණු**

- ත්‍රෛපාර්ශවීය සවිබල ගැන්වීම තුළින් සේව්‍ය-සේවක සබඳතා ශක්තිමත් කිරීම
- ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව සේවා තත්ත්වයන් හා සේවක අයිතීන් තහවුරු කිරීම
- ළමා ශ්‍රම යෙදවුම් තුරන් කිරීම
- රැකියාවල නියුතු කාන්තාවන් සවිබල ගැන්වීම, වෘත්තීමය ආරක්ෂාව ශක්තිමත් කිරීම හා වෘත්තීමය නීති, අයිතිවාසිකම් තහවුරු කිරීම
- කම්කරු නීති රීති හා පරිපාටිවල නම්‍යශීලීත්වය ඉහළ නැංවීම
- වැඩ කරන ජනතාවගේ සමාජ සුරක්ෂිතභාවය තහවුරු කිරීම සඳහා සුදුසු ක්‍රමෝපායන් සකස් කිරීම
- නිපුණ විදේශ රැකියා බලකායක් බිහි කිරීම සඳහා ප්‍රතිපත්තිමය මඟ පෙන්වීම

අමාත්‍යාංශය යටතේ පවතින සියලුම ආයතන විසින් පහත දැක්වෙන විෂය ක්ෂේත්‍රයන් (Thrust Areas) ඔස්සේ කටයුතු කරනු ලබයි.

1. කම්කරු විෂයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය
2. කාර්මික සාමය හා සංහිඳියාව
3. කම්කරු ප්‍රමිතීන් සහ නීති රීති ක්‍රියාත්මක කිරීම
4. කාන්තා ශ්‍රමිකයින්ගේ අයිතිවාසිකම් සුරැකීම හා ළමා ශ්‍රමය පිටු දැකීම
5. වෘත්තීය සුරක්ෂිතතාවය හා සෞඛ්‍ය
6. සමාජ ආරක්ෂණය
7. කම්කරු ක්ෂේත්‍රයට අදාළ අධ්‍යාපනය, පුහුණුව, පර්යේෂණය සහ සංවර්ධනය

### 1.3 ප්‍රධාන කාර්යයන්

1. කම්කරු අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

2. ජාත්‍යන්තර කම්කරු ප්‍රමිතීන්, සේවක පරිපාලනය සහ සුභසාධනය සම්බන්ධයෙන් ප්‍රතිපත්ති සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම

3. ජාත්‍යන්තර කම්කරු සංවිධානය සහ ජාත්‍යන්තර සමාජ ආරක්ෂණ සංවිධාන සමඟ අන්තර් සහයෝගීතාව පවත්වා ගැනීම

4. සේවක අර්ථසාධක අරමුදල, පෞද්ගලික අර්ථසාධක අරමුදල් සහ පෞද්ගලික විශ්‍රාම ගැන්වීමේ ක්‍රම පරිපාලනය කිරීම

5. කාර්මික සබඳතා සහ කාර්මික ආරවුල් නිරාකරණය කිරීම පිණිස ක්‍රමවේද සකසා එහි කාර්යක්ෂම ක්‍රියාකාරීත්වය නියාමනය කිරීම


6. කම්කරු සබඳතාවලට අදාළ නීති රීති සම්පාදනය සහ නියාමනයට අදාළ කටයුතු

7. වෘත්තීය සමිති ලියාපදිංචි කිරීම සහ රාජ්‍ය සහ පෞද්ගලික අංශවල සියලුම වෘත්තීය සමිතිවල කටයුතු රටේ සංවර්ධනයට යොදා ගැනීම සඳහා අවශ්‍ය සාධනීය පියවරයන් හඳුන්වා දීම සහ ක්‍රියාත්මක කිරීම

8. කම්කරු දෙපාර්තමේන්තුව, ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය, ජාතික වෘත්තීය සුරක්ෂිතතා සහ සෞඛ්‍ය ආයතනය, කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය හා ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය යන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයන්ට අදාළ කටයුතු සහ ආයතනයන් අධීක්ෂණය



### 1.4 සංවිධාන සටහන



රූපසටහන 1-1 අමාත්‍යාංශයේ සංවිධාන සටහන

V - පුරප්පාඩු
කා. කා. ස. - කාර්යාල කාර්ය සහායක
ස. අර්. කා. සං. - සැලසුම්, පර්යේෂණ හා සංවර්ධන

## 1.5 අමාත්‍යාංශය යටතේ පවතින අංශ

### 1.5.1 පාලන සහ ආයතන අංශය

අමාත්‍යාංශයේ පරිපාලනය, කළමනාකරණය, සාමාන්‍ය නඩත්තුව, පුහුණු කිරීම සහ අමාත්‍යාංශයත් අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආයතනත් සම්බන්ධීකරණය කිරීම සහ මානව සම්පත් කළමනාකරණය හා ඒ ආශ්‍රිත රාජකාරි මේ යටතේ සිදු වේ. ඒ අනුව,

I. අමාත්‍යාංශයට අනුයුක්ත සියලුම රාජ්‍ය නිලධාරීන්ගේ මෙන්ම ගරු අමාත්‍යතුමන්ගේ සහාය කාර්ය මණ්ඩලයට අදාළ පෞද්ගලික ලිපිගොනු නඩත්තුව හා ඒ ආශ්‍රිත අනෙකුත් ආයතන කටයුතු හා කාර්ය මණ්ඩල තොරතුරු යාවත්කාලීනව පවත්වා ගැනීම

II. කම්කරු අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතනවල සේවය කරන නිලධාරීන්ගේ අමාත්‍යාංශය සම්බන්ධයෙන් සිදුකළ යුතු ආයතන කටයුතු

III. විදේශ දූත මණ්ඩල රාජකාරි සඳහා කම්කරු නිලධාරින් යෙදවීම ආශ්‍රිත රාජකාරි

IV. අමාත්‍යාංශය සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශ සැකසීම හා අමාත්‍ය මණ්ඩල තීරණ පිළිබඳ ක්‍රියා කිරීම මෙම ඒකකය මඟින් සිදු කරනු ලබන අතර ඒ යටතේ, පවතින කම්කරු නීතිය යාවත්කාලීන කිරීම හා නව නීති පැනවීම තුළින් කාර්මික සහයෝගිතාව ඇති කිරීමට ප්‍රතිපත්තිමය දායකත්වය සපයයි

V. උපදේශක කාරක සභා, මහජන පෙත්සම් කාරක සභා වෙතින් සිදු කරන යොමු කිරීම් සඳහා පිළිතුරු සැපයීම මෙන්ම පාර්ලිමේන්තු ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීම ද සිදු කරනු ලබයි. ජනාධිපති කාර්යාලය හා අග්‍රාමාත්‍ය කාර්යාලය මඟින් යොමු කරන මහජන පැමිණිලි මෙන්ම සෘජුවම ලැබෙන මහජන ගැටළු අදාළ අංශ වෙත යොමු කිරීම ද සිදු කරනු ලබයි

### 1.5.2 සැලසුම්, පර්යේෂණ සහ සංවර්ධන අංශය

අමාත්‍යාංශය හා ඒ යටතේ වන සියලුම ආයතනවල සංවර්ධන වැඩසටහන් නිවැරදි ඉලක්ක ඔස්සේ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සැලසුම් සකස් කිරීම, ඒවා ක්‍රියාත්මක කරවීම, ප්‍රගති සමාලෝචනය හා පසු විපරම් කිරීම ප්‍රධාන කාර්යභාරය වන අතර පහත සඳහන් කාර්යයන් ද අංශය විසින් සිදු කරනු ලබයි.

I. අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතන විසින් සිදු කරනු ලබන සංවර්ධන ඉලක්කයන් ඇතුලත් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කර අදාළ පාර්ශව වෙත යොමු කිරීම. ශූන්‍ය පාදක අයවැය සංවර්ධන වැඩසටහන යටතේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ සෑම මසකම ප්‍රගතිය ඇගයීම මඟින් ඉලක්ක වෙත ළඟාවීම අධීක්ෂණය හා දිරිගැන්වීම

II. අදාළ චක්‍රලේඛ ප්‍රකාරව ජනාධිපති ලේකම් කාර්යාලය, මුදල් අමාත්‍යාංශය, ව්‍යාපෘති කළමණාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව සහ ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණය පැවැත්වීම හා ප්‍රගති වාර්තා මාසිකව හා ත්‍රෛමාසිකව ඉදිරිපත් කිරීම

III. කම්කරු ක්ෂේත්‍රයේ නව ප්‍රවණතා, කම්කරු ගැටළු සඳහා විසඳුම් ලබා ගැනීමට ප්‍රතිපත්තිමය මාර්ගෝපදේශයක් ලබා ගැනීම සඳහා වාර්ෂිකව කම්කරු ක්ෂේත්‍රයේ විවිධ කාලෝචිත තේමාවන් පාදක කර ගනිමින් විද්වත් කතිකාවතක් සංවිධානය කිරීම සහ එහි පර්යේෂණාත්මක ලිපි අඩංගු කරමින් ජර්නලයක් ප්‍රකාශයට පත් කිරීම

IV. සුනිසි මෙහෙවර වැඩසටහන ක්‍රියාත්මක කිරීම සම්බන්ධ සියලු කටයුතු සම්බන්ධීකරණය

V. අර්ධ වාර්ෂිකව ප්‍රකාශයට පත් කරන ශ්‍රී ලංකා සේවක සඟරාව ප්‍රකාශයට පත් කිරීම සම්බන්ධ සියලු කටයුතු සිදු කිරීම

VI. කම්කරු ක්ෂේත්‍රයට අදාළ ගැටළුවලට විසඳුම් ලබාදීම සඳහා වැඩකරන කරන ජනතාව පදිංචි ප්‍රදේශ තුළදීම ජංගම සේවා වැඩසටහන් සංවිධානය කිරීම

VII. අමාත්‍යාංශය විසින් අත්කරගත් ප්‍රගතිය ඇතුලත් වාර්ෂික කාර්යසාධන වාර්තාව සකස් කිරීම

VIII. පාර්ලිමේන්තුවේ අයවැය කාරක සභා අවස්ථාවට ඉදිරිපත් කිරීම සඳහා ප්‍රගති වාර්තාව සකස් කිරීම

### 1.5.3 කම්කරු හා විදේශ සබඳතා අංශය

ජාත්‍යන්තර කම්කරු සංවිධානය සමඟ එම සංවිධානයේ සාමාජික රටක් ලෙස ශ්‍රී ලංකාව විසින් ඇති කරගත් බැඳීම, අන්තර්ජාතික වශයෙන් පිළිගත් සම්මුතීන් හා නිර්දේශයන් යටතේ මෙරට කම්කරු අයිතීන් සුරක්ෂිත කිරීම සහ කම්කරු ක්ෂේත්‍රයේ ගැටළු විසඳීම සඳහා උපයෝගී කර ගැනීමට අදාළ වගකීම මෙම අමාත්‍යාංශය විසින් ඉටු කරනු ලබයි.

කම්කරු ක්ෂේත්‍රය සම්බන්ධයෙන් වන ජාත්‍යන්තර කම්කරු සංවිධානය හා අනෙකුත් බහුපාර්ශවීය නියෝජිත ආයතන උදෙසා සාමාජික රටක් වශයෙන් ශ්‍රී ලංකාවේ බැඳීම හා වගකීම් සපුරා ඇති බව සහතික කිරීම හා කම්කරු ප්‍රතිපත්ති සම්පාදනය කිරීම, ජාතික මට්ටමේ සමාජ සංවාද ඇති කිරීම සහ මානව සම්පත් සංවර්ධනය සඳහා ජාත්‍යන්තර සහාය ලබා ගැනීමට ද කටයුතු කරනු ලැබේ. ඒ අනුව, අංශය විසින් පහත කටයුතු සිදු කරනු ලබයි.

I. ත්‍රෛපාර්ශවීය නියෝජනයෙන් යුක්ත ජාතික කම්කරු උපදේශක සභා (NLAC) රැස්වීමේ දී පහසුකම් සපයන්නා ලෙසට ක්‍රියා කිරීම

II. කම්කරු ක්ෂේත්‍රයට අදාළ අණපනත් ප්‍රතිපත්තීන් සංශෝධනය කිරීම සම්බන්ධ ත්‍රෛපාර්ශවීය කමිටු රැස්වීම පැවැත්වීම

III. ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ ව්‍යවස්ථා අංක 22 යටතේ යැවිය යුතු වාර්තා සම්පාදනය කිරීම

IV. විදේශීය ශිෂ්‍යත්ව වැඩමුළු සහ පුහුණු වැඩසටහන් සඳහා මෙම අමාත්‍යාංශයට අදාළ අනෙකුත් ආයතන සහ කම්කරු දෙපාර්තමේන්තුවේ නිලධාරින් සහභාගි කිරීමට පියවර ගැනීම

V. EU GSP+ සහනය ලබා ගැනීම සම්බන්ධව ඇති ගැටළු නිරාකරණය කිරීමේ වාර්තාව සම්පාදනය කිරීම සහ GSP+ බදු සහනය අධීක්ෂණය කිරීම සඳහා පත් කරනු ලැබූ ත්‍රෛපාර්ශවීය කමිටුවේ රැස්වීම් පැවැත්වීම හා ඊට අදාළ සියලු කටයුතු සංවිධානය කිරීම සහ සහභාගි වීම

VI. ශ්‍රී ලංකාව හා විදේශ රටවල් අතර කම්කරු ක්ෂේත්‍රයට අදාළ සමාජ ආරක්ෂණ අධ්‍යාපනය සම්බන්ධයෙන් ඉදිරියේ දී ඇති කර ගැනීමට නියමිත අවබෝධතා ගිවිසුම් හා ඒ සම්බන්ධ සියලු වැඩසටහන්වලට අදාළව කටයුතු කිරීම

VII. සුනිසි මෙහෙවර වැඩසටහන (DWCP) යටතේ වන කාර්යසාධන බලකා රැස්වීම් සඳහා අදාළ කටයුතු සම්පාදනය හා ඊට අවශ්‍ය සහයෝගය ජාත්‍යන්තර කම්කරු සංවිධානයට ලබා දීම

VIII. ළමා ශ්‍රමය පිළිබඳ ජාතික ක්‍රියාකාරී කමිටුවට (NSCCL) අදාළ රැස්වීම් හා ඊට අදාළ සියලුම කටයුතු සම්බන්ධීකරණය කිරීම

IX. විදේශ කටයුතු අමාත්‍යාංශය හා අනෙකුත් රාජ්‍ය අමාත්‍යාංශ වෙත කම්කරු ක්ෂේත්‍රයට අදාළ වන නව ප්‍රවණතා පිළිබඳ වාර්තා සම්පාදනය කිරීම

X. රජයට පවරාගත් වතු සමාගම්වල සේවකයන්ට අය විය යුතු හිඟ අර්ථසාධක අරමුදල්, සේවක භාරකාර අරමුදල් හා පාරිතෝෂික මුදල් ගෙවීම පිළිබඳ කම්කරු දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව හා වතු කම්කරුවන් නියෝජනය කරන වෘත්තීය සංගම් සාමාජිකයන් සමඟ කාර්තුමය සමාලෝචන රැස්වීම් සංවිධානය කිරීම

XI. වාර්ෂිකව යැවිය යුතු ශ්‍රම සංඛ්‍යාලේඛන පිළිබඳව ප්‍රශ්නාවලියට පිළිතුරු ජාත්‍යන්තර කම්කරු සංවිධානය වෙත සැපයීම

XII. තාක්ෂණික සහාය ලබා දීම වෙනුවෙන් ශ්‍රී ලංකාවට පැමිණෙන ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ නිලධාරීන් සඳහා වීසා ඉල්ලීම් ලිපි විදේශ අමාත්‍යාංශයට ඉදිරිපත් කිරීම

### 1.5.4 මුදල් අංශය

වාර්ෂික අයවැය මඟින් අමාත්‍යාංශයට වෙන් කරන ලද මූල්‍ය සම්පත් රජයේ ප්‍රතිපත්තිවලට අනුකූලව අදාළ අරමුණු ඉටුකර ගැනීම සඳහා කාර්යක්ෂමව හා ඵලදායී ලෙස භාවිත කිරීමට අවශ්‍ය කටයුතු කිරීම අංශය විසින් සිදු කරනු ලබන අතර එයට පහත සඳහන් ප්‍රධාන ක්‍රියාකාරකම් අයත් වේ

I. 01/2020 රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛයට අනුව වාර්ෂික සමීක්ෂණ මණ්ඩලය පැවැත්වීම

II. මූල්‍ය අධිකාරියේ නියෝජිතායතනය සම්බන්ධ වාර්තා සකස් කිරීම සහ මූල්‍ය බලතල පැවරීමේ කටයුතු සිදු කිරීම

III. වාර්ෂික අයවැය ඇස්තමේන්තු සකස් කිරීම

IV. වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම

V. රජයේ ගිණුම් පිළිබඳ කාරකසභා වාර්තාව සකස් කිරීම, මහා භාණ්ඩාගාරයට හා අදාළ අනෙකුත් ආයතනවලට මාසිකව හා කාර්තුමය වශයෙන් මූල්‍ය වාර්තා ඉදිරිපත් කිරීම

### 1.5.5 අභ්‍යන්තර විගණන අංශය

ජාතික විගණන පනතේ 38 (ආ) සහ (ඊ)හි දක්වා ඇති පරිදි ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම ඉටු වන බවට සහතික කිරීම සඳහා එම පනතේ 40 වන වගන්තිය ප්‍රකාරව සිදුකර ඇති පත් කිරීම් හා මු.රෙ. 133 හා 134 ප්‍රකාරව අභ්‍යන්තර විගණන අංශයට ලැබී ඇති බලතල හා කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ අංක 01/2019 හා 2019/01/12 දිනැති චක්‍රලේඛයේ නියමයන් පරිදි අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන කටයුතු සිදු වේ.

කම්කරු අමාත්‍යාංශය හා ඒ යටතේ පවතින කම්කරු දෙපාර්තමේන්තුව, කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය, ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය, ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය සහ ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය යන ආයතනයන්හි මූල්‍ය කළමනාකරණය, අභ්‍යන්තර පාලනය සහ එම ආයතනයන්හි ඵලදායිතාවය යන කරුණු සම්බන්ධයෙන් පවතින දුර්වලතාවයන්, අඩුපාඩු වලක්වා ගැනීම හා අරමුණු ළඟා කර ගැනීම සඳහා ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සහ රජය විසින් නිකුත් කරන චක්‍රලේඛවලට අනුගතවීම සම්බන්ධ මඟ පෙන්වීම. සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශය, තිරසාර සංවර්ධන අභිමතාර්ථයන් වෙත ළඟා වීම සඳහා කම්කරු අමාත්‍යාංශය යටතේ පවතින ආයතනයන්හි ගැටළු අවම කර අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීමට දායකවීම හා විධිමත් අවංක සේවයක් උදෙසා අඛණ්ඩව සහයෝගය දැක්වීම ද සිදු වේ.

## 1.6 අමාත්‍යාංශය යටතේ ඇති ආයතන

### 1.6.1 කම්කරු දෙපාර්තමේන්තුව

පෞද්ගලික අංශයේ සහ අර්ධ රාජ්‍ය අංශයේ සේවයේ නියුතු සේවකයන්ගේ වෘත්තීය හිමිකම් තහවුරු කිරීම හා සමාජ ආරක්ෂණය ඇති කිරීම වෙනුවෙන් ක්‍රියාත්මක වන රාජ්‍ය ආයතනය කම්කරු දෙපාර්තමේන්තුව වේ. මෙම විෂය මධ්‍යම රජය යටතේ පාලනය වන්නක් හෙයින් දෙපාර්තමේන්තුව විසින් ඊට අදාළ අණපනත් ක්‍රියාත්මක කිරීම සහ අවශ්‍ය ප්‍රවර්ධනය කිරීම් සිදු කිරීම සඳහා, දීප ව්‍යාප්තව කම්කරු කාර්යාල පවත්වා ගනිමින් පැවරී ඇති වගකීම ඉටු කරනු ලබයි.

ශ්‍රී ලංකාවේ වතුවල සේවය කිරීම සඳහා බ්‍රිතාන්‍ය ජාතිකයන් විසින් ඉන්දියාවේ සිට මෙරටට ගෙන්වන ලද කම්කරුවන්ට සුබසාධනය සැපයීමේ අරමුණින් 1923 අංක 01 දරණ ඉන්දියානු ආගමික කම්කරු ආඥා පනතට අනුව මෙම දෙපාර්තමේන්තුව මුල් වරට පිහිටුවා ඇත.

එසේම, දිවයින පුරා විසිරී සිටින කම්කරු ප්‍රජාවගේ අපේක්ෂිත සේවා පහසුකම් සැපයීමේ අදිටනින් කලාප කම්කරු කාර්යාල 11ක් ද, දිස්ත්‍රික් කම්කරු කාර්යාල 40ක් ද, උප කම්කරු කාර්යාල 17ක් සහ දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු කාර්යාල 10ක් ද කම්කරු දෙපාර්තමේන්තුවේ කටයුතු විමධ්‍යගත කිරීම යටතේ, දිවයින පුරා පිහිටුවා සේවා සපයනු ලැබේ.



**ප්‍රධාන කාර්යයන්**

I. ආයතනවල සේවකයන් හා සේවායෝජකයන් අතර කතිකාවත ප්‍රවර්ධනය කිරීම

II. කම්කරු නීතීන් ක්‍රියාත්මක කිරීම හා සමාජ කතිකාවත ප්‍රවර්ධනය මඟින් කාර්මික ආරවුල් ඇතිවීම වැළැක්වීම හා ඇතිවූ ආරවුල් නිරවුල් කිරීම

III. ඵලදායීව කාලීන පරීක්ෂණ සිදු කිරීම සහ ඒ සඳහා දෙපාර්තමේන්තු නිලධරයන්ට ඇවැසි දැනුම නිරන්තරව යාවත්කාලීන කිරීම මඟින් සේවකයන්ගේ ව්‍යවස්ථාපිත හිමිකම් තහවුරු කිරීම

IV. සේව්‍ය, සේවක දෙපාර්ශවය තුළ කම්කරු නීති පිළිබදව පවතින දැණුම හා අවබෝධය පුළුල් කිරීම තුළින් කාර්මික සාමය තහවුරු කිරීම

V. ජාතික ආර්ථික ව්‍යුහයේ වෙනස්කම් අනුව උචිත වන්නා වූ ශ්‍රම ප්‍රමිතීන්, අන්තර්ජාතික ප්‍රමිතීන් අනුව යමින් සැකසීම හා ක්‍රියාවට නැංවීම

VI. සේවක අර්ථසාධක අරමුදල මනා ලෙස පරිපාලනය කිරීම තුළින් හිමිකරුවන්ට ප්‍රතිලාභ නියමිත පරිදි ලබා දීම තහවුරු කිරීම සහ එපරිදිම අනුමත පෞද්ගලික අර්ථසාධක අරමුදල් හා විශ්‍රාම දීමනා ක්‍රම පිළිබඳ පරිපාලනය

VII. කාන්තාවන්, තරුණ අය හා ළමුන් පිළිබඳ කම්කරු නීති ඇතුළු සියලු කම්කරු නීති සාධනීය ලෙස ක්‍රියාවට නැංවීම

VIII. වැඩ බිම තුළ සෞඛ්‍ය ආරක්ෂිත බව හා අනතුරු රහිත බව පිළිබඳව සේවකයන් දැනුවත් කිරීම, සෞඛ්‍යාරක්ෂිත බව තහවුරු කිරීම හා අනතුරු රහිත බව තහවුරු කිරීම

IX. ඉහත කාර්යයන් සඳහා තීරණ ගැනීමට අවශ්‍ය සංඛ්‍යාලේඛන දත්ත රැස් කිරීම හා විශ්ලේෂණය

X. ශ්‍රී ලංකාව විසින් අපරානුමත කර ඇති ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ සම්මුතීන් නීතියෙන් හා භාවිතයෙන් බලාත්මක කිරීමට කටයුතු කිරීම

XI. ළමා ශ්‍රමය හා අනතුරුදායක ළමා ශ්‍රමය තුරන් කිරීමට කටයුතු කිරීම

### 1.6.2 ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය

කම්කරු අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය 2007 සැප්තැම්බර් 11 වන දින ස්ථාපිත කර 2010 අංක 12 දරණ ජාතික ශ්‍රම අධ්‍යයන ආයතන පනත මඟින් බලාත්මක කරන ලදී. මෙම ආයතනය ත්‍රෛපාර්ශවීය හවුල්කරුවන් වන සේව්‍ය, සේවක හා රජයේ නිලධාරීන්ගෙන් සැදුම්ලත් පාලක මණ්ඩලයක් මඟින් පාලනය වේ. කම්කරු අණපනත්, නීති රීති හා රෙගුලාසි පිළිබඳව දැනුවත් වූ ඵලදායී ශක්තිමක් ශ්‍රම බලකායක් නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය පුහුණු හා අධ්‍යාපන කටයුතු සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම මෙම ආයතනය මඟින් සිදු කරනු ලබයි.

ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය සිය අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා කම්කරු නීතිය හා කාර්මික සබඳතා, මානව සම්පත් කළමනාකරණය සහ වැඩබිම් ඵලදායිතාව යන ප්‍රධාන විෂය ක්ෂේත්‍රයන් තුන ඔස්සේ පාඨමාලා පවත්වනු ලබයි. මෙම විෂය ක්ෂේත්‍රයන් අභ්‍යන්තර අංශ තුනක් මඟින් ක්‍රියාත්මක වන අතර පුහුණු සහ වැඩමුළු, කෙටිකාලීන පාඨමාලා, සහතිකපත් සහ ඩිප්ලෝමා පාඨමාලා වශයෙන් අංශ කිහිපයක් යටතේ ක්‍රියාත්මක වේ.

**අරමුණු**

I. දේශීය හා විදේශීය ආයතන සමඟ සහයෝගයෙන් ශ්‍රම අධ්‍යයන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ සංවර්ධන ක්‍රියාවලියට ක්‍රියාකාරී දායකයන් ලෙස සේවකයින්ගේ යහපැවැත්ම සහතික කිරීමට පියවර ගැනීම

II. ශ්‍රම අධ්‍යයනය පිළිබඳ සම්මන්ත්‍රණ, වැඩමුළු, සහ රැස්වීම් පැවැත්වීම සහ සඟරා, වාර සඟරා හා පොත් ප්‍රකාශයට පත් කිරීම

III. ශ්‍රම අධ්‍යාපනය සම්බන්ධ පර්යේෂණ, සමීක්ෂණ පැවැත්වීම සහ පාඨමාලා සංවිධානය කිරීම

IV. පුස්තකාල සහ තොරතුරු සේවා පිහිටුවීම සහ නඩත්තු කිරීම

V. සමාන අරමුණු සහිත දේශීය හා විදේශීය ආයතන, සංවිධාන, සංගම් සහ සමාජ සමඟ සමීප සබඳතාවයක් පවත්වා ගැනීම

VI. විශ්වවිද්‍යාල සහ ඒවාට අනුබද්ධ ආයතනවල සහාය ඇතිව ශ්‍රම අධ්‍යයනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලා ඇතුළු පාඨමාලා පැවැත්වීම සහ අවශ්‍ය විටෙක සහතික සහ ඩිප්ලෝමා ප්‍රදානය කිරීම

VII. කාර්මික සාමය පවත්වා ගැනීම අරමුණු කරගත් ක්‍රියාකාරකම්වල නිරත වීම

### 1.6.3 ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය

2009 අංක 38 දරණ ජාතික වෘත්තීය ආරක්ෂණ සහ සෞඛ්‍ය පිළිබඳ ආයතන පනත මඟින් එවක පැවති කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශයේ අනුබද්ධ ආයතනයක් ලෙසින් ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය පිහිටුවන ලදී. මෙරට තුළ මනා සෞඛ්‍ය හා ආරක්ෂණ ක්‍රියාමාර්ග තුළින් වෘත්තීය අනතුරු හා වෘත්තීය රෝග වැළැක්වීම හා නිවැරදි ආරක්ෂිත ප්‍රතිපත්තියක් හා ක්‍රමවේදයන් පිළිපැදීම තුළින් යහපත් වැඩ පරිසර තත්ත්වයක් සෑම පුද්ගලයෙකුටම ලබාදීමට මෙම ආයතනය කටයුතු කරන අතර මෙවැනි පුහුණුවක් තුළින් ප්‍රතිලාභ ලබාගත හැකි සේවක, සේව්‍ය හා ඕනෑම පුද්ගලයකු සඳහා අවශ්‍ය අධ්‍යාපනය ද මෙම ආයතනය විසින් ලබාදෙනු ලබයි.

**ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය විසින් පවත්වනු ලබන පාඨමාලා**

- වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍ය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව
- වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍ය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව
- වැවිලි අංශයේ වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍ය පිළිබඳ උසස් සහතිකය
- බොයිලේරු ක්‍රියාකරවන්නන් පුහුණු කිරීම
- කාර්මාන්තයන් පිළිබඳ වැඩ අධ්‍යයන වැඩසටහන
- කර්මාන්ත ක්ෂේත්‍රයේ හෙදියන් පුහුණු කිරීම
- රෝහල් කාර්ය මණ්ඩලය සඳහා වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍යය
- කාර්යාලයීය කාර්ය මණ්ඩලය සඳහා වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍යය
- පරීක්ෂණාගාරවල වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍යය
- රසායනික ද්‍රව්‍ය ආරක්ෂා සහිතව පරිහරණය කිරීම
- ආහාර පරිහරණය කරන්නන් සඳහා සුරක්ෂිතතාව සහ සෞඛ්‍යය
- ආපති කළමනාකරණ පුහුණු වැඩසටහන

### 1.6.4 කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය

සේවයේ යෙදී සිටින අවස්ථාවේ දී සිදුවන අනතුරු සම්බන්ධයෙන් වන්දි ලබාදීම සඳහා 1934 අංක 19 දරණ කම්කරු වන්දි ආඥා පනත පනවා ඇත. මෙම පනතට යම් යම් අවස්ථාවන්හිදී සංශෝධන කිහිපයක් ඇතුළත් වූ අතර, අවසාන සංශෝධනය 2005 අංක 10 පනතින් සිදුකර ඇත. කම්කරු වන්දි උසාවිය දිසා විනිසුරු හා මහේස්ත්‍රාත් බලතල සහිතව මුළු දිවයිනම ආවරණය වන පරිදි සංචාරක උසාවි 14කින් ද සමන්විත වේ. අධිකරණ සේවා කොමිෂන් සභාව මඟින් පත්කරනු ලබන අධිකරණ නිලධාරීන් වන කම්කරු වන්දි කොමසාරිස්, අතිරේක කම්කරු වන්දි කොමසාරිස් හා නියෝජ්‍ය කම්කරු වන්දි කොමසාරිස් යන තනතුරු 3කින් ද ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ I වන පන්තියේ තනතුරක්ද ශ්‍රී ලංකා පරිපාලන සේවයේ තනතුරක් ද ඇතුළු තනතුරු 43කින් සමන්විත වේ.

රැකියාවේ යෙදී සිටියදී සිදුවන අනතුරුවලින් තුවාල ලබන සේවකයින්ට, රැකියාවේ ස්වභාවය නිසා වැළඳුණු රෝගවලින් පීඩා විඳින සේවකයින්ට, සේවයේ යෙදී සිටින විට සිදුවන අනතුරුවලින් මියයන සේවකයින්ගේ යැපෙන්නන්ට වන්දි අයකර දීම ප්‍රධාන අරමුණ වේ. කම්කරු වන්දි අධිකරණ ක්‍රියාවලිය සඳහා අපරාධ නඩු විධාන සංග්‍රහය, සිවිල් නඩු විධාන සංග්‍රහය සහ සාක්ෂි ආඥා පනත අදාළ කර ගන්නා අතර අභියාචන පටිපාටිය දිසා අධිකරණයකට සමාන වේ.

**ප්‍රධාන කාර්යභාරයන්**

I. රාජ්‍ය හෝ පෞද්ගලික අංශයේ සේවා නියුක්තියේදී පැන නඟින හදිසි අනතුරු, වෘත්තීය රෝග සඳහා සේවා යෝජකයන්ගෙන් වන්දි අයකර ගැනීමට අදාළ ක්‍රියාකාරකම් සහ සේවකයන් මියයාමකදී යැපෙන්නන් සඳහා වන්දි අයකර දීම (2005 අංක 10 දරණ පනත මඟින් සිදු කරන ලද අවසන් සංශෝධන අනුව ලබාදිය හැකි උපරිම වන්දි මුදල රුපියල් 550,000/-කි. එය රුපියල් මිලියන 2 දක්වා වැඩි කිරීමට කටයුතු කරමින් පවතී)

II. මියගිය සේවකයෙකුගේ යැපෙන්නන්ට හිමිවන වන්දි මුදල පරිණතභාවයට පත්වන තෙක් කම්කරු වන්දි කොමසාරිස්වරයාගේ භාරකාරත්වය යටතේ තබා ගැනීම සහ ඒවා පරිපාලනය කිරීම

III. සේවායෝජකයා වන්දි ගෙවීම පැහැර හරින අවස්ථාවලදී, එවැනි සේවායෝජකයන්ගේ චංචල සහ නිශ්චල දේපල අත්පත් කර ගැනීම සහ වන්දි අයකර ගැනීම සඳහා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

IV. සේවක වන්දි රක්ෂණ බලපත්‍ර නිකුත් කිරීම, අලුත් කිරීම සහ අවලංගු කිරීම

V. සේවකයකුට සිදුවන අනතුරකදී ස්ථානීය පරීක්ෂණ පැවැත්වීම

VI. ශ්‍රී ලංකාවෙන් පිටත සිදුවන අනතුරු සඳහා ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කර ඇති නැව් සහ ගුවන් යානාවල සේවයේ නියුතු සේවකයන් සඳහා වන්දි අයකර ගැනීමට කටයුතු කිරීම

### 1.6.5 ජාතික එලදායිතා ලේකම් කාර්යාලය

වර්තමානයේ දී ජාතික එලදායිතා ලේකම් කාර්යාලය, කම්කරු අමාත්‍යාංශය යටතේ ස්ථාපිත අතර, 1966 වසරේ දී ආසියානු එලදායිතා සංවිධානයේ සාමාජිකත්වය ලබා ගැනීමෙන් අනතුරුව ශ්‍රී ලංකාව තුළ එලදායිතාව ඉහළ නැංවීම උදෙසා විවිධ ක්‍රියාමාර්ග දියත් කරන ලදී.

**ප්‍රධාන ක්‍රියාකාරකම්**

I. රාජ්‍ය, අධ්‍යාපන, සේවා, ප්‍රජා, සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් ඉලක්ක කර ගනිමින් එලදායිතා ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

II. එලදායිතා විෂයයන්ට අදාළ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- එලදායිතා ඩිප්ලෝමා වැඩසටහන්
- එලදායිතා සහතික පත්‍ර පාඨමාලා
- එලදායිතා කෙටිකාලීන පාඨමාලා
- පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන්

III. ආයතනවල එලදායිතාව වැඩිකිරීම සම්බන්ධයෙන් උපදේශක සේවාවන් ලබාදීම

IV. ආසියානු එලදායිතා සංගමය හා සම්බන්ධ වී වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- පුහුණු වැඩමුළු පැවැත්වීම
- E learning වැඩසටහන් පැවැත්වීම
- තාක්ෂණික විශේෂඥ සේවාවන් ලබාගැනීම තුළින් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

V. "5S" සහතිකකරණ වැඩසටහන ක්‍රියාත්මක කිරීම

VI. මාධ්‍ය හා ප්‍රචාරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

VII. ජාතික එලදායිතා සම්මාන තරඟාවලිය පැවැත්වීම

# දෙවන පරිච්ඡේදය

## ප්‍රගතිය හා ඉදිරි දැක්ම

# ප්‍රගතිය හා ඉදිරි දැක්ම

වැඩකරන ජනතාවගේ අයිතිවාසිකම් ආරක්ෂා කරදීම සහ ඔවුන්ගේ සේවා සුරක්ෂිතතාවය සලසා දීම කම්කරු අමාත්‍යාංශය සතු ප්‍රධාන මෙහෙවර වේ. එකී මෙහෙවර කරා ගමන් කිරීමේ දී විවිධ ක්‍රියාකාරකම් හරහා කම්කරු ප්‍රජාවට ගතික සේවාවක් සැපයීමේ වගකීම මෙම අමාත්‍යාංශය විසින් දරනු ලබයි. "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුකූලව රජය මඟින් ක්‍රියාත්මක කරනු ලබන ප්‍රතිපත්තීන් මත පිහිටා "පෞද්ගලික අංශයේ සේවක ආරක්ෂාව ඇති කිරීම සහ නිපුණ විදේශ රැකියා බලකායක් බිහි කිරීම" යන ක්ෂේත්‍රයන් යටතේ සඳහන් කර ඇති කාර්යයන් සහ සුවිශේෂී ප්‍රමුඛතා, තිරසර සංවර්ධන ඉලක්ක සහ ශ්‍රී ලංකාව එකඟත්වය පළ කර ඇති ජාත්‍යන්තර කම්කරු සම්මුතීන්ට අනුකූලව අමාත්‍යාංශයේ වැඩසටහන් සකස් කර ඇත. අමාත්‍යාංශය සහ අනුබද්ධිත ආයතන විසින් 2021 වර්ෂය තුළ කම්කරු ප්‍රජාව වෙනුවෙන් ඉටු කරන ලද කාර්යභාරය මෙම පරිච්ඡේදය මඟින් ඉදිරිපත් කර ඇත.

## 2.1 විශේෂ ජයග්‍රහණ, අභියෝග හා ඉදිරි දැක්ම

ශ්‍රී ලංකාව තුළ ආයෝජන හිතකාමී පරිසරයක් ඇති කිරීම උදෙසා මෙන්ම රටෙහි අනාගත අභිවෘද්ධිය අත්පත් කර ගැනීමට හැකි වන පරිදි පිළිගත් ජාතික හා ජාත්‍යන්තර සමාජ ආර්ථික තත්වයන්ට සහ කම්කරු ප්‍රඥප්ති හා ප්‍රමිතීන්ට අනුකූල වන අයුරින් නෛතික ප්‍රතිපාදන සම්පාදනය කර දීම අමාත්‍යාංශය සතු කාලීන වගකීමකි. එහි දී පවත්නා අණ පනත්, නීති රීති වර්තමාන හා අනාගත වැඩ ලෝකයට ගැලපෙන අයුරින් සංශෝධනය කිරීම මෙන්ම වැඩ කරන ජනතාවගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමට ද මෙම අමාත්‍යාංශය බැඳී සිටියි.

2021 වර්ෂයේ දී රට තුළ පැවති කොවිඩ් - 19 වසංගත තත්ත්වය හමුවේ වුවද කාර්මික සාමය පවත්වාගෙන යමින් කම්කරු ජනතාව වෙනුවෙන් විශේෂ ජයග්‍රහණ රැසක් අත්පත් කර දීමට අප අමාත්‍යාංශයට හැකි වීම පිළිබඳ ප්‍රකාශ කරනුයේ ගෞරව පූර්වකවය. එසේ අත්පත් කරගත් ජයග්‍රහණ හා ඉදිරි ඉලක්ක පහතින් සංක්ෂිප්තව දක්වා ඇත

### 2.1.1 සේවකයින්ගේ වෘත්තීය අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමේ අරමුණින් කම්කරු නීති වඩාත් ශක්තිමත් කිරීම

කම්කරු දෙපාර්තමේන්තුව ආරම්භ කරන ලද 1923 කාලයේ සිට පනවන ලද ආඥා පනත් හා පසුකාලීනව පනවන ලද පනත් 50ක් පමණ ශ්‍රී ලංකාව තුළ කම්කරු සුභසාධනය, හා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම උදෙසා වර්තමානයේ දී ක්‍රියාත්මක වෙමින් පවතී. ලාංකීය ශ්‍රම බලකාය මුහුණ දෙන වර්තමාන හා අනාගත කාලීන අභියෝග ජයගැනීම සඳහා සුදුසු වන ආකාරයට පවත්නා කම්කරු නීති සංශෝධනය කිරීමට සහ අළුතින් නීති සකස් කිරීමට කම්කරු අමාත්‍යාංශය විසින් පියවරයන් ගෙන තිබේ. වර්තමාන කම්කරු නීතියෙහි පවත්නා සංකීර්ණතා සහ ප්‍රායෝගික භාවිතයේ දී මතුවන ගැටළු හඳුනාගෙන සේව්‍ය - සේවක හා රාජ්‍ය යන ත්‍රෛපාර්ශවය වෙතම නීතියේ ආවරණය සැලසෙන පරිදි කම්කරු නීති සංශෝධනය හා නව නීති පැනවීම කෙරෙහි අමාත්‍යාංශයේ අවධානය යොමු වී ඇත.

**1. ජාතික අවම වේතනය රු. 10,000/- සිට රු. 12,500/- දක්වා රු. 2,500/-කින් ඉහළ නැංවීම**

සේවායෝජකයෙකු විසින් යම් සේවකයෙකු සේවයේ යොදවා ගැනීමේ දී මසකට ගෙවිය යුතුව තිබූ අවම වේතනය වන රු. 10,000/-ක මුදල 2021 අංක 16 දරණ සේවකයින්ගේ ජාතික අවම වේතනය (සංශෝධන) පනත මඟින් රු. 12,500/- දක්වා ඉහළ නංවන ලදී. 2021 අගෝස්තු මස සම්මත කරන ලද මෙම පනතින් ගෙවීමට නියම වන රු. 12,500/-ක අවම මූලික වැටුපට අමතරව

රු. 1,000/-ක් හා රු. 2,500/-ක් වන අයවැය සහන දීමනා දෙක එක්කළ විට රු. 16,000/-ක අවම මාසික වැටුපක් තම සේවකයන් වෙත ගෙවීමට සේවායෝජකයන් නීතිමය බැඳීමකට ලක් වේ.

**2. කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමේදී ගෙවිය යුතු වන උපරිම වන්දි මුදල රු. 1,250,000/- සිට රු. 2,500,000/- දක්වා ඉහළ නැංවීම**

සේවායෝජකයන් විසින් සාධාරණ හේතුවක් නොමැතිව සේවකයන් සේවයෙන් ඉවත් කිරීමේ දී ද ආයතන ප්‍රතිව්‍යුහගත කිරීමේදී සේවක සංඛ්‍යාව අඩුකිරීම සහ ආයතන වසා දැමීම වැනි අවස්ථාවලදී සේවකයන්ගේ සේවය අවසන් කරන අවස්ථාවලදී ද ගෙවිය යුතු වන්දි මුදලේ ප්‍රමාණය තීරණය කිරීමට පදනම් කර ගන්නා 1971 අංක 45 දරණ සේවකයින්ගේ සේවය අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) පනත යටතේ ගැසට් කර තිබූ වන්දි සූත්‍රයේ පැවති උපරිම වන්දි සීමාව රු. 1,250,000/-ක් විය. මෙම තත්වය තුළ ඉහළ වැටුපක් ලබා ගන්නා වැඩි සේවා කාලයක් සපුරන ලද සේවකයන්ට ලබාගත හැකිව තිබූ උපරිම වන්දිය වැටුපට සාපේක්ෂව සුළු අගයක් ගන්නා බැවින් අසාධාරණ බව පෙනී යන ලදී. එම සීමාව සංශෝධනය කරමින් 2021.02.25 දිනැතිව නිකුත් කරන ලද අංක 2216/17 දරණ ගැසට් පත්‍රය මඟින් රු. ලක්ෂ විසිපහ (2,500,000/-) දක්වා ඉහළ නංවන ලදී.

**3. සේවකයන් රැකියාවෙහි යොදවා ගැනීමට හැකිවන අවම වයස් සීමාව අවුරුදු 14 සිට 16 දක්වා ඉහළ නැංවීම**

දරුවන්ට හිමිවිය යුතු ආදරය හා රැකවරණය ලබා දෙමින් හා ගුණාත්මක අධ්‍යාපනයක් ලබා දීම තුළ අනාගත ලෝකයට වටිනා පුරවැසියන් බිහි කිරීමේ අරමුණ පෙරදැරිව 2015 දී අධ්‍යාපන ආඥා පනතට පනවන ලද රෙගුලාසි මඟින් ශ්‍රී ලංකාවේ දරුවන්ගේ අනිවාර්ය අධ්‍යාපන වයස අවුරුදු 16 ලෙස නියම කර ඇත. ශ්‍රී ලංකාව විසින් අපරානුමත කරන ලද ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ 1973 (අංක 138) සේවයෙහි යෙදවීමේ අවම වයස සම්මුතියෙහිද රැකියාවක යෙදිය හැකි අවම වයස අවුරුදු 15 හෝ අදාළ රටෙහි අනිවාර්ය පාසල් අධ්‍යාපන වයස විය යුතු බව දන්වා ඇත. එම ලාංකීය හා ජාත්‍යන්තර නෛතික තත්ත්වයන්ට අනුකූල වන පරිදි ශ්‍රී ලංකාවේ කම්කරු නීතීන්හි ළමා ශ්‍රමය යොදා ගැනීම පිළිබඳ නෛතික ප්‍රතිපාදන පහත සඳහන් පනත් හා රෙගුලාසි සංශෝධනය කරමින් සම්මත කර ගන්නා ලදී.

- 2021 අංක 01 දරණ සාප්පු හා කාර්යාලීය සේවකයින් පිළිබඳ (සංශෝධන) පනත
- 2021 අංක 02 දරණ ස්ත්‍රීන්, තරුණ අය සහ ළමයින් සේවයේ යෙදවීමේ (සංශෝධන) පනත
- 2021 අංක 03 දරණ ඉන්දියානු සංක්‍රමණික කම්කරු (සංශෝධන) පනත
- 2021 අංක 04 දරණ කර්මාන්තශාලා (සංශෝධන) පනත
- 2021.01.06 දිනැති 2209/41 අංක දරණ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1958 අංක 15 දරණ සේවක අර්ථසාධක අරමුදල් පනතට අදාළ රෙගුලාසි

**4. සේවකයකු සේවයට බඳවාගෙන දින 30ක් ඇතුළත කම්කරු දෙපාර්තමේන්තුවේ ලියාපදිංචිය අනිවාර්ය කිරීම සඳහා 1958 අංක 15 දරණ සේවක අර්ථසාධක අරමුදල් පනතේ රෙගුලාසි සංශෝධනය**

බොහෝ සේවායෝජකයන් තම සේවකයන්ගේ සේවක අර්ථසාධක අරමුදල් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ගෙවීම් කළද ඔවුන්ගේ ජීව දත්ත විස්තර ඇතුළත් ABH ආකෘතිපත්‍ර නිසි පරිදි කම්කරු දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කිරීම අතපසු කරනු ලබයි. මෙම විස්තර ලබා දීම නෛතික අවශ්‍යතාවක් ලෙස සඳහන් වුවද යම් නිශ්චිත කාල සීමාවක් තුළ ලියාපදිංචි වියයුතු බවට සඳහනක් නොතිබීම හේතුවෙන් සේවා යෝජකයන් විසින් මෙලෙස තම සේවකයන් සේවක අර්ථසාධක අරමුදලේ ලියාපදිංචි නොකිරීම හේතුවෙන් සිය අර්ථසාධක ප්‍රතිලාභ ආපසු ගැනීමට යන අවස්ථාවේ දී සේවකයන්ට විවිධ අපහසුතාවන්ට මුහුණ පෑමට සිදු වේ. මෙම තත්ත්වය වළක්වාලීමේ අරමුණින් යම් සේවකයෙකු සේවයට බැඳී දින 30ක් ඇතුළත සිය සේවා ස්ථානය පිහිටි ප්‍රදේශයට අදාළ කම්කරු කාර්යාලයේ ලියාපදිංචියට සේවායෝජකයා විසින් විස්තර යැවීම අනිවාර්ය කරමින් සේවක අර්ථසාධක අරමුදල් පනතේ රෙගුලාසි සංශෝධනය කරන ලද අංක 2249/13 හා 2021.10.12 දිනැති ගැසට් පත්‍රය පාර්ලිමේන්තු අනුමැතිය මත නිකුත් කරන ලදී.



**5. සේවක අර්ථසාධක අරමුදලේ සාමාජිකයන්ට තම මාසික දායක මුදල් ගිණුම්ගත වීම පිළිබඳව ක්ෂණිකව දැනුම් දීම සඳහා ජංගම දුරකථන කෙටි පණිවිඩ සේවාවක් ක්‍රියාත්මක කිරීමට අදාළව සේවක අර්ථසාධක අරමුදල් පනතේ රෙගුලාසි සංශෝධනය**

සේවක අර්ථසාධක අරමුදලේ සාමාජිකයන්ගේ මාසික දායක මුදල් සේවායෝජකයා විසින් නිසි පරිදි ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ගෙවා ඇත්ද යන්න හෝ තම ගිණුමට මුදල් නිසි පරිදි ප්‍රේෂණය වී ඇත්ද යන්න සාමාජිකයාට කඩිනමින් දැනගැනීමට හැකියාවක් මෙතෙක් නොපැවති අතර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ලබාදෙනු ලබන අර්ධ වාර්ෂික ගිණුම් ප්‍රකාශය මඟින් වසර මැද සහ වසර අවසාන ශේෂය පිළිබඳ තොරතුරු පමණක් ලබා දෙයි. අරමුදල් ගිණුම්ගත වීමේ තොරතුරු සාමාජිකයාට කඩිනමින් දැන ගැනීමට හැකියාව පවතින්නේ නම් සේවායෝජක විසින් ගෙවීම් පැහැර හැරීමක් සිදුකර ඇත්නම් ඒ පිළිබඳව කම්කරු දෙපාර්තමේන්තුව වෙත දැනුම් දීමෙන් අවශ්‍ය ඉදිරි පියවර සඳහා යොමු වීමට සේවකයාට හැකියාව ලැබේ. මාසිකව තම ගිණුමට මුදල් බැරවීම පිළිබඳ ජංගම දුරකථන කෙටි පණිවිඩයක් මඟින් සාමාජිකයාට දැනුම් දීමට හැකිවන පරිදි 2021.10.12 දිනැති අංක 2245/13 දරණ ගැසට් පත්‍රයේ පළ කරමින් 1958 අංක 15 දරණ සේවක අර්ථසාධක අරමුදල් පනත් රෙගුලාසි සංශෝධනය කරන ලදී.

**6. විදේශයන් සමඟ සමාජ ආරක්ෂණ ගිවිසුම්වලට එළඹීම පහසු කරවන පරිදි 1958 අංක 15 දරණ සේවක අර්ථසාධක අරමුදල් පනත සංශෝධනය**

ශ්‍රී ලාංකික සමාගමක විදේශ ශාඛාවල සේවය කරන සේවකයන් වෙනුවෙන් එරට සමාජ ආරක්ෂණ අරමුදල් සඳහා ගෙවිය යුතු දායක මුදල් වෙනුවට ශ්‍රී ලංකාවේ සේවක අර්ථසාධක අරමුදලට අඛණ්ඩව දායකත්වය දැක්විය හැකි වන පරිදි හා විදෙස් සමාගමක ශ්‍රී ලංකා ශාඛාවල සේවා නියුක්තිකයන් උදෙසා මෙරට සේවක අර්ථසාධක අරමුදලට දායකත්වය දැක්වීමට හැකිවන පරිදි දෙරට අතර සමාජ ආරක්ෂණ ගිවිසුම්වලට එළඹීමට පහසුවන පරිදි 1958 අංක 15 දරණ සේවක අර්ථසාධක අරමුදල් පනතේ සේවා නියුක්තිකයා යන අර්ථ නිරූපණය හා ආවරණ සේවා නියුක්තිය යන අර්ථ නිරූපණය 2021 අංක 23 දරණ සේවක අර්ථසාධක අරමුදල් (සංශෝධන) පනත මඟින් සංශෝධනය කරන ලදී.

ඒ අනුව, මෙහි ප්‍රථම සමාජ ආරක්ෂණ ගිවිසුම ඉන්දියානු රජය සමඟ අත්සන් කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් කරමින් පවතී. ඒ සමඟ ඉන්දියාවේ සේවය කරන ශ්‍රී ලාංකික ශ්‍රමිකයන්ට සිය සමාජ ආරක්ෂණ අරමුදලේ දායක මුදල් ලබා ගැනීමට ඉන්දියානු නීතිය අනුව වයස අවුරුදු 58 සම්පූර්ණ වන තුරු බලා සිටීමට සිදු නොවනු ඇත.

**7. වයස අවුරුදු 18ට අඩු ළමයින් සේවයේ යෙදවීම තහනම් කෙරෙන අන්තරායකාරී රැකියා නියෝග ලැයිස්තුව සංශෝධනය කිරීම**

1956 අංක 47 දරණ ස්ත්‍රීන්, තරුණ අය සහ ළමයින් සේවයේ යෙදවීමේ පනත යටතේ සම්මත කරන ලද 2021 අංක 01 දරණ අන්තරායකාරී රැකියා නියෝග මඟින් ඒ වනතෙක් පැවති අන්තරායකාරී රැකියා 51ක ලැයිස්තුව රැකියා 71ක් දක්වා පුළුල් කරන ලදී. මෙම නව රෙගුලාසි මඟින් වයස 18ට අඩු තැනැත්තන් ගෘහස්ථ සේවකයෙකු ලෙස සේවයේ යෙදවීම, සත්ව ඝාතකාගාරවල, පළිබෝධනාශක වැනි කෘෂිරසායන ද්‍රව්‍ය නිෂ්පාදනය කරන, ගබඩා කරන, විකුණන ස්ථානවල, රතිඤ්ඤා වැනි පුපුරන ද්‍රව්‍ය නිපදවන හෝ විකුණන ස්ථානවල, මෘත ශරීරාගාරවල, අවමංගලශාලාවල හෝ යම් තරුණ අයෙකුගේ සෞඛ්‍යයට හෝ ආරක්ෂාවට හානිකර විය හැකි ස්ථානවල ඇතුළු රැකියා 71ක යෙදවීම නීතියෙන් තහනම් කරයි. මෙමඟින් දරුවෙකුට / තරුණ අයෙකුට අනතුරුදායක විය හැකි සහ දරුවෙකුගේ හෝ තරුණ අයෙකුගේ කායික, මානසික හා සදාචාරාත්මක වර්ධනයට බාධා විය හැකි රැකියාවන්හි නියැලීම වළක්වා ඇත. මෙම සංශෝධිත අන්තරායකාරී රැකියා නියෝග 2021.11.18 දිනැති අංක 2251/35 දරණ ගැසට් පත්‍රයේ පළකර පාර්ලිමේන්තු අනුමැතිය ලබා ඇත.

**8. පෞද්ගලික අංශයේ සේවකයන් සඳහා අවම විශ්‍රාම වයසක් තිරණය කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වා දෙමින් 2021 අංක 28 දරණ සේවකයන් විශ්‍රාම යාමේ අවම වයස පනත හඳුන්වා දීම**

ශ්‍රී ලංකාවේ පෞද්ගලික අංශය සඳහා කම්කරු නීති මඟින් නියම කරන ලද නිශ්චිත විශ්‍රාම වයසක් නොපැවති අතර සේවක අර්ථසාධක අරමුදලේ ප්‍රතිලාභ ලැබිය හැකි අවම වයස වන කාන්තාවන් සඳහා වයස අවු. 50 සහ පිරිමි සේවකයන් සඳහා වයස අවු. 55 සම්පූර්ණ වීමේ දී විශ්‍රාම ගන්වන ක්‍රමවේදයක් අනුගමනය කිරීම ඇතැම් සේවායෝජකයන් විසින් සිදු කරන ලදී. දකුණු ආසියානු කලාපීය රටවල විශ්‍රාම වයස අවු. 58, 59, 60 ලෙස පැවතීම හා ශ්‍රී ලාංකිකයින්ගේ උපතේ දී ආයු අපේක්ෂාව යන කරුණු සලකා බලා පෞද්ගලික අංශයේ අවම විශ්‍රාම වයස අවු. 60 ලෙස තීරණය කිරීම සඳහා 2021 අංක 28 දරණ සේවකයන්ගේ විශ්‍රාම යාමේ වයස පනත 2021 අගෝස්තු මස දී සම්මත කරගන්නා ලදී. මීට ආනුශාංගිකව 2021 අංක 29 දරණ කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) පනත ද පනවන ලදී. මෙම නව පනත් තුළින් පෞද්ගලික අංශයේ පළපුරුදු පරිණත සේවකයන්ගේ දැනුම එම ආයතනයන්හි මෙන්ම රටේ සංවර්ධනයට ද වඩා ඵලදායී ලෙස දායක කර ගැනීමට අවස්ථාව උදා වන අතර ශ්‍රම බලකායේ ඉහළ ඵලදායිතාවක් ආරක්ෂා කර ගැනීමට මහත් රුකුලක් ලබා දෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**9. සේවයේ යෙදී සිටියදී සිදුවන අනතුරකදී කම්කරු වන්දි ආඥා පනත යටතේ ලබාදෙන උපරිම වන්දි මුදල රු. 550,000/- සිට රු. 2,000,000/- දක්වා ඉහළ නැංවීම**

1934 අංක 19 දරණ කම්කරු වන්දි ආඥා පනතට අවසන් වරට 2005 වසරේදී ගෙන එන ලද සංශෝධනය අනුව සේවයේ යෙදී සිටිය දී සිදුවන හදිසි අනතුරක දී, වෘත්තීය රෝගයක දී සේවකයෙකු වෙත අයකර දිය හැකි උපරිම වන්දි සීමාව රු. 550,000/- ලෙස පැවතිනි. මෙම උපරිම වන්දි සීමාව රු. මිලියන දෙක (රු. 2,000,000/-) දක්වා වැඩිකිරීමට සහ ඊට සමානුපාතික ලෙස අනෙක් වන්දි සීමාවන්ද වැඩි කිරීමට 2022 අංක 10 දරණ පනත මඟින් පාර්ලිමේන්තු අනුමැතිය හිමි විය. මෙම සංශෝධන මඟින් මෙතෙක් රාජ්‍ය සේවකයන්ට පමණක් හිමිව තිබූ අයිතිවාසිකමක් වන සේවා ස්ථානයට යන අතර සහ සේවය නිම කොට ආපසු එන අතර සිදුවන අනතුරුවලටද සේවායෝජකයා විසින් වන්දි ගෙවීමට හැකි වන පරිදි ප්‍රතිපාදන එක් කොට ඇත.

**10. කම්කරු නඩු විමසීම කඩිනම් කිරීම සඳහා මහේස්ත්‍රාත් අධිකරණ හා කම්කරු විනිශ්චය සභා වෙත සමගාමී අධිකරණ බලයක් ලබා දීම**

වර්තමානයේ දී සියලුම කම්කරු නීති හා සේවක අර්ථසාධක ප්‍රතිපාදන උල්ලංඝනය වූ විට සහන ලබා ගැනීමට මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පැවරිය යුතු වේ. මෙහිදී ඇතිවන ප්‍රමාදයන් නිසා සේවකයන්ට හිමි පාරිතෝෂික, සේවක අර්ථසාධක හා හිඟ වැටුප් වැනි ව්‍යවස්ථාපිත හිමිකම් අයකර දීම සඳහා වසර 5 - 6ක දීර්ඝ කාලයක් බලා සිටීමට සිදුවේ. මෙයට විසඳුමක් ලෙස කාර්මික ආරවුල් විසඳීම සඳහා පමණක් බලාත්මක වන පරිදි අතිරේක මහේස්ත්‍රාත් බලතල කම්කරු විනිශ්චය සභා සභාපතිවරුන් වෙත පැවරීමට විශේෂ විධිවිධාන පනතක් කෙටුම්පත් කර ඇත. පනත සංශෝධනය සඳහා වන අවසන් කෙටුම්පත නීතිපති දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇති අතර එම දෙපාර්තමේන්තුවෙන් නීතිපති සහතිකය සහ නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවෙන් ත්‍රෛභාෂික අවසන් කෙටුම්පත ලැබීමෙන් අනතුරුව පනත් කෙටුම්පත ගැසට් පත්‍රයේ පළ කිරීමටත් පාර්ලිමේන්තුවේ අනුමැතියට ඉදිරිපත් කිරීමටත් අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබේ.

**11. කම්කරු විනිශ්චය සභා ඉදිරියේ නීතිඥයන් නොවන සේවක නියෝජිතයන්ට පෙනී සිටීමට සහ කම්කරු විනිශ්චය සභා නියෝග බලාත්මක කිරීමේ බලය කම්කරු විනිශ්චය සභා සභාපතිවරුන් වෙත ලබා දීම**

හාම්පුතුන් විසින් අසාධාරණ ලෙස සේවයෙන් ඉවත් කිරීම් සම්බන්ධව සේවකයන් විසින් පවරා ඇති නඩුවලදී සේවකයින් වෙනුවෙන් වර්තමානයේ දී පෙනී සිටිනු ලබන්නේ නීතිඥයින් සහ වෘත්තීය සමිති නියෝජිතයින් පමණි. මේ සඳහා නීතිඥයින් නොවන නියෝජිතයින්ට සේවකයින් වෙනුවෙන් පෙනී සිටීමට බලය ලබා දීමට අවශ්‍ය කටයුතු අරඹා ඇත. එහිදී 1950 අංක 43 දරණ කාර්මික ආරවුල් පනතේ 46 වන වගන්තිය සංශෝධනය කිරීමෙන් ඕනෑම බලයලත් නිලධාරියෙකුට, බේරුම්කරුවෙකුට කම්කරු විනිශ්චය සභාවේ කාර්මික අධිකරණය හෝ කම්කරු කොමසාරිස් හරහා නීතිඥයෙකුට හෝ වෙනත් නියෝජිතයෙකුට පෙනී සිටීමට බලය ලබා දෙනු ලැබේ.

වර්තමානයේ දී කම්කරු විනිශ්චය සභාවේ නියෝගය ලබා දීමෙන් පසු එම නියෝගය පැහැර හරින සේවායෝජකයින්ට එරෙහිව නියෝගය බලාත්මක කිරීම සඳහා මහේස්ත්‍රාත් අධිකරණයේ පැමිණිලි ගොනු කළ යුතුව ඇත. මේ සම්බන්ධයෙන් වන ප්‍රමාදයන් අවම කිරීම සඳහා කම්කරු විනිශ්චය සභා සභාපතිවරුන්ට තම නියෝග බලාත්මක කිරීමේ බලය ලබා දිය යුතු වේ.

මෙම සංශෝධනයන් සිදු කිරීම සඳහා වන අවසන් කෙටුම්පත නීතිපති දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර එම දෙපාර්තමේන්තුවෙන් නීතිපති සහතිකය ලැබී ඇති අතර නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවෙන් ත්‍රෛභාෂික අවසන් කෙටුම්පත ලැබීමෙන් අනතුරුව පනත් කෙටුම්පත ගැසට් පත්‍රයේ පළ කිරීමටත් පාර්ලිමේන්තුවේ අනුමැතියට ඉදිරිපත් කිරීමටත් අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබේ.

**12. නියෝග ක්‍රියාත්මක කිරීමේදී සිදු වන අනවශ්‍ය අභියාචනයන් අවම කිරීම සඳහා රිට් අයදුම්පත්‍ර, ප්‍රතිශෝධන හා අභියාචන ගොනු කිරීමේ දී ඇප තැන්පත් කිරීමේ ප්‍රතිපාදන ගෙන ඒම**

කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ නියෝගයට එරෙහිව රිට් ආඥාවක් ඉල්ලුම් කිරීමේ දී හෝ මහේස්ත්‍රාත් අධිකරණ තීන්දුවකට එරෙහිව අභියාචනයක් සිදු කිරීමේ දී ඇප මුදලක් කම්කරු කොමසාරිස් ජනරාල්වරයා වෙත තැන්පත් කිරීමෙන් අනතුරුව පමණක් එම අධිකරණ ක්‍රියාවලිය ආරම්භ කිරීමට හැකි වන පරිදි, කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) පනත සංශෝධනය කරනු ලැබේ. තීරණ ක්‍රියාත්මක කිරීමේදී සිදු වන අනවශ්‍ය අභියාචනයන් අවම කිරීම සඳහා මෙම නීතිමය ප්‍රතිපාදන ඇති කරනු ලැබේ. මෙම සංශෝධනයන් සිදු කිරීම සඳහා වන අවසන් කෙටුම්පත නීතිපති දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර එම දෙපාර්තමේන්තුවෙන් නීතිපති සහතිකය ලැබී ඇති අතර නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවෙන් ත්‍රෛභාෂික අවසන් කෙටුම්පත ලැබීමෙන් අනතුරුව පනත් කෙටුම්පත ගැසට් පත්‍රයේ පළ කිරීමටත් පාර්ලිමේන්තුවේ අනුමැතියට ඉදිරිපත් කිරීමටත් අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබේ.

**13. තීරණ ක්‍රියාත්මක කිරීමේදී සිදු වන අනවශ්‍ය අභියාචනයන් අවම කිරීම සඳහා බේරුම්කරණ ප්‍රදාන, කාර්මික අධිකරණ නියෝගවලට රිට් අයදුම්පත්‍ර, ප්‍රතිශෝධන හා අභියාචන ගොනු කිරීමේ දී ඇප තැන්පත් කිරීමේ ප්‍රතිපාදන ගෙන ඒම**

මේ සඳහා 1950 අංක 43 දරණ කාර්මික ආරවුල් පනත සංශෝධනය කරනු ලැබේ. පනත සංශෝධනය සඳහා වන අවසන් කෙටුම්පත නීතිපති දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇති අතර එම දෙපාර්තමේන්තුවෙන් නීතිපති සහතිකය සහ නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවෙන් ත්‍රෛභාෂික අවසන් කෙටුම්පත ලැබීමෙන් අනතුරුව පනත් කෙටුම්පත ගැසට් පත්‍රයේ පළ කිරීමටත් පාර්ලිමේන්තුවේ අනුමැතියට ඉදිරිපත් කිරීමටත් අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබේ.

**14. විෂමාචාර ක්‍රියාවක් හේතුකොට ගෙන හාම්පුතුන් විසින් වැඩ තහනම් කිරීම් හෝ වෙනත් ආකාරයේ විනය ක්‍රියාමාර්ග ගෙන අවසාන විනය තීරණය ලබා දිය යුතු කාලසීමාවක් නියම කිරීම**

විනය පරීක්ෂණවලට ලක්ව සිටින පෞද්ගලික අංශයේ සේවකයන් සම්බන්ධයෙන් ගනු ලබන විනය ක්‍රියාමාර්ග කඩිනම් කිරීමට අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන ගෙන ඒම සඳහා 1950 අංක 43 දරණ  කාර්මික ආරවුල් පනත සංශෝධනය කෙරේ.

අවසාන විනය තීරණ ලබා දීමට දීර්ඝ කාලයක් ගත වීම මඟින් සේවකයින්ට හා සේවකයින්ගේ යැපෙන්නන්ට විශාල අගතියක් සිදු වේ. විනය ක්‍රියාමාර්ග ගෙන අවසාන විනය තීරණය ලබා දීම සඳහා කාල රාමුවක් නිර්ණය කළ යුතු වේ. එබැවින්, සේවකයෙකුගේ වැඩ තහනම් කරනු ලැබූ අවස්ථාවක දී, එදින සිට මාස 06ක් ඇතුළත විනය පරීක්ෂණයක් පවත්වා අවසන් විනය නියෝගයක් ලබා දීමට හා අදාළ චෝදනාව මූල්‍ය වංචාවක් නොවන්නේ නම් වැඩ තහනමට ලක් වූ කාලය තුළ සේවකයාට අඩ වැටුප් ලබා ගැනීමට හැකි වන පරිදි

විධිවිධාන ඇතුළත් කරමින් කාර්මික ආරවුල් පනත සංශෝධනය කිරීමට අපේක්ෂිතය. මූලික කෙටුම්පත නීති කෙටුම්පත් සම්පාදක විසින් සකස් කර ඇති අතර ඒ සම්බන්ධයෙන් අමාත්‍යාංශ නිරීක්ෂණ ලබා දී ඇත. අවසන් කෙටුම්පත හා නීතිපති සහතිකය ලැබීමෙන් අනතුරුව පනත් කෙටුම්පත ගැසට් පත්‍රයේ පළ කිරීමටත් පාර්ලිමේන්තුවේ අනුමැතියට ඉදිරිපත් කිරීමටත් අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය නැවත ලබා ගත යුතු වේ.

**15. වෘත්තීය ආරක්ෂාව, සෞඛ්‍ය හා සුබසාධනය සම්බන්ධ නව පනතක් හඳුන්වා දීම**

කර්මාන්තශාලා ආඥා පනතේ දැනට පවතින නෛතික ප්‍රතිපාදන සේවක සෞඛ්‍ය හා සුභසාධනය ආරක්ෂා කිරීම සඳහා ප්‍රමාණවත් නොවේ. ජාත්‍යන්තරව පිළිගත් ප්‍රමිතීන් කෙරෙහි අවධානය යොමු කරමින් සේවා ස්ථානයන්හි සේවක සෞඛ්‍ය, සුරක්ෂිතතාව හා සුභසාධනය සුරැකෙන වාතාවරණයක් ඇති කිරීම සඳහා නව නීති හඳුන්වා දීම කාලීන අවශ්‍යතාවකි. සකස් කර ඇති කෙටුම්පතට සිදු කළ හැකි සංශෝධන හඳුනා ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් ගරු නීතිපතිතුමාගේ සහ නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ නියෝජිතයින් ද ඇතුළත් වන පරිදි කමිටුවක් පත් කරන ලදී. කමිටුවේ නිරීක්ෂණ ලැබීමෙන් පසු ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට නියමිතය.

**16. සේවක සුබසාධනයට හා වර්තමානයට ගැලපෙන පරිදි 1954 අංක 19 දරණ සාප්පු හා කාර්යාල සේවක පනත සංශෝධනය කිරීම**

විශේෂ නියෝග මත සීමා ලිහිල් කර ඇති සාප්පු හා කාර්යාල සේවක පනත යටතට ගැනෙන ගුවන්තොටුපළ, නේවාසික හෝටල් සහ අවන්හල් (රාත්‍රී 10) යන ව්‍යාපාර ආයතන හැර සෙසු ආයතනවලට රාත්‍රී 8න් පසු කාන්තාවන් සේවයේ යෙදවීමට සේවායෝජකයින්ට අයිතියක් නැත. ඒ සම්බන්ධයෙන්, තොරතුරු තාක්ෂණය සම්බන්ධ දැනුම පාදක කරගත් ව්‍යාපාර ක්‍රියාවලි කළමනාකරණ (Business Process Outsourcing (BPO) ව්‍යාපාර අන්තර්ජාතික කාල සීමා අනුව ක්‍රියාත්මක වීම නිසා එම කාල සීමා නීති අනුව ව්‍යාපාර පවත්වා ගැනීම අසීරු හෙයින් එම ක්ෂේත්‍රවල නියැලී සිටින සේවකයන්ගේ අයිතීන් සුරක්ෂිත වන පරිදි (විශේෂයෙන් කාන්තා සේවිකාවන්ගේ ආරක්ෂාව තහවුරුවන පරිදි) සාප්පු හා කාර්යාල සේවක පනත සංශෝධනය කිරීම තුළින් අදාළ සේවා කොන්දේසි පිළිබඳ සීමා ලිහිල් කිරීම සිදු කළ යුතු වේ. එසේම, ශ්‍රම බලකාය තුළ කාන්තා සේවා නියුක්තිය ඉහළ නැංවීම සඳහා නම්‍යශීලී සේවා මුර ක්‍රමයක් හඳුන්වා දීම වැනි ක්‍රියාමාර්ග ද ඇතුලත් කළ යුතු වේ. අදාළ ක්ෂේත්‍රවල ව්‍යවසායකයින්, සේවායෝජකයින්ගේ සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයෙහි (ICTA) නිර්දේශ සලකා බලා සකස් කරන ලද කෙටුම්පත, ජාතික කම්කරු උපදේශක සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට නියමිතය

**17. 1958 අංක 15 දරණ සේවක අර්ථසාධක අරමුදල් පනත සංශෝධනය කිරීම**

සේවක සුභසාධනයට සහ වර්තමාන සමාජ ආර්ථික තත්ත්වයට ගැළපෙන පරිදි සේවක අර්ථසාධක අරමුදල් පනත සංශෝධනය කළ යුතුය. සේවකයෙකු ස්වේච්ඡා විශ්‍රාම යෝජනා ක්‍රමයක් යටතේ හෝ වර්තමාන වැඩ ලොව අවශ්‍යතා මත වයස අවුරුදු 55 සම්පූර්ණ වීමට පෙර විශ්‍රාම ගැනීමේදී සේවක අර්ථසාධක අරමුදලේ ප්‍රතිලාභ ලබා ගැනීමට ප්‍රතිපාදන සැලසීමට කටයුතු කරනු ලැබේ. ශ්‍රී ලංකා මහ බැංකුවේ නිරීක්ෂණ සැලකිල්ලට ගෙන කම්කරු දෙපාර්තමේන්තුව විසින් සකස් කරන ලද කෙටුම්පත ජාතික කම්කරු උපදේශක සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට නියමිතය

**18. 1983 අංක 12 දරණ පාරිතෝෂික පනත සංශෝධනය කිරීම**

සේවක සුභසාධනයට සහ වර්තමාන සමාජ ආර්ථික තත්ත්වයට ගැළපෙන පරිදි පාරිතෝෂික පනත සංශෝධනය කළ යුතුය. කම්කරු දෙපාර්තමේන්තුව විසින් සකස් කරන ලද දළ කෙටුම්පත ජාතික කම්කරු උපදේශක සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට නියමිතය

**19. කම්කරු වන්දි ලබා දීම සම්බන්ධ කාර්යය කඩිනම් කිරීම සඳහා කම්කරු වන්දි කොමසාරිස් සහ කම්කරු විනිශ්චය සභා වෙත සමගාමී අධිකරණ බලයක් ලබාදීම**

සේවා ස්ථානයේ දී සිදු වූ අනතුරු සඳහා වන්දි ගෙවීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීම උදෙසා වන්දි ගෙවීමට අදාළ නඩු විභාග කිරීමට කම්කරු වන්දි කොමසාරිස් සහ කම්කරු විනිශ්චය සභා වෙත සමගාමී අධිකරණ බලතල ලබා දීමට අපේක්ෂා කෙරේ. අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව සමඟ සංශෝධිත පනත් කෙටුම්පත් සකස් කර ඇත. අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබුණු පසු ඉදිරි කටයුතු සිදුකිරීමට නියමිතය

**20. ගෘහස්ත සේවකයින් සඳහා සමාජ ආරක්ෂණය ව්‍යාප්ත කිරීමට ගෘහස්ථ සේවකයින් කම්කරු නීති මඟින් ආවරණය කිරීම**

පඩිපාලක සභා ආඥා පනත, සේවක අර්ථසාධක අරමුදල් පනත, සේවක භාරකාර අරමුදල් පනත, මාතෘ ප්‍රතිලාභ පනත, පාරිතෝෂික පනත ආදී පනත් කිහිපයක් තුළට ගෘහස්ථ සේවකයින් ඇතුලත් කිරීම සිදු කළ යුතු වේ. සංකල්ප පත්‍රිකාව ජාතික කම්කරු උපදේශක සභාව වෙත ඉදිරිපත් කර අනුමැතිය ලද පසු ඒ අනුව අදාළ පනත් සංශෝධනය කිරීමට අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබාගත යුතුය

**21. රක්ෂණ අලවිකරුවන් සඳහා සේවක අර්ථසාධක අරමුදල් පනතේ ආවරණය ලබා දීම**

රක්ෂණ අලවිකරුවන් සඳහා සේවක අර්ථසාධක අරමුදල් පනතේ ආවරණය ලබා දීමට අදාළ පාර්ශවයන් සමඟ මූලික සාකච්ඡා පවත්වනු ලබන අතර අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබුණු පසු ඉදිරි කටයුතු සිදුකිරීමට නියමිතය

**22. ශ්‍රී ලාංකික විගමණික ශ්‍රමිකයින් සඳහා රක්ෂණ හිමිකම් ප්‍රදානය කිරීම**

ශ්‍රී ලාංකික විගමණික ශ්‍රමිකයින්ට ප්‍රතිලාභ සහතික කිරීම සඳහා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය මඟින් විගමණික ශ්‍රමික රක්ෂණ ආවරණයක් පවත්වාගෙන යනු ලබයි. වර්තමානයේදී විගමණික ශ්‍රමිකයෙකුගේ මරණයකදී ලබා දෙන උපරිම වන්දි මුදල රු. 600,000/-ක් වැනි අවම මට්ටමක පවතී. විගමණික ශ්‍රමික මරණයකදී යැපෙන්නන් සඳහා ඇමෙරිකානු ඩොලර් 15,000ක අවම වන්දියක් ඇතුළුව නව රක්ෂණ ක්‍රමයක් හඳුන්වාදීමටත්, ස්ථිරව හෝ අර්ධ වශයෙන් ආබාධිත තත්ත්වයට පත් වුවහොත් වෛද්‍ය ප්‍රතිකාර ආවරණය කිරීම සඳහා ඇමෙරිකානු ඩොලර් 3,000 - 15,000 අතර වන්දි මුදලක් ප්‍රදානය කිරීමටත් මූලික ක්‍රියාමාර්ග ගෙන ඇත. දැඩි හිරිහැරයට ලක්වීම, බරපතල රෝගාබාධවලට ගොදුරු වීම, බරපතල අනතුරකට මුහුණ පෑම මෙන්ම කොවිඩ් - 19 වැනි වසංගත තත්ත්වයන් ආවරණය කිරීම සඳහා ප්‍රතිපාදන ඇතුළත් කිරීමට අපේක්ෂිතය. ඊට අමතරව, එම රක්ෂණ ආවරණය අනිවාර්යයෙන් ලබා දී ඇති බවට සනාථ කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතු බවට පිටත්වීමට පෙර ඉදිරිපත් කළ යුතු කොන්දේසියක් වශයෙන් නිෂ්කාශන වාර්තාවට ඇතුළත් කිරීමට යෝජනා කෙරේ. මේ සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන ඇති අතර විදේශ රැකියා ප්‍රවර්ධන සහ වෙළෙඳපොළ විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශය මඟින් අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගනිමින් සිටී.

### 2.1.2 කොවිඩ් - 19 වසංගතය හමුවේ සේවකයින් සහ සේවායෝජකයින් ආරක්ෂා කිරීම

2020 වර්ෂයේ දී කොවිඩ් - 19 වසංගතය ආරම්භවීමත් සමඟින් ප්‍රධානතම සමාජ කතිකාවත යාන්ත්‍රණය වන ජාතික කම්කරු උපදේශක සභාවේ අනුකමිටුවක් ලෙස ගරු අමාත්‍යතුමා මුලසුන දරණ ත්‍රෛපාර්ශවීය කාර්යසාධන බලකායක් ස්ථාපනය කරන ලදී. කාර්යසාධන බලකායේ කාර්යය වූයේ කොවිඩ් - 19 මඟින් සේවකයන් සහ ආයතන වෙත ඇති වන බලපෑම අවම කිරීම පිණිස පූර්ව ක්‍රියාකාරී ක්‍රියාමාර්ග ගැනීමය.

2021 වර්ෂය තුළ කමිටුව රැස්වීම් වාර තුනක් පවත්වා ඇත. විවිධ පාර්ශවකරුවන් අතර විශ්වාසය ගොඩ නැගීමට සහ යම් ගැටළුකාරී තත්ත්වයන් අර්බුද දක්වා උත්සන්න වීමට පෙර අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට මෙම කමිටුව බෙහෙවින් ඉවහල් විය. කාර්යසාධන රැස්වීම්වලදී සේවකයන් හට වැටුප් ගෙවීම සම්බන්ධයෙන් පහත දැක්වෙන එකඟතාවන්ට එළඹෙන ලදී

- 2021 ජනවාරි සිට ජූනි දක්වා කාල පරිච්ඡේදය සඳහා සංචාරක ක්ෂේත්‍රයේ යෙදෙන ව්‍යාපාර හා කොවිඩ් - 19 වසංගතයේ බලපෑම හමුවේ මේ වන විටත් සාමාන්‍ය පරිදි පවත්වා ගෙන

යාමට නොහැකි අනෙකුත් ක්ෂේත්‍රවල ව්‍යාපාර සඳහා කම්කරු කොමසාරිස් ජනරාල්ගේ පූර්ව අවසරයට යටත්ව සේවකයා විසින් අවසානයට ලබන ලද මාසයේ මූලික වැටුපෙන් 50%ක් හෝ රු. 14,500/-ක මුදල යන දෙකෙන් වඩා වැඩි මුදලක් සේවකයින්ට ගෙවීම

- ඉන් අනතුරුව, 2021 ජූලි සිට දෙසැම්බර් දක්වා සංචාරක ක්ෂේත්‍රයේ ව්‍යාපාරවලට පමණක් මෙම වැටුප් ගෙවීමේ ගිවිසුම ක්‍රියාත්මක කිරීමට ත්‍රෛපාර්ශවික කාර්යසාධක බලකාය විසින් තීරණය කරන ලදී

1971 අංක 45 දරණ කම්කරුවන්ගේ සේවා නියුක්තිය අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) පනත යටතේ සේවකයින්ගේ සේවය අවසන් කිරීම සඳහා අයදුම්පත් ඉදිරිපත් කිරීමට සේවායෝජකයින්ට හැකියාව පවතී. නියමිත වන්දි මුදල් ගෙවීමෙන් අනතුරුව සේවය අවසන් කිරීම සඳහා අනුමැතිය ලබා දීමට කම්කරු කොමසාරිස්වරයාට බලය පවතී. කොවිඩ් - 19 වසංගතය හමුවේ සේවකයින්ගේ රැකියාව ආරක්ෂා කර දීම සඳහා සේවකයින් සහ සේවායෝජකයින් එකඟතාවයක් ඇති කර ගැනීමට හැකි සැම පියවරක්ම ගැනීමට කම්කරු දෙපාර්තමේන්තුව ක්‍රියා කරන ලදී

### 2.1.3 ශ්‍රී ලාංකික විගමණික ශ්‍රමික සුබසාධනය සඳහා පහසුකම් සැලසීම

කොවිඩ් - 19 වසංගතය හේතුවෙන් අවදානමට ලක් වූ විගමණික ශ්‍රමිකයින් සඳහා වියළි සලාක, මූලික වෛද්‍ය පහසුකම්, මුහුණු ආවරණ, සනීපාරක්ෂක උපකරණ සහ තාවකාලික නවාතැන් පහසුකම් සැපයීමට ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් අදාළ රටවල ශ්‍රී ලංකා තානාපති කාර්යාලවල සහයෝගය ඇතිව කටයුතු කර ඇත.

ලියාපදිංචි කාලය තුළ කොවිඩ් - 19 ආසාදනය වී නැවත ශ්‍රී ලංකාවට පැමිණෙන ශ්‍රමිකයින්ට වන්දි ගෙවීම සහ කොවිඩ් - 19 හේතුවෙන් ශ්‍රමිකයෙකු මිය ගියහොත් යැපෙන්නන් සඳහා වන්දි ගෙවීමට ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සමඟ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ පහසුකම් සැපයීමේ කාර්යභාරය සම්බන්ධීකරණ කිරීම.

කොවිඩ් - 19 වසංගතයේ ප්‍රතිඵලයක් ලෙස රැකියා අහිමිවීම හෝ වීසා කාලය අවසන් වීම හේතුවෙන් නැවත පැමිණෙන ශ්‍රී ලාංකික විගමණික ශ්‍රමිකයින්ට නැවත පැමිණීම සඳහා විදේශ අමාත්‍යාංශය සහ කොවිඩ් - 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථානය සමඟ සම්බන්ධීකරණය කිරීමට කටයුතු කරන ලදී. මේ සම්බන්ධයෙන්, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් ආපසු පැමිණෙන පුද්ගලයින් නොමිලේ නිරෝධායනය කිරීම සඳහා හෝටල් දහයක් වෙන් කිරීමට කටයුතු යොදා ඇති අතර, ඒ යටතේ දළ වශයෙන් සතියකට රු.මි. 18ක වියදමකින් පුද්ගලයින් 571ක් සඳහා පහසුම් සපයනු ලැබේ

### 2.1.4 සමාජ ආරක්ෂණ ක්‍රමවේදයක් හඳුන්වා දීම

වර්තමානයේ රට තුළ සමාජ ආරක්ෂණ ක්‍රම රාශියක් පවතී. නමුත් කොවිඩ් - 19 වැනි අර්බුද, ස්වභාවික විපත් හෝ ආපදාවලදී සේවකයන්ගේ අවශ්‍යතා සපුරාලීමට ඒවාට නොහැකි වේ. මෙම සන්දර්භය තුළ, සමාජ ආරක්ෂාව සඳහා වෙනම අරමුදලක් පිහිටුවීම සඳහා විවිධ ක්‍රමවේද ගවේෂණය කිරීම සහ ඍණාත්මක බලපෑම් අවම කිරීම සඳහා විවිධ අවස්ථා මත පදනම්ව දායකත්වය ලබාදිය හැකි ආකාරය සලකා බැලීම කාලෝචිත අවශ්‍යතාවයකි. තවද, ශ්‍රමිකයින්ගෙන් 60%ක් අවිධිමත් අංශය තුළ සේවය කරන අතර ඔවුන් සමාජ ආරක්ෂණයට ආවරණය කිරීම වැඩි අවධානයක් යොමු කළ යුතු තවත් අභියෝගයකි. එබැවින්, අනපේක්ෂිත හේතූන් මත රැකියා අහිමි වූ සේවකයින්ට සහන සැලසීම සඳහා සමාජ ආරක්ෂණ අරමුදලක් පිහිටුවීම අත්‍යවශ්‍ය වේ.

මේ සම්බන්ධයෙන් අධ්‍යයනය කර යෝජනාවක් ඉදිරිපත් කිරීම සඳහා ජාතික කම්කරු උපදේශක සභාව මඟින් අනුකමිටුවක් පත් කර ඇත. අනුකමිටු නිර්දේශ මත මේ සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගනු ලැබේ.

### 2.1.5 කම්කරු නීතිවල පවතින සංකීර්ණතා ඉවත් කිරීම

සමස්ත ශ්‍රී ලාංකික ශ්‍රම බලකායම ආර්ථිකයේ කොටස්කරුවන් කිරීමේ අරමුණින් කම්කරු දෙපාර්තමේන්තුව මඟින් දැනට ක්‍රියාත්මක කරනු ලබන සියලුම නීතිරීති සමාලෝචනය කර ඒවා සරල කිරීමට අවශ්‍ය සංශෝධන සිදු කිරීමටත් නීතිරීතිවල විෂමතා සහ සංකීර්ණතා ඉවත් කර සරල කිරීමටත් කටයුතු ආරම්භ කර ඇත. 2022 වර්ෂයේදී නීති සංශෝධනවලට අදාළ කටයුතු සම්පූර්ණ කිරීමට අපේක්ෂා කෙරේ

### 2.1.6 කම්කරු දෙපාර්තමේන්තුවේ සේවා සැපයීම සඳහා ඩිජිටල් තාක්ෂණයන් ආරම්භ කිරීම

වර්තමානයේ සේවක අර්ථසාධක අරමුදලේ කටයුතු සඳහා ස්වයංක්‍රීය පද්ධතියක් භාවිතා වේ. ප්‍රතිලාභ අයදුම් කිරීමේ සිට ගෙවීම දක්වා සහ විභවතාවයක් සහිත අනෙකුත් සියලුම ක්‍රියාකාරකම් ඩිජිටල් තාක්ෂණය යොදා ගනිමින් සිදු කිරීමට අවශ්‍ය ව්‍යාපෘති දැනටමත් ආරම්භ කර ඇත. මීට අමතරව, එක් ස්ථානයකින්/කවුන්ටරයකින් සියලුම සේවා සැපයීම සඳහා පරිගණක ජාලයක් ස්ථාපිත කිරීමට අපේක්ෂිතය. එසේම, පැමිණිලි කළමනාකරණ පද්ධතියක් (Complaint Managememt System) හඳුන්වා දීමට අපේක්ෂිත අතර එහිදී සේවකයින්ට කම්කරු කාර්යාල වෙත පැමිණීමකින් තොරව ජංගම දුරකථනය මඟින් සිය පැමිණිලි කම්කරු දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමට හැකියාව ලැබේ.

### 2.1.7 කම්කරු ආරවුල් නිරාකරණය සඳහා සම්මත මෙහෙයුම් පටිපාටියක් හඳුන්වා දීමට අවශ්‍ය මූලික ක්‍රියාමාර්ග ඇරඹීම

සියලු කම්කරු කාර්යාලයන්හි කම්කරු ආරවුල් නිරාකරණය ඒකාබද්ධ කිරීම සහ නිරාකරණ ක්‍රියාදාමය කඩිනම් කිරීම සදහා සකස් කරන ලද කම්කරු ආරවුල් නිරාකරණය කිරීමේ සම්මත මෙහෙයුම් පරිපාටියක් සකස් කරන ලද අතර සියලු කම්කරු කාර්යාලයන් විසින් මෙම සම්මත මෙහෙයුම් පටිපාටිය භාවිතා කිරීම මඟින් කම්කරු ආරවුල් නිරාකරණය කිරීම කාර්යක්ෂමව සිදු කිරීමට අපේක්ෂිතය.

### 2.1.8 නව අභියෝගයන්

රටේ පැවැති කොවිඩ් වසංගත තත්ත්වය හා වර්තමාන ආර්ථික අර්බුදය හමුවේ මෙම අමාත්‍යාංශයේ කාර්යභාරයන්හි දිශානතිය නව මානයකට යොමු කිරීමට සිදුවේ. ආර්ථික අර්බුදය හේතුවෙන් කම්කරු ප්‍රජාවට සිදු වන ඍණාත්මක බලපෑම් අඩු කිරීමටත් රට තුළ කාර්මික සාමය ආරක්ෂා කිරීමටත් අමාත්‍යාංශය විසින් ත්‍රෛපාර්ශවීය සහභාගීත්වයෙන් අවශ්‍ය පියවර ගත යුතු වේ.

**එම් පී ඩී යූ කේ මාපා පතිරණ**
හිටපු ලේකම්
කම්කරු අමාත්‍යාංශය

## 2.2 අමාත්‍යාංශයේ ප්‍රගතිය

### 2.2.1 ශ්‍රම බලකාය ශක්තිමත් කිරීම සහ ජාත්‍යන්තර කම්කරු ප්‍රමිතීන් පවත්වාගෙන යාම

ජාත්‍යන්තර කම්කරු සංවිධානය සමඟ එම සංවිධානයේ සාමාජික රටක් ලෙස ශ්‍රී ලංකාව විසින් ඇති කරගත් බැඳීම, අන්තර්ජාතික වශයෙන් පිළිගත් සම්මුතීන් හා නිර්දේශයන් යටතේ මෙරට කම්කරු අයිතීන් සුරක්ෂිත කිරීම සහ කම්කරු ක්ෂේත්‍රයේ ගැටළු විසඳීම සඳහා උපයෝගී කර ගැනීමට අදාළ වගකීම මෙම අමාත්‍යාංශය විසින් ඉටු කරනු ලබයි.

කම්කරු ක්ෂේත්‍රය සම්බන්ධයෙන් වන ජාත්‍යන්තර කම්කරු සංවිධානය හා අනෙකුත් බහුපාර්ශවීය නියෝජිත ආයතන උදෙසා සාමාජික රටක් වශයෙන් ශ්‍රී ලංකාවේ බැඳීම හා වගකීම් සපුරා ඇති බව සහතික කිරීම හා කම්කරු ප්‍රතිපත්ති සම්පාදනය කිරීම, ජාතික මට්ටමේ සමාජ සංවාද ඇති කිරීම සහ මානව සම්පත් සංවර්ධනය සඳහා ජාත්‍යන්තර සහාය ලබා ගැනීමට ද කටයුතු කරනු ලැබේ. මෙම ඉලක්ක සපුරාලීමට 2021 වසර තුළ පහත පියවර ගෙන ඇත

### 1. ශ්‍රම බලකාය බලගැන්වීම සහ ආරක්ෂා කිරීම

I. ත්‍රෛපාර්ශවීය නියෝජනයෙන් යුක්ත ජාතික කම්කරු උපදේශක සභා (NLAC) රැස්වීමේ දී පහසුකම් සපයන්නා ලෙසට ක්‍රියා කිරීම. 2021 වර්ෂය තුළ රැස්වීම් හයක් පැවැත්වීම මඟින් පහත ක්‍රියාමාර්ග සිදු කර ඇත

- පෞද්ගලික අංශයේ සේවකයින් හට විශ්‍රාම යෑමේ අවම වයසක් හඳුන්වාදීමට එකඟ වීම හා ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීමට අනුකමිටුවක් ස්ථාපනය කිරීම
- පෞද්ගලික අංශයේ සේවකයින් සඳහා සමාජ ආරක්ෂණ වැඩපිළිවෙලක් හඳුන්වා දීම වෙනුවෙන් කටයුතු කිරීමට අනුකමිටුවක් පත් කිරීම
- වතු සේවක ප්‍රජාව මුහුණපාන ගැටළු විසඳීමට සේවක පාර්ශවය නියෝජනය කරන වෘත්තිය සමිති නියෝජිතයින් හා හාම්පුතුන් සමඟ ද්විපාර්ශවීය සාකච්ඡා පවත්වා අවශ්‍ය එකඟතාවයන් එළඹෙන ලෙසට උපදෙස් ලබා දීම
- බේරුම්කරණ ප්‍රදාන, කාර්මික අධිකරණ නියෝගවලට එරෙහිව රිට් අයදුම්පත්‍ර, ප්‍රතිශෝධන හා අභියාචනා ගොනු කිරීමේදී ඇප තැන්පත් කිරීමේ ප්‍රතිපාදන ගෙන ඒම
- කම්කරු නඩු විමසීම, නීතිඥ නොවන නියෝජිතයන්ට කම්කරු විනිශ්චය සභා ඉදිරියේ පෙනී සිටීමට බලය ලබා දීම සහ කම්කරු විනිශ්චය සභා සභාපතිවරුන්ට තම නියෝග / තීන්දු බලාත්මක කිරීමට බලය ලබාදීම, විනය පරීක්ෂණයක් පවත්වා තීරණයක් ලබා දිය යුතු කාල සීමාවක් නියම කිරීම
- වන්දි සූත්‍රයේ උපරිම සීමාව රු. ලක්ෂ 12.5 සිට රු. ලක්ෂ 25 දක්වා වැඩි කිරීම
- සේවකයන් මුහුණ දෙන හදිසි අනතුරුවලදී ගෙවන උපරිම වන්දි මුදල් සීමාව රු. 550,000/- සිට රු. 2,000,000/- දක්වා වැඩි කිරීම
- ශ්‍රී ලංකාව තුළ දැනට පවත්නා කම්කරු නීතීන් මඟින් සුදුසු පරිදි ගෘහස්ථ කම්කරුවන් වෙත ජාතික කම්කරු උපදේශක සභාවේ සාමාජිකත්වය ලබා දීමට ඇති හැකියාව පිළිබඳ සාකච්ඡා කිරීම
- ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ වැඩ ලොව තුළ ප්‍රචණ්ඩත්වය හා හිංසනය තුරන් කිරීම සම්බන්ධව සම්මුතිය පිළිබඳ සංෂිප්ත වාර්තාවක් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට පියවර ගැනීම



II. කම්කරු ක්ෂේත්‍රයට අදාළ අණපනත් ප්‍රතිපත්තීන් සංශෝධනය කිරීම සහ නව පනත් ආරම්භ කිරීම පිළිබඳ කරුණු ප්‍රවණතාවන් හා අවශ්‍යතාවන් පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා විශේෂිත කමිටුවක් වන කම්කරු නීති හා ප්‍රතිපත්තීන් සම්බන්ධයෙන් අමාත්‍යාංශ කමිටු රැස්වීම් පැවැත්විම

- කාර්මික ආරවුල් පනත
- සේවක අර්ථසාධක අරමුදල් පනත
- පාරිතෝෂික ගෙවීම් පනත
- කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමේ පනත

### 2. ජාත්‍යන්තර කම්කරු ප්‍රමිතීන් පවත්වාගෙන යාම

I. ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ ව්‍යවස්ථා අංක 22 යටතේ 2021 වර්ෂය සඳහා සම්මුතීන් හතරක් සඳහා වාර්තා සම්පාදනය කිරීම

II. EU GSP+ සහනය ලබා ගැනීම සම්බන්ධව ඇති ගැටළු නිරාකරණය කිරීමේ වාර්තාව සම්පාදනය කිරීම සහ GSP+ බදු සහනය අධීක්ෂණය කිරීම සඳහා පත් කරනු ලැබූ ත්‍රෛපාර්ශවීය කමිටුවේ රැස්වීම් පැවැත්වීම හා ඊට අදළ සියලු කටයුතු සංවිධානය කිරීම හා සහභාගි වීම

III. එක්සත් ජාතීන්ගේ විශේෂ නියෝජිතයෙක් වූ ටොමෝයා ඔබොකටා සමඟ (United Nations Special Rapporteur on Contemporary Forms of Slavery, Including its Causes and Consequences) ශ්‍රී ලංකාවේ කම්කරු ක්ෂේත්‍රයට අදාළ කරුණු පිළිබඳව සාකච්ඡා කිරීම

IV. ශ්‍රී ලංකාව හා විදේශ රටවල් අතර කම්කරු ක්ෂේත්‍රයට අදාළ සමාජ ආරක්ෂණ අධ්‍යාපනය සම්බන්ධයෙන් ඉදිරියේදී ඇති කර ගැනීමට නියමිත අවබෝධතා ගිවිසුම් හා ඒ සම්බන්ධ සියලු වැඩසටහන්වලට අදාළව කටයුතු කිරීම

V. වාර්ෂිකව ජිනීවාහි පැවැත්වෙන ජාත්‍යන්තර කම්කරු සමුළුව සඳහා මෙවර මාර්ගගත ක්‍රමය ඔස්සේ ත්‍රෛපාර්ශවීය නියෝජිතයන් සහභාගි කරවීමට අදාළ සියලුම කටයුතු සම්බන්ධීකරණය කිරීම සහ පසුවිපරම් කිරීම. ඒ සඳහා රාජ්‍ය නියෝජිතයින් හත් දෙනෙක්, හාම්පුතුන්ගේ නියෝජිතයින් එක් අයෙක් ද, වෘත්තීය සමිති නියෝජිතයින් සය දෙනෙක් ද සහභාගි විය

VI. ජාත්‍යන්තර කම්කරු සම්මේලනයේ සම්මත කර ගන්නා ලද සම්මුතීන් හා නිර්දේශ පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම

VII. ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ සහයෝගයෙන් 'සුනිසි මෙහෙවර වැඩසටහන' (DWCP) නව මුහුණුවරකින් ඉදිරියට පවත්වාගෙන යාම සඳහා රැස්වීම් පැවැත්වීම හා ඊට අදාළ කටයුතු සම්පාදනය කිරීම

VIII. ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ තාක්ෂණික සහයෝගීතාවයෙන් ක්‍රියාත්මක කරන ව්‍යාපෘති හා වැඩමුළුවලට අදාළ සියලුම සම්බන්ධීකරණ කටයුතු කිරීම. එහිදී ධීවර සම්මුතිය (C188) අපරානුමත කිරීමට ඇති හැකියාව පිළිබඳ ධීවර අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කිරීම

IX. ශ්‍රී ලංකාව තුළ ළමා ශ්‍රමය යෙදවීම පිළිබඳ සොයා බැලීම වෙනුවෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම. එහිදී අදාළ ප්‍රධාන පාර්ශවකරුවන් සමඟ රැස්වීම් වාර 03ක් පවත්වා ඇති අතර ළමා ශ්‍රමය පිළිබඳ යාවත්කාලීන දත්ත ලබා ගැනීමේ අවශ්‍යතාව හඳුනාගන්නා ලදී

X. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රකාශයට පත් කරන කාලීන ආර්ථික සංවර්ධනයේ වැදගත් අංශ සහ ආර්ථික සංවර්ධනයේ ඉදිරි දැක්ම සම්බන්ධයෙන් වන වාර්තාවට අදාළ තොරතුරු සම්පාදනය කිරීම

XI. විදේශ අමාත්‍යාංශය හා අනෙකුත් රජයේ අමාත්‍යාංශ වෙත කම්කරු ක්ෂේත්‍රයට අදාළ වන නව ප්‍රවණතා පිළිබඳ වාර්තා සම්පාදනය කිරීම

XII. රජයට පවරාගත් වතු සමාගම්වල සේවකයන්ට අය විය යුතු හිඟ සේවක අර්ථසාධක අරමුදල්, සේවක භාරකාර අරමුදල් හා පාරිතෝෂික මුදල් ගෙවීම පිළිබඳ කම්කරු දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව හා වතු කම්කරුවන් නියෝජනය කරන වෘත්තීය සංගම් සාමාජිකයන් සමඟ කාර්තුමය සමාලෝචන රැස්වීම් සංවිධානය කරන ලදී. එහිදී හිඟ මුදල් ගෙවීම සඳහා අවශ්‍ය මුදල් එම ආයතන මඟින් කඩිනමින් සොයාගෙන එම කටයුතු අවසන් කරන ලෙස උපදෙස් ලබාදෙන ලදී

XIII. වාර්ෂිකව යැවිය යුතු ශ්‍රම සංඛ්‍යාලේඛන පිළිබඳ ප්‍රශ්නාවලියට පිළිතුරු ජාත්‍යන්තර කම්කරු සංවිධානය වෙත සැපයීම

XIV. ගෘහස්ත සේවකයින්, ජීවිත රක්ෂණ නියෝජිතයින් හා රක්ෂණ සමාගම්වල හිමිකරුවන් සමඟ කම්කරු අයිතීන් පිළිබඳ ගැටළු සොයා බැලීම වෙනුවෙන් සාකච්ඡා පැවැත්වීම

### 2.2.2 විදේශ රැකියා ප්‍රවර්ධනය සඳහා ප්‍රතිපත්තිමය මාර්ගෝපදේශය

සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුව විදේශ රැකියා වෙළඳපොළ උදෙසා නිපුණ ශ්‍රම බලකායක් ඇති කිරීමට අදාළ රාජ්‍ය අමාත්‍යාංශයට ප්‍රතිපත්තිමය මාර්ගෝපදේශ සැපයීම 2020.10.06 දිනැති අංක 2196/27 දරණ අතිවිශේෂ ගැසට් නිවේදනය මඟින් මෙම අමාත්‍යාංශයට පැවරී ඇති විෂයයන් සහ කාර්යයන්හි එක් අංශයකි. 2021 වර්ෂය තුළ මේ සම්බන්ධයෙන් පහත සඳහන් ක්‍රියාමාර්ග ගෙන ඇත

1. **විගමණික ශ්‍රමිකයන්ගේ සුබසාධනය සහ ආරක්ෂාව සහතික කිරීම සඳහා ශ්‍රී ලංකා රාජ්‍ය තාන්ත්‍රික දූත මණ්ඩලවල කම්කරු කටයුතු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට පත් කරන ලද නිලධාරීන් තෝරා ගැනීමට සුදුසු ක්‍රමවේදයක් සකස් කිරීම**

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය මඟින් රාජ්‍ය තාන්ත්‍රික දූත මණ්ඩල සඳහා අනුයුක්ත කරන ලද නිලධාරීන් සත්කාරක රටේ භාෂාව හැසිරවීමට නොහැකි වීම, ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ප්‍රවීණතාව නොමැතිකම සහ නිපුණතා නොමැතිකම හේතුවෙන් නියමිත ප්‍රමිතීන්ට අනුකූලව කාර්යක්ෂමව හා ඵලදායී ලෙස පවරන ලද රාජකාරි ඉටු කිරීමේ දුෂ්කරතාවන්ට මුහුණ දී ඇති බව නිරීක්ෂණය විය. මෙම තත්ත්වය මඟහරවා ගැනීමට ශ්‍රී ලාංකික විගමණික ශ්‍රමිකයන්ගේ රැකියා සම්බන්ධයෙන් පැන නඟින නීතිමය හා සමාජීය ගැටළුවලට ඵලදායී හා කාර්යක්ෂම සේවාවක් සැපයීම උදෙසා පහත සඳහන් පියවරයන් සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගන්නා ලදී.

- එක් එක් රටට විශේෂිත වූ දැනට පවතින තනතුරු සහ සේවක සංඛ්‍යාව සමාලෝචනය කිරීම සහ අදාළ රේඛීය අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු සමඟ සහයෝගීතාවයෙන් බඳවා ගැනීමේ ක්‍රමවේදයක් සකස් කිරීම
- සංශෝධිත බඳවා ගැනීමේ පටිපාටියට අනුව විධිමත් පරිදි විභාග පවත්වා විනිවිදභාවයෙන් යුතුව නිසි ක්‍රමවේදයකට අනුව පමණක් අදාළ තනතුරුවලට බඳවා ගැනීම් සිදු කිරීම

2. **ශ්‍රී ලාංකික විගමණික ශ්‍රමිකයින් සඳහා රක්ෂණ හිමිකම් ප්‍රදානය කිරීම**

ශ්‍රී ලාංකික විගමණික ශ්‍රමිකයින්ට ප්‍රතිලාභ සහතික කිරීම සඳහා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය මඟින් විගමණික ශ්‍රමික රක්ෂණ ආවරණයක් පවත්වාගෙන යනු ලබයි. වර්තමානයේදී විගමණික ශ්‍රමිකයෙකුගේ මරණයකදී ලබා දෙන උපරිම වන්දි මුදල රු. 600,000/-ක් වැනි අවම මට්ටමක පවතී. විගමණික ශ්‍රමික මරණයකදී යැපෙන්නන් සඳහා ඇමෙරිකානු ඩොලර් 15,000ක අවම වන්දියක් ඇතුළුව නව රක්ෂණ ක්‍රමයක් හඳුන්වාදීමටත්, ස්ථිරව හෝ අර්ධ වශයෙන් ආබාධිත තත්ත්වයට පත් වුවහොත් වෛද්‍ය ප්‍රතිකාර ආවරණය කිරීම සඳහා ඇමෙරිකානු ඩොලර් 3,000 - 15,000 අතර වන්දි මුදලක් ප්‍රදානය කිරීමටත් මූලික ක්‍රියාමාර්ග ගෙන ඇත. දැඩි හිරිහැරයට ලක්වීම, බරපතල රෝගාබාධවලට ගොදුරු වීම, බරපතල අනතුරකට මුහුණ පෑම මෙන්ම කොවිඩ් - 19 වැනි වසංගත තත්ත්වයන් ආවරණය කිරීම සඳහා ප්‍රතිපාදන ඇතුළත් කිරීමට අපේක්ෂිතය.



ඊට අමතරව, එම රක්ෂණ ආවරණය අනිවාර්යයෙන් ලබා දී ඇති බවට සනාථ කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතු බවට පිටත්වීමට පෙර ඉදිරිපත් කළ යුතු කොන්දේසියක් වශයෙන් නිෂ්කාශන වාර්තාවට ඇතුළත් කිරීමට යෝජනා කෙරේ. මේ සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන ඇති අතර විදේශ රැකියා ප්‍රවර්ධන සහ වෙළෙඳපොළ විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශය මඟින් අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගනිමින් සිටී.

### 2.2.3 කාර්මික සාමය සුරක්ෂිත කිරීම මඟින් ආර්ථික සංවර්ධනය වේගවත් කිරීම

අන්තර්ජාතිකව තරඟකාරී ආර්ථිකයක් සඳහා කල්පවත්නා කාර්මික සාමයක් සහිත රටක් නිර්මාණය කිරීම සඳහා දායකත්වය සැපයීම **කම්කරු දෙපාර්තමේන්තුවෙහි** දැක්ම වන හෙයින් කාර්මික සාමය පවත්වා ගැනීම කම්කරු දෙපාර්තමේන්තුවේ මූලික හා අත්‍යවශ්‍ය කාර්යය වේ.

මේ සඳහා සේව්‍ය සේවක දෙපාර්ශවය අතර කතිකාවක් පවත්වාගෙන යාම, ඒකාබද්ධ ශ්‍රමික පරීක්ෂණ සිදු කිරීම, ව්‍යවස්ථාපිත හිමිකම් අහිමිවීම් පිළිබඳ පැමිණිලි විසඳීම සහ කාර්මික ආරවුල් නිරවුල් කිරීම, ශ්‍රමිකයන්ගේ වෘත්තීය අයිතිවාසිකම් සුරැකීම සඳහා අධිකරණ ක්‍රියාමාර්ග ගැනීම යන ප්‍රධාන කාර්යයන් හතර යටතේ කම්කරු දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක වේ.

සේව්‍ය සේවක දෙපාර්ශවය අතර කතිකාවතක් පවත්වා ගැනීම දිවයින පුරා විසිරී ඇති පෞද්ගලික හා අර්ධ රාජ්‍ය ආයතනවල උපරිම ඵලදායීතාව හා කාර්යක්ෂමතාවය වර්ධනය කිරීම සඳහා සේව්‍ය සේවක දෙපාර්ශවය අතර කාර්මික සාමය තහවුරු කෙරෙන වැඩ පරිසරයක් නිර්මාණය කිරීමේ ක්‍රියාවලිය ඉටු කිරීම උදෙසා 2021 වර්ෂයේදී පහත කාර්යයන් ඉටු කරන ලදී.

1. **සේව්‍ය සේවක දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම**

සේව්‍ය සේවක දැනුවත් කිරීමේ වැඩසටහන් වගුව 2-1 පරිදි සිදු කළ අතර කම්කරු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩමුළු දෙකක්ද පවත්වන ලදී.

**වගුව 2-1** සමාජ කතිකා වැඩසටහන්වල ප්‍රගතිය - 2021

| | කාර්යය | වැඩසටහන් සංඛ්‍යාව | සහභාගී වූ සංඛ්‍යාව / ප්‍රතිලාභීන් සංඛ්‍යාව | |
|---|---|---|---|---|
| | | | සේවකයන් | සේව්‍යයන් |
| 1 | සේව්‍ය සේවක දෙපාර්ශවය දැනුවත් කිරීමේ ආයතන මට්ටමේ වැඩසටහන් | 31 | 875 | 307 |
| 2 | අර්ධ රාජ්‍ය ආයතනවල පවත්වන ලද වැඩසටහන් | 3 | 150 | 10 |

2. **මහජනතාව දැනුවත් කිරීම සඳහා ප්‍රකාශන එළි දැක්වීම**

- **කතිකාව පුවත් සඟරාව**

ජුනි 12 වන දින යෙදී තිබූ ලෝක ළමා ශ්‍රම විරෝධී දිනය හා 2021 ජාත්‍යන්තර ළමා ශ්‍රමය තුරන් කිරීමේ වසරට සමගාමීව "කතිකාව" පුවත් සඟරාව 20 වන වෙළුම එළි දක්වන ලදී.

- **Prime Work සඟරාව**

ආයතනවල සේවකයන් හා සේවායෝජකයන් අතර කම්කරු ක්ෂේත්‍රය පිළිබඳ දැනුම සහ කතිකාවත වර්ධනය කර කාර්මික සාමය සුරක්ෂිත කිරීමේ අරමුණින් නොමිලේ බෙදා හැරීම සඳහා මුද්‍රිත මෙම සඟරාවෙහි පළමු කලාපය 2021 ජුනි මාසයේදී Navigating Conflicts යන තේමාව යටතේ ද දෙවන කලාපය 2021 දෙසැම්බර් මාසයේදී Work-Life Balance යන තේමාව යටතේ ද එළි දක්වන ලදී.

- **සමාජ කතිකා වැඩසටහන් අත්පොත් සහ කම්කරු නීති අත්පොත්**

මෙරට පෞද්ගලික අංශයේ සහ අර්ධ රාජ්‍ය අංශයේ සේවායෝජකයන්, සේවකයන්,


කම්කරු නීති පිළිබඳව උනන්දුව දක්වන පිරිස් සහ කම්කරු ක්ෂේත්‍රය පිළිබඳව අධ්‍යයනයේ යෙදෙන විද්‍යාර්ථයින්ගේ ප්‍රයෝජනය සඳහා සරල බසින් රචිත කම්කරු නීති පොතක අවශ්‍යතාව සපුරාලීම සඳහා කම්කරු නීති අත්පොතක් සම්පාදනය කරන ලද අතර සමාජ කතිකාව හා වැඩපොළ සහයෝගිතාව පිළිබඳව සේව්‍ය සේවක දෙපාර්ශවය දැනුවත් කිරීම සඳහා අත්පොතක් ද සම්පාදනය කරන ලදී.

කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් රටේ පැවති තත්ත්වය මත සමාජ කතිකා අංශය, කලාප කම්කරු කාර්යාල, දිස්ත්‍රික් කම්කරු කාර්යාල හා උප කම්කරු කාර්යාල මඟින් පැවැත්වීමට අපේක්ෂා කරන ලද සේව්‍ය සේවක දෙපාර්ශවය දැනුවත් කිරීමේ වැඩසටහන්, සමාජ වේදිකා වැඩසටහන් සහ කලාප උපදේශන සභා පැවැත්වීමට නොහැකි විය.

එසේම, සමාජ කතිකාව කොතරම් දුරට ආයතන තුළ තහවුරු වී තිබේද යන්න පිළිබඳව නිෂ්පාදන, සේවා, ඇඟලුම් හා වතු අංශය නියෝජනය වන පරිදි කුඩා, මධ්‍ය හා මහා පරිමාණ වශයෙන් දීප ව්‍යාප්තව සමාජ කතිකාව හා වැඩපොළ සහයෝගීතාවය පිළිබඳ තරඟාවලියක් කම්කරු දෙපාර්තමේන්තුව විසින් වාර්ෂිකව පැවැත්වීමට කටයුතු කරනු ලබයි. නමුත් කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් මෙම තරඟාවලිය 2021 වසරේදී නොපැවැත්වීමට තීරණය කරන ලදී.

## 3. කාලීන පරීක්ෂණ සිදු කිරීම

කාලීන පරීක්ෂණ සිදුකිරීමේ මුඛ්‍ය පරමාර්ථය වනුයේ වැඩ පියසේදී සේවකයන්ගේ ව්‍යවස්ථාපිත හිමිකම් ආරක්ෂා කිරීම සඳහා පනවා ඇති නීති හා රෙගුලාසි නිසි පරිදි ක්‍රියාත්මක වේද යන්න පරීක්ෂාවට ලක් කර, අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සහ සේව්‍ය සේවක දෙපාර්ශවය අතර ගැටළු ඇති වීම පාලනය කර සුහද සම්බන්ධතාවයක් ඇති කිරීමයි. මෙම කාර්යය ඉටු කිරීම සඳහා ශ්‍රී ලංකාවම ආවරණය වන පරිදි කලාප / දිස්ත්‍රික් / උප කම්කරු කාර්යාල හා දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු කාර්යාල ස්ථාපනය කර ඇති අතර, ප්‍රධාන කාර්යාලයේ අංශයන් ද ඇතුළුව 2021.12.31 දිනට දෙපාර්තමේන්තුවේ සේවය කරන මුළු කම්කරු නිලධරයන් සංඛ්‍යාව 474ක් වේ. 2021 වසරේදී කම්කරු නිලධරයන් විසින් සිදු කළ සමස්ත කම්කරු පරීක්ෂණ සංඛ්‍යාව 45,724ක් වේ.




**ප්‍රස්තාරය 2-1** කම්කරු පරීක්ෂණ - 2020 වර්ෂයේ ප්‍රගතියට සාපේක්ෂව 2021 වර්ෂයේ ප්‍රගතිය




2021 වර්ෂයේදී සිදු කරන ලද කම්කරු පරීක්ෂණ සංඛ්‍යාව පෙර වර්ෂවලට සාපේක්ෂව අඩු වී ඇත. එයට හේතු වනුයේ 2021 පැවති කොඩිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් කම්කරු පරීක්ෂණ සිදු කිරීම වර්ෂයේ ඇතැම් මාසයන්හිදී සම්පූර්ණයෙන්ම අත්හිටුවා තිබීම සහ පරීක්ෂණ සිදු කිරීම සීමා කිරීම වේ.

## 4. ව්‍යස්ථාපිත හිමිකම් උල්ලංඝනය වීම් පිළිබඳ පැමිණිලි විසඳීම සහ කාර්මික ආරවුල් නිරවුල් කිරීම

ව්‍යවස්ථාපිත නීති උල්ලංඝනය වීම් හා කාර්මික ආරාවුල් ඇති වීමට ඉඩ ඇති අවස්ථා හා වැඩ වර්ජන පිළිබඳ පැමිණිලි ප්‍රධාන කාර්යාලයට, දිස්ත්‍රික් කාර්යාල හා උපකාර්යාල වෙත යොමු කිරීම සේවකයන් හෝ වෘත්තීය සමිති විසින් කරනු ලැබේ. දිස්ත්‍රික් කාර්යාල, කලාප කාර්යාල හා ප්‍රධාන කාර්යාලයේ අදාළ අංශ මඟින්ද ඒවා විසඳීමට කටයුතු කරනු ලැබේ. එම උත්සාහය අසාර්ථක වුවහොත් එම කාර්මික ආරවුල්, විෂයභාර ඇමතිතුමා විසින් බේරුම්කරුවෙකු වෙත හෝ කාර්මික අධිකරණය වෙත යොමුකර විසඳුමක් ලබා දීමට කටයුතු කරනු ලැබේ.

2020 වර්ෂයට සාපේක්ෂව 2021 වර්ෂයේදී කාර්මික ආරවුල් සහ ව්‍යවස්ථාපිත නීති උල්ලංඝනය වීම් පිළිබඳ පැමිණිලි ලැබීම් හා විසඳීම් පහත පරිදි වේ.




**ප්‍රස්තාරය 2-2** 2020 වර්ෂයට සාපේක්ෂව 2021 වර්ෂයේදී කාර්මික ආරවුල් සහ ව්‍යවස්ථාපිත නීති උල්ලංඝනය වීම් පිළිබඳ පැමිණිලි ලැබීම් හා විසඳීම්

කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් 2021 වර්ෂය තුළ ලැබුණු සහ විසඳූ පැමිණිලි සංඛ්‍යාව පෙර වර්ෂවලට සාපේක්ෂව පහළ අගයක් ගෙන ඇති බව නිරීක්ෂණය වේ.

කාර්මික ආරවුලක් වැඩ වර්ජනයක් දක්වා වර්ධනය විය හැකි තත්ත්වයන් නිරීක්ෂණය වූ වහාම කම්කරු දෙපාර්තමේන්තු නිලධරයන් විසින් එම තත්ත්වය පාලනය කිරීමට කටයුතු කරන අතර, වැඩ වර්ජනයක් ඇති වුවහොත් ඒ සඳහා අවශ්‍ය මැදිහත්වීම් සිදු කර විසඳීමට කටයුතු කරනු ලැබේ. 2020 වසරට සාපේක්ෂව 2021 වසරේ වාර්තා වූ වැඩ වර්ජන සංඛ්‍යාවේ සුළු අඩුවීමක් දක්නට ඇති නමුත් අහිමි වූ මිනිස් දින සංඛ්‍යාව ලෙස ගත් කල වැඩිවීමක් නිරීක්ෂණය වේ.

**වගුව 2-2** වැඩ වර්ජන පිළිබඳ දත්ත වාර්තා - 2020 වසරට සාපේක්ෂව 2021 වර්ෂය

| වර්ෂය | සිදුවීම | වතු | ඉදිකිරීම් | නිෂ්පාදන | පතල් කැණීම් | නවාතැන් හා ආහාර සැපයුම | අර්ධ රාජ්‍ය | වෙනත් සේවා | මුළු එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|
| 2020 | වැඩ වර්ජන වාර්තා වීම් | 13 | - | 12 | - | 2 | - | 1 | **28** |
| | සහභාගි වූ සේවක සංඛ්‍යාව | 1,936 | - | 4,040 | - | 64 | - | 85 | **6,125** |
| | අහිමි වූ මිනිස් දින සංඛ්‍යාව | 9,375 | - | 12,806 | - | 324 | - | 85 | **22,590** |
| 2021 | වැඩ වර්ජන වාර්තා වීම් | 05 | - | 12 | - | - | - | - | **17** |
| | සහභාගි වූ සේවක සංඛ්‍යාව | 848 | - | 5,872 | - | - | - | - | **6,720** |
| | අහිමි වූ මිනිස් දින සංඛ්‍යාව | 3,705 | - | 105,067 | - | - | - | - | **108,772** |

කාර්මික ආරවුල් නිරවුල් කිරීමේදී සාමූහික ගිවිසුම්වලට එළඹීම මඟින් සේව්‍ය සේවක දෙපාර්ශවය වෙත වඩා ස්ථිර විසඳුමක් ලැබීම මෙන්ම කම්කරු නීති රීතිවලින් ලබාදී ඇති අයිතිවාසිකම් සහ වරප්‍රසාදවලට වඩා වැඩි වරප්‍රසාද ලබා ගැනීමට හැකියාවද ලැබේ. එසේම, සාමූහික ගිවිසුම් සඳහා සමාජ කතිකාවත තුළින් පෙළඹවීමක් සිදුකිරීමට කම්කරු දෙපාර්තමේන්තුව විසින් උත්සාහ ගනු ලැබේ. 2021 වර්ෂය තුළදී ගැසට් පත්‍රයේ පළ කරන ලද සාමූහික ගිවිසුම් 25ද ඇතුළුව 2021.12.31 දිනට ක්‍රියාත්මකව පවතින සාමූහික ගිවිසුම් සංඛ්‍යාව 171කි.

ප්‍රාදේශීය කාර්යාල මඟින් හෝ ප්‍රධාන කාර්යාලයේ කාර්මික සම්බන්ධතා අංශය මඟින් කටයුතු කළ ද නිරවුල් කළ නොහැකි වූ ආරවුල්, බේරුම්කරණයට හෝ කාර්මික අධිකරණයකට යොමු කිරීම සිදු කරනු ලබන අතර 2021 වර්ෂයේදී අනිවාර්ය බේරුම්කරණයට යොමු කිරීම් 73ක්ද ප්‍රදාන නිකුත් කිරීම් 49ක්ද සිදු කර ඇත. මෙම බේරුම්කරණ කටයුතු කාර්යක්ෂමව සිදු කිරීම සඳහා 2021 වර්ෂය තුළදී බේරුම්කරුවන් 86 දෙනෙකු සඳහා පත් වීම් ලබා දී ඇත.

සෑම වෘත්තීය සමිතියක්ම කම්කරු දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වීම අනිවාර්ය කටයුත්තකි. ඒ අනුව, 2021 වර්ෂයේදී දෙපාර්තමේන්තුවෙහි ලියාපදිංචි කරන ලද වෘත්තීය සමිති සංඛ්‍යාව 128කි. 2021.12.31 දිනට ක්‍රියාත්මක වලංගු මුළු වෘත්තීය සමිති සංඛ්‍යාව 1,936කි.

### 2.2.4 විශේෂ විමර්ශන

කම්කරු දෙපාර්තමේන්තුවේ යම් අංශයක් හෝ කම්කරු කාර්යාලයක් විසින් සිදු කරන ලද යම් පැමිණිලි විමර්ශනයක් හෝ යම් ආයතනයක සිදු කරන ලද පරීක්ෂණයක් සිදුවූ ආකාරය පිළිබඳ සෑහීමට පත්නොවන අයකු විසින් ස්වාධීන පරීක්ෂණයක් නැවත ලබාගනු පිණිස කම්කරු කොමසාරිස් ජනරාල් වෙත කරනු ලබන ඉල්ලීම් අවශ්‍යතාව පරිදි නැවත විමර්ශනය කරනු ලැබේ. එම විමර්ශන කටයුතු දෙපාර්තමේන්තුවේ විශේෂ විමර්ශන අංශය විසින් සිදු කරනු ලැබේ.

ඒ අනුව, 2021 වර්ෂයේදී පැමිණිලි පරීක්ෂණ 422ක් සිදු කරන ලද අතර එමඟින් ගණනය කරන ලද හිඟ සේවක අර්ථසාධක අරමුදල් වටිනාකම රු. 21,782,992.58ක් වන අතර ගණනය කරන ලද වෙනත් හිඟ ව්‍යවස්ථාපිත දීමනා වටිනාකම රු.14,061,361.23ක් වේ.

### 2.2.5 ශ්‍රම ප්‍රමිතීන් ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම

පෞද්ගලික අංශයේ සේවා නියුක්තයන්ගේ රැකියා සුරක්ෂිතභාවය හා සුභසාධනය කෙරෙහි බලපාන්නා වූ වැටුප්, සේවා තත්ත්වයන් හා කොන්දේසි පිළිබඳව ප්‍රමිතීන් සකස් කිරීම, යාවත්කාලීන කිරීම හා ඒවාට නෛතික තත්ත්වය ලබාදීම කම්කරු දෙපාර්තමේන්තුවේ ප්‍රමුඛ කාර්යභාරයක් වේ. මේ අනුව, 2021 වර්ෂයේදී පහත ක්‍රියාකාරකම් සිදු කර ඇත.

**වගුව 2-3** ශ්‍රමික අයිතීන් ප්‍රමිතිගත කිරීමේ ක්‍රියාකාරකම් - 2021

| අනු අං. | වැඩසටහන / ක්‍රියාකාරකම | 2021 වසර සඳහා වූ ඉලක්ක | | 2021.12.31 දිනට ප්‍රගතිය | |
|---|---|---|---|---|---|
| | | භෞතික | මූල්‍ය (රු.) | භෞතික | මූල්‍ය (රු.) |
| 1 | කාලය ඉකුත් වන පඩි පාලක සභා 05ක් සඳහා නියෝජිතයන් පත් කිරීම | 100% | 250,000.00 | 90% | 183,421.80 |
| 2 | ජාතික අවම වේතන පනත සංශෝධනය කිරීමෙන් අනතුරුව පඩි පාලක සභා 40 කැඳවීම | 100% | 12,600,000.00 | 35% | 1,082,429.10 |
| 3 | පඩි පාලක සභාවල වැටුප් සංශෝධනය කිරීම<br>රබර් වැවීමේ හා දළ රබර් නිපදවීමේ කර්මාන්තය<br>තේ වැවීමේ හා සෑදීමේ කර්මාන්තය<br>මල් විසිතුරු පැල එළවළු හා පළතුරු වගා කිරීමේ හා අපනයනය කිරීමේ කර්මාන්තය | 100% | 600,000.00 | 100% | 473,282.80 |
| 4 | කොකෝවා, කරඳමුංගු හා ගම්මිරිස් වැවීමේ හා සෑදීමේ කර්මාන්තයට අදාළ මාසික වැටුප් ගණනය කිරීම හා ප්‍රසිද්ධ කිරීම | 100% | 312,000.00 | 92% | 391,278.60 |
| 5 | දින පහ වැඩ සතිය සඳහා අනුමැතිය ලබා දීම | ඉල්ලීම් අනුව | - | 210 | - |
| 6 | සාමූහික ගිවිසුම්වල නීතිමය වලංගුභාවය පරීක්ෂා කිරීම | ඉල්ලීම් අනුව | - | 35 | - |
| 7 | පඩි පාලක සභා ආඥාපනත් හා සාප්පු හා කාර්යාල සේවක පනත යටතේ වැටුපෙන් අඩු කිරීම් සඳහා ලැබෙන ඉල්ලීම් සඳහා අනුමැතිය ලබා දීම | ඉල්ලීම් අනුව | - | 29 | - |

| | | | | | |
|---|---|---|---|---|---|
| 8 | අංශය විසින් ප්‍රකාශයට පත් කරනු ලබන ගැසට්, පනත් සංශෝධන හා රෙගුලාසිවල මෘදු පිටපත් දෙපාර්තමේන්තු වෙබ් අඩවියෙහි උඩුගත කිරීම සඳහා යොමු කිරීම | අවශ්‍යතාවය අනුව | - | 3 | - |
| 9 | පඩි පාලක සභා තීරණ ඉංග්‍රීසි හා දමිළ භාෂාවට පරිවර්තනය කිරීම | 100% | 120,000.00 | 60% | 13,357.50 |
| 10 | අණපනත් පිළිබඳව මහජනතාව හා විවිධ ආයතන මඟින් කරනු ලබන විමසීම්වලට පැහැදිලි කිරීම් හා අර්ථනිරූපණ ඉදිරිපත් කිරීම | ඉල්ලීම් අනුව | - | 39 | - |

**පඩි පාලක සභාවල අවම වැටුප් යාවත්කාලීන කිරීම**

කර්මාන්තවල සේවයේ නියුක්තව සිටින්නන්ගේ පඩි සහ වෙනත් පාරිශ්‍රමික විධිමත් කිරීම සඳහා ද පඩි පාලක සභා පිහිටුවීම හා සංස්ථාපනය කිරීම සඳහා ද එකී කරුණු සම්බන්ධ වෙනත් කාර්යය සඳහාද විධිවිධාන සැලසීම 1947 අංක 27 දරණ පඩිපාලක සභා ආඥා පනතේ නියමයන් අනුව සිදු කරනු ලැබේ. යම් සේවයක් සඳහා ගෙවිය යුතු අවම වැටුප, වැඩ කළ යුතු පැය ගණන, නිවාඩු ලබා දිය යුතු කාල සීමාවන් හා ඊට අදාළ කරුණු පිළිබඳ නියමයන් හා එම නියමයන් පැනවීමට අදාළ නෛතික තත්ත්වයන් පිළිබඳ විධිවිධාන මෙම පනතේ ඇතුලත් වේ.

ඒ අනුව, රු. 12,500/-ට අඩු මාසික අවම වැටුප් සහ රු. 500/-ට අඩු දෛනික වැටුප් පවතින පහත පඩි පාලක සභාවල අවම වැටුප් යාවත්කාලීන කිරීම කම්කරු දෙපාර්තමේන්තුව විසින් 2021 වර්ෂයේදී සිදු කරන ලදී.

**වගුව 2-4** අවම වැටුප් යාවත්කාලීන කළ පඩි පාලක සභා

| අනු අංකය | පඩි පාලක සභාව | වැටුප් යාවත්කාලීන කිරීමට පෙර මාසික වැටුප (මූලික වැටුප) රු. | වැටුප් යාවත්කාලීන කිරීමට පසු මාසික වැටුප (මූලික වැටුප) රු. |
|---|---|---|---|
| 1 | රබර්, ප්ලාස්ටික් හා පෙට්‍රෝලියම් රෙසින ආශ්‍රිත භාණ්ඩ නිපදවීමේ කර්මාන්තය | 10,000.00 | 12,500.00 |
| 2 | ආරක්ෂක සේවා කර්මාන්තය | 10,000.00 | 12,500.00 |
| 3 | රෙදි පිළි නිෂ්පාදන කර්මාන්තය | 10,000.00 | 12,500.00 |
| 4 | මුද්‍රණ කර්මාන්තය | 10,000.00 | 12,500.00 |
| 5 | හෝටල් හා භෝජන සැපයීමේ කර්මාන්තය | 10,000.00 | 12,500.00 |
| 6 | සිල්ලර හා තොග වෙළඳ කර්මාන්තය | 11,500.00 | 12,500.00 |
| 7 | ගඩොල් සහ උළු නිපදවීමේ කර්මාන්තය | 11,126.00<br>445.00* | 13,351.00<br>534.00* |
| 8 | පොල් නිපදවීමේ කර්මාන්තය | 425.00* | 500.00* |
| 9 | තේ වැවීමේ හා සෑදීමේ කර්මාන්තය | 405.00* | 900.00* |
| 10 | රබර් වැවීමේ හා දළ රබර් නිපදවීමේ කර්මාන්තය | 405.00* | 900.00* |

සටහන - *දිනක වැටුප

**2.2.6 සේවකයාගේ වෘත්තීය සෞඛ්‍ය ආරක්ෂිතබව සඳහා සුනිසි වැඩ පරිසරය තහවුරු කිරීම**

**1 කම්කරු දෙපාර්තමේන්තුව විසින් වෘත්තීය සෞඛ්‍යාරක්ෂිතබව තහවුරු කිරීම සඳහා ඉටු කළ ක්‍රියාකාරකම්**

කර්මාන්තශාලා ආඥා පනත අනුව සේවකයන්ගේ සෞඛ්‍ය තත්ත්වය ආරක්ෂා වන පරිදි සේවා ස්ථානයේ පරිසරය සැකසීම සේවායෝජකයාගේ අනිවාර්ය වගකීමක් වන අතර, ආරක්ෂිත සේවා පරිසරයක සේවය කිරීමට ඇති හිමිකම මෙමඟින් තහවුරු කර ඇත.

**I. සේවා ස්ථානවල සෞඛ්‍යාරක්ෂිතබව පරීක්ෂාවට ලක් කිරීම**

සේවා ස්ථානයක සෞඛ්‍ය ගැටළු හෝ අනතුරු සිදුවීමට ඇති අවස්ථා තිබේද යන්න විද්‍යාත්මක ක්‍රමවේදයන් යටතේ සොයාබැලීම, එම අනතුරු වැළැක්වීම සඳහා පියවර ගැනීම හා වළක්වා ගැනීමට ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ දැනුවත් කිරීම කම්කරු දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලැබේ.

අනතුරු සිදුවීමට ඇති අවස්ථා තිබේද යන්න පරීක්ෂා කිරීම සඳහා දෙපාර්තමේන්තුව විසින් සේවා ස්ථානයන්හි පාරිසරික තත්ත්ව අධීක්ෂණ සඳහා පාරිසරික මිනුම් ලබා ගැනීම, ජෛව විද්‍යාත්මක අධීක්ෂණ, ශබ්ද මැනීමේ පරීක්ෂණ, වෘත්තීය සෞඛ්‍ය හා සුරක්ෂිතතා විගණනයන් ආදිය සිදු කරනු ලැබේ. ඒ අනුව, 2021 වර්ෂයේදී සිදු කරන ලද ක්‍රියාකාරකම් පහත පරිදි වේ.

**වගුව 2-5** සේවා ස්ථානවල සෞඛ්‍යාරක්ෂිත බව පරීක්ෂාවට ලක් කිරීම සඳහා සිදු කරනු ලැබූ ක්‍රියාකාරකම් - 2021

| | වැඩසටහන / ක්‍රියාකාරකම | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | පාරිසරික මිනුම් | 86 |
| 2 | ජෛව විද්‍යාත්මක පරීක්ෂණ | 1,475 |
| 3 | වෘත්තීය සෞඛ්‍ය හා සුරක්ෂිතතා විගණනයන් | 150 |

මෙහිදී, පාරිසරික මිනුම් ලබා ගැනීම යටතේ ආලෝක තීව්‍රතාවය, ශබ්දය, සුළඟේ වේගය, WBGT Index, Dry Dull උෂ්ණත්වය, Wet Bulb උෂ්ණත්වය, Globe උෂ්ණත්වය, සාපේක්ෂ ආද්‍රතාවය යන මිනුම් යටතේ නියැඳි ලබා ගැනීමට කටයුතු කරන ලද අතර 2021 වර්ෂය තුළ ලබා ගන්නා ලද සමස්ත නියැඳි සංඛ්‍යාව 3,562කි.

**II. සේවා ස්ථානවල සෞඛ්‍යාරක්ෂිතබව ආරක්ෂා කිරීමට අවශ්‍ය දැනුම ලබා දීම සහ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම**

සේවා ස්ථානයක සේවකයන්ගේ සෞඛ්‍යමය ආරක්ෂාව පිළිබඳව සේව්‍ය සේවක දෙපාර්ශවයම ආවරණය වන පරිදි දැනුවත්

කිරීමේ වැඩසටහන් පවත්වනු ලැබේ. 2021 වර්ෂයේදී කම්කරු දෙපාර්තමේන්තුව විසින් පවත්වන ලද දැනුවත් කිරීමේ වැඩසටහන් පිළිබඳ විස්තර පහත වගුව 2-6 පරිදි වේ. එම දැනුවත් කිරීමේ වැඩසටහන්වල සමස්ත ප්‍රතිලාභීන් සංඛ්‍යාව 2,041කි.

මෙහිදී, කොවිඩ් 19 වසංගත තත්ත්වය යටතේ කර්මාන්තශාලාවල නිෂ්පාදන කටයුතු සෞඛ්‍ය උපදෙස්වලට අනුකූලව, සේවක ආරක්ෂාව තහවුරු කරමින්, වෘත්තීය සෞඛ්‍ය ආශ්‍රිත සේව්‍ය සේවක ගැටළු ඇති නොවන පරිදි අඛණ්ඩව පවත්වාගෙන යාමට අවශ්‍ය දැනුවත් කිරීම්ද සිදු කරන ලදී.

**වගුව 2-6** සේවා ස්ථානවල සෞඛ්‍යාරක්ෂිත බව ආරක්ෂා කිරීමට අවශ්‍ය දැනුම ලබා දීම සහ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම - 2021

| | වැඩසටහන / ක්‍රියාකාරකම | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | දැනුවත් කිරීමේ වැඩසටහන් | |
| | සේව්‍ය-සේවකයන්, කම්කරු නිලධාරින් හා වෛද්‍ය නිලධාරීන් සඳහා වූ අධ්‍යාපනික වැඩසටහන් | 67 |
| 2 | සේව්‍ය-සේවකයන්, කම්කරු නිලධාරින් හා වෛද්‍ය නිලධාරීන් සඳහා වූ පුහුණු වැඩසටහන් | 57 |
| | සේව්‍ය-සේවකයන්, කම්කරු නිලධාරින් හා වෛද්‍ය නිලධාරීන් සඳහා වූ දැනුවත් කිරීමේ වැඩසටහන් | 100 |
| 3 | විශේෂඥ සාක්ෂි සැපයීම | 10 |

### III. වෛද්‍ය මණ්ඩල තීරණ ලබා දීම

වෛද්‍ය හේතු මත සේවක අර්ථසාධක අරමුදලේ හා සේවා නියුක්තයන්ගේ භාර අරමුදලේ ප්‍රතිලාභ ඉල්ලුම් කරන අයදුම්කරුවන් වෙනුවෙන් වෛද්‍ය මණ්ඩල 11ක් 2021 වර්ෂයේදී පවත්වා තීරණ ලබා දී ඇත. මෙම වෛද්‍ය මණ්ඩල තීරණ මඟින් සේවක අර්ථසාධක අරමුදලේ ප්‍රතිලාභ ලැබූ සේවක සංඛ්‍යාව 850ක් වන අතර සේවා නියුක්තයන්ගේ භාර අරමුදලේ ප්‍රතිලාභ ලැබූ සේවක සංඛ්‍යාව 240කි.

### IV. අනතුරු රහිත වැඩ පරිසරය තහවුරු කිරීම

කර්මාන්තශාලා තුළ සේවයෙහි යෙදෙන සේවකයන් හට විදුලිය, තාපය, වායු පීඩනය, අධික ආලෝකය හා ශබ්දය මඟින් හෝ වෙනත් කුමන ආකාරයකට හෝ ශාරීරික හානියක් හෝ මරණය පවා සිදුවීමේ අවධානමක් පවතින අතර ඒවා අවම කිරීම කම්කරු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යභාරයකි.

ශ්‍රී ලංකාවම ආවරණය වන පරිදි පිහිටුවා ඇති දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු කාර්යාල 10ක් ඇති අතර ඒවායෙහි සේවයේ නියුතු සුදුසුකම් ලත් ඉංජිනේරුවරුන් විසින් කර්මාන්තශාලා පරීක්ෂා කර මෙම කාර්ය ඉටු කරනු ලැබේ.

- **නව කර්මාන්තශාලා ලියාපදිංචි කිරීම**

නව කර්මාන්තශාලා ආරම්භ කිරීමේදී හෝ ලියාපදිංචිය සඳහා ඉල්ලුම් කළ අවස්ථාවලදී එම කර්මාන්තශාලා නියමිත ප්‍රමිතීන් අනුගමනය කර තිබේද යන්න පරීක්ෂා කර බලා එසේ නොමැති නම් ඒවා නිවැරදි කර ගැනීමට උපදෙස් දීම හා නියමිත ප්‍රමිතීන් හා සම්මතයන් අනුගමනය කර ඇති අවස්ථාවලදී ලියාපදිංචි කිරීම සිදු කරනු ලැබේ. 2021 වසර අවසන් වන විට කම්කරු දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති සමස්ත කර්මාන්තශාලා සංඛ්‍යාව 32,414කි. මෙම වසර තුළ ලියාපදිංචි කරන ලද නව කර්මාන්තශාලා 684ද එයට ඇතුලත්ය.

- **ගොඩනැගිලි පිඹුරුපත් පරීක්ෂා කිරීම හා සහතික කිරීම**

කර්මාන්තශාලා සඳහා ගොඩනැගිලි ඉදිකිරීමේදී ඒවා කර්මාන්තශාලා ආඥා පනතට අනුකූල වන්නේ ද යන්න පරීක්ෂා කිරීම හා ඒ බව සහතික කිරීම සිදු කෙරේ. 2021 වර්ෂය තුළදී ගොඩනැගිලි පිඹුරුපත් 133ක් පරීක්ෂා කර සහතික කර ඇත.

- **කර්මාන්තශාලා පරීක්ෂා කිරීම**

සෑම දිස්ත්‍රික් කර්මාන්තශාලා ඉංජිනේරු කාර්යාල බල ප්‍රදේශයක් තුළ ම පවත්නා කර්මාන්තශාලා නිරන්තර පරීක්ෂා කිරීමට ලක් කරන අතර එමඟින් අනතුරු ඇතිවීමේ තත්ත්වයන් කල් තබා හඳුනාගෙන අවශ්‍ය උපදෙස් හා ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනු ලැබේ. ඒ අනුව, 2021 වසර තුළ කර්මාන්තශාලා 1,587ක ප්‍රමාණයක් පරීක්ෂා කර ඇත.

- **අනතුරු විමර්ශනය සහ අන්තරාදායී සිදුවීම් විමර්ශනය**

2021 වර්ෂය තුළ මරණීය අනතුරු 63ක් හා මරණීය නොවන අනතුරු, 1,130ක ප්‍රමාණයක් කම්කරු දෙපාර්තමේන්තුව වෙත වාර්තා වී ඇත. මෙම අනතුරු විමර්ශනය කර අදාළ නීතිමය පියවර ගැනීමට කටයුතු කිරීමත් අනතුරට හේතු සොයා ගැනීම තුළින් එවැනි අනතුරු නැවත සිදු නොවන ආකාරයට කටයුතු කිරීමට සේවායෝජකයින් දැනුවත් කිරීමත් කම්කරු දෙපාර්තමේන්තුව විසින් සිදු කර ඇත. ඒ අනුව, කර්මාන්තශාලා ආඥා පනත උල්ලංඝනය වන පරිදි කටයුතු කළ සේව්‍යයන් 26කට එරෙහිව 2021 වර්ෂය තුළදී කම්කරු දෙපාර්තමේන්තුව විසින් නෛතික ක්‍රියාමාර්ග ගෙන ඇත.

- **අධිඅන්තරායදායී යන්ත්‍ර පරීක්ෂාව / නියාමනය කිරීම**

කර්මාන්තශාලා ආඥා පනත යටතේ පරීක්ෂාවට භාජනය කර පරීක්ෂණ වාර්තා ලබා ගත යුතු කර්මාන්තශාලාවල භාවිතා කරන හුමාල බොයිලේරු, හුමාල ග්‍රාහක, වායු ග්‍රාහක, එසවුම් යන්ත්‍ර, සෝපාන ඇතුළු අධි අන්තරාදායී යන්ත්‍ර පරීක්ෂා කරවීමට කටයුතු කිරීම සිදු කෙරේ. ඒ අනුව, 2021 වර්ෂය තුළදී එවැනි පරීක්ෂණ 7,405ක් සිදු කර ඇත.

- **පැමිණිලි විමර්ශනය**

කර්මාන්තශාලා සේවක සේවිකාවන්ගේ වෘත්තීය සුරක්ෂිතතාවය හා සෞඛ්‍යයට අදාළව ලැබෙන පැමිණිලි විමර්ශනය කිරීම හා පවතින ගැටළු නිරාකරණය කිරීමද කම්කරු දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලැබේ. ඒ අනුව, 2021 වර්ෂය තුළදී පැමිණිලි 81ක් විමර්ශනය කර ඇත.

- **දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම**

වෘත්තීය සුරක්ෂිතතාව ඉහළ නැංවීම් කටයුතුවලදී නීති රීති ක්‍රියාත්මක කිරීම මෙන්ම සේව්‍ය සේවක දෙපාර්ශවයේම දැනුම වර්ධනය කිරීම ප්‍රමුඛ කාර්යයක් සේ සලකා කර්මාන්තමය සුරක්ෂිතතා අංශය මඟින් සහ දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු කාර්යාල මඟින් 2021 වර්ෂය තුළදී පැවැත්වූ වැඩසටහන් පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

**වගුව 2-7** වෘත්තීය සුරක්ෂිතතාව ඉහළ නැංවීම් සඳහා සිදු කරන ලද දැනුවත් කිරීමේ වැඩසටහන් - 2021

| අනු අංකය | අදාළ අංශය | වැඩසටහන් සංඛ්‍යාව | සහභාගි වූ සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | ඇඟළුම් සහ නිෂ්පාදන | 05 | 360 |
| 2 | ඉදිකිරීම් | 03 | 375 |
| 3 | මිශ්‍ර වැඩසටහන් (ඉදිකිරීම්, නිෂ්පාදන සහ සේවා සැපයුම්) | 26 | 1,050 |
| | **එකතුව** | **34** | **1,785** |

කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් පැවති සීමා හේතුවෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම අපේක්ෂිත පරිදි සිදු කිරීම අපහසු විය.

### V. ලෝක සුරක්ෂිතතා දිනය සැමරුම සහ ජාතික වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පිළිබඳ සතිය

සෑම වසරකම අප්‍රේල් 28 දිනට යෙදෙන ලෝක සුරක්ෂිතතා දිනය වෙනුවෙන් කම්කරු දෙපාර්තමේන්තුව විසින් වාර්ෂිකව සංවිධානය කරනු ලබන ජාතික සම්මන්ත්‍රණය සහ ප්‍රාදේශීය මට්ටමින් වෘත්තීය සුරක්ෂිතතාවය හා සෞඛ්‍ය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් කොවිඩ් 19 වසංගත තත්වය හේතුවෙන් 2021 වර්ෂයේදී පැවැත්වීමට නොහැකි විය.

ජාතික වෘත්තීය සුරක්ෂිතතා සහ සෞඛ්‍ය සතිය නිමිත්තෙන් වූ ජාතික සම්මන්ත්‍රණය 2021.10.11 දින මාර්ගගත ක්‍රමයට පවත්වන ලදී. මේ සඳහා කර්මාන්තශාලා සේව්‍යයන් සහ සේවකයන් 100 දෙනෙකු සහභාගි විය.

මීට අමතරව, ජාතික වෘත්තීය සුරක්ෂිතතා සහ සෞඛ්‍ය සතියට සමගාමීව කර්මාන්තශාලා, ඉදිකිරීම් වැඩබිම් හා වෘත්තීය පුහුණු ආයතන සඳහා වෘත්තීය සෞඛ්‍ය හා සුරක්ෂිතතාව පිළිබඳ ප්‍රවර්ධන වැඩසටහන් 06ක් පවත්වන ලදී. එම වැඩසටහන් පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

**වගුව 2-8** වෘත්තීය සෞඛ්‍ය හා සුරක්ෂිතතාව පිළිබඳ ප්‍රවර්ධන වැඩසටහන්

| අනු අංකය | ස්ථානය | සහභාගී වූ සේව්‍ය / සේවක ප්‍රමාණය |
|---|---|---|
| 1 | Fire control drill at Port City | 150 |
| 2 | මර්බොක් ආයතන ශ්‍රවණාගාරය, හොරණ BOI | 75 |
| 3 | ITC Project, Galle face | 150 |
| 4 | සීතාවක BOI ශ්‍රවණාගාරය | 75 |
| 5 | කටුනායක BOI ශ්‍රවණාගාරය | 60 |
| 6 | මහනුවර, කුණ්ඩසාලේ BOI ශ්‍රවණාගාරය | 50 |
| 7 | HKN Waterfront construction site | 75 |

### VI. 2021 වර්ෂයේදී කටයුතු ආරම්භ කරන ලද අනෙකුත් ක්‍රියාකාරකම්

- සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පිළිබඳ ස්වයං විගණනය සම්බන්ධ රෙගුලාසි ඇතුලත් යෝජනා සකස් කර ඇති අතර නෛතික ප්‍රතිපාදන හඳුන්වා දීම සඳහා කටයුතු සිදු කරමින් පවතී
- වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය ප්‍රවර්ධනය කිරීම සඳහා අත්පොත්, පෝස්ටර් හා අත් පත්‍රිකා මුද්‍රණය කිරීමට කටයුතු කරන ලදී
- ඉදිකිරීම් සුරක්ෂිතතාවය පිළිබඳ වාර්තාමය රූපවාහිනී වැඩසටහනක් සකස් කරන ලද අතර එය 2022 වර්ෂයේදී ප්‍රචාරණය කිරීමට අපේක්ෂිතය
- අවදානම වැඩි ක්ෂේත්‍ර හඳුනාගැනීම සඳහා කම්කරු දෙපාර්තමේන්තුවේ ඉංජිනේරුවරුන් යොදවා අධ්‍යනයක් සිදු කිරීමට අවශ්‍ය මූලික පියවර ගන්නා ලදී. එහි ඉදිරි කටයුතු සඳහා විශේෂඥ උපදෙස් ලබා ගැනීමට අපේක්ෂිතය
- කර්මාන්තමය සුරක්ෂිතතා අංශයට අයත් ජාවත්ත කාර්යාල පරිශ්‍රය මහ ජනතාවට ආදර්ශයක් ගෙන දෙන පරිදි සහ සේවා ස්ථානයන්හි සුරක්ෂිතතාවය පිළිබඳ දැනුම ලබාදෙන පරිදි නවීකරණය කරන ලදී



### 2 ජාතික වෘත්තීය සුරක්ෂිතතා සහ සෞඛ්‍ය ආයතනය විසින් වෘත්තීය ආරක්ෂාව සහ සෞඛ්‍ය වැඩි දියුණු කිරීම සඳහා ඉටු කළ ක්‍රියාකාරකම්

සේවා ස්ථානවල සිදුවන වෘත්තීය අනතුරු අවම කිරීම සඳහා හා සුරක්ෂිත වැඩබිම් බිහිකරවීම සදහා අවශ්‍ය වන සෞඛ්‍ය හා සුරක්ෂිතතා නිලධාරීන් බිහි කිරීමේ අරමුණින් ජාතික වෘත්තීය සුරක්ෂිතතා සහ සෞඛ්‍ය ආයතනය (NIOSH) මඟින් පහත සඳහන් පරිදි වෘත්තීය ආරක්ෂාව සහ සෞඛ්‍ය පිළිබඳ පාඨමාලා පවත්වයි.

**වගුව 2-9** වෘත්තීය ආරක්ෂාව සහ සෞඛ්‍ය පිළිබඳ පුහුණු වැඩසටහන් - ජා. වෘ. සු. හා සෞ. ආ.

| | පාඨමාලාව | පැවැත් වූ පාඨමාලා ගණන | සහභාගී වූ සංඛ්‍යාව | (රු. මි.) |
|---|---|---|---|---|
| 01 | ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව | 3 | 115 | 11.51 |
| 02 | ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව | 4 | 125 | 5.81 |
| 03 | ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ පදනම් පාඨමාලාව | 2 | 29 | 0.88 |
| 04 | විධායක ශ්‍රේණි නිලධාරීන් සඳහා වන පාඨමාලාව | 4 | 82 | 1.64 |
| 05 | විදේශගතව සිට ලංකාවට පැමිණි පිරිස සඳහා වූ සහතිකපත්‍ර පාඨමාලාව | 1 | 56 | 2.52 |
| 06 | කොවිඩ් විගනණය සිදු කරන්නේ කෙසේද පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළුව | 1 | 14 | 0.07 |

ජාතික වෘත්තීය සුරක්ෂිතතා සහ සෞඛ්‍ය ආයතනය විසින් 2021 වර්ෂයේදී අවධානම් ඇගයීමේ සමීක්ෂණ 105 සිදු කළ අතර එහි දළ ආදායම රු. 5,250,000/- පමණ වේ.

කොවිඩ් වසංගතය මධ්‍යයේ වුවද ජාතික වෘත්තීය සුරක්ෂිතතා සම්මන්ත්‍රණ උළෙල 2021 සාර්ථකව නිම කරන ලදී. 2021.11.22 දින කම්කරු අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් ජාතික වෘත්තීය සුරක්ෂිතතා සම්මන්ත්‍රණ උළෙල පවත්වනු ලැබූ අතර එදින රාත්‍රියේදී ජාතික වෘත්තීය සුරක්ෂිතතා ඩිප්ලෝමා හා සහතිකපත්‍ර ප්‍රධානෝත්සවය පවත්වන ලදී.

ජාතික වෘත්තීය සුරක්ෂිතතා සතිය පදනම් කරගමින් ජාතික වෘත්තීය සුරක්ෂිතතා සම්මේලනය 2021 මාර්ගගතව පවත්වන්නට යෙදුණි. දින පහක් පුරාවට මෙම සම්මේලනය පවත්වන්නට කටයුතු කරනු ලැබූ අතර දින පහ සඳහා 100ත් 110ත් අතර පිරිසක් සහභාගී විය.

### 2021 වර්ෂයේදී ජාතික වෘත්තීය සුරක්ෂිතතා සහ සෞඛ්‍ය ආයතනය විසින් ඉටු කරන ලද සමාජ මෙහෙවර

- කොවිඩ් වසංගතය පිළිබඳව හා කම්කරුවන් මුහුණදෙන ගැටළු පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම
- කොවිඩ් වසංගතය පිළිබඳව පෝස්ටර් නිර්මාණය කර කර්මාන්ත අතර නොමිලේ බෙදාදීම
- ජාත්‍යන්තර කම්කරු සංවිධානය හා එක්ව නොමිලේ පුහුණු වැඩසටහන් පැවැත්වීම
- වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය

පිළිබඳ මාර්ගෝපදේශ පොතක් සකස් කිරීම
- සිසුන් 19 සඳහා සුනිසි මෙහෙවර වැඩසටහන යටතේ නොමිලේ වැඩසටහනක් පැවැත්වීම
- Online Asia Regions ආයතනයෙහි දැනුවත් කිරීමේ වැඩසටහන්වලට මාර්ගගතව සහභාගීවීම
- ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ ජාත්‍යන්තර සමුළුවට මාර්ගගතව සහභාගීවීම

**2.2.7 ස්ත්‍රීන්, තරුණ අය සහ ළමුන්ගේ වෘත්තීය අයිතිවාසිකම් ආරක්ෂා කිරීම හා ළමා ශ්‍රමය පිටු දැකීම**

වැඩබිමෙහි කාත්තා වෘත්තීය හිමිකම් ආවරණය වන කම්කරු නීතීන් ක්‍රියාත්මක කිරීම, එම නීති කාලීනව සමාලෝචනය කරමින් අවශ්‍ය සංශෝධනයන් නිර්දේශ කිරීම මඟින් ඵලදායී කාන්තා ශ්‍රම දායකත්වයක් රටට ලබාදීම කම්කරු දෙපාර්තමේන්තුවේ එක් ප්‍රමුඛ වගකීමක් වේ.

සියලු පාර්ශවකරුවන්ගේ දායකත්වය තුළින් ශ්‍රී ලංකාව තුළ ළමා ශ්‍රමය තුරන් කිරීමේ ක්‍රියාවලියේ ප්‍රමුඛ කාර්යයක් ඉටු කිරීමට කටයුතු කිරීම මෙන්ම, වයස අවුරුදු 18ට අඩු ළමුන් සඳහා වන කම්කරු නීති ක්‍රියාත්මක කිරීමත්, ස්ත්‍රීන්, තරුණ අය සහ ළමුන් සේවයේ යෙදවීම පිළිබඳ නීති රීති කාලීනව සංශෝධනය කිරීම සඳහා නිර්දේශයන් ඉදිරිපත් කරමින් ඒවා ක්‍රියාත්මක කිරීමත් මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රමුඛ වගකීමක් වේ.

**වගුව 2-10** රැකියාවක නියුතු කාන්තාවන්, තරුණ අය හා ළමුන් පිළිබඳ පවත්නා නීති ක්‍රියාත්මක කිරීම - 2021

| අනු අංකය | කාණ්ඩය | සංඛ්‍යාව | නිරීක්ෂණ |
|---|---|---|---|
| 1 | දෛනික පරීක්ෂණ | 37 | පවතින කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් කාලීන පරීක්ෂණ සිදු කිරීම අත්හිටුවා තිබුණි |
| 2 | ළමා ශ්‍රමය පිළිබඳ පරීක්ෂණ | 204 | 2021 වර්ෂයේ පැමිණිලි 126ක පරීක්ෂණ අවසන් කර ගොනු පියවන ලදී. 2019 සහ 2020 වර්ෂයන්ට අයත් පරීක්ෂණ ගොනු 14ක් ද 2021 දී පරීක්ෂණ අවසන්කර ගොනු පියවන ලදී. 2021 වර්ෂයේ ලද පැමිණිලි පරීක්ෂණ 07ක ළමා ශ්‍රමයක් අනාවරණය වී ඇති අතර ඉන් පැමිණිලි 04ක් සඳහා නඩු කටයුතු ආරම්භ කර ඇත. 2020 වර්ෂයට අදාළ නඩු ආරම්භ කළ පැමිණිලි 04ක් සඳහා 2021 වර්ෂයේ දී අධිකරණයේ නඩු පවරා ඇත. වර්ෂය තුළ නඩු 03කට අදාළ කටයුතු අවසන් කර ඇත |
| 3 | කාන්තාවන්ගේ සේවා කොන්දේසි පිළිබඳව ලැබුණු පැමිණිලි පරීක්ෂණ | 16 | 2021 වර්ෂයට අයත් පැමිණිලි 02ක පරීක්ෂණ අවසන් කර ගොනු පියවන ලදී. 2018, 2019 සහ 2020 වර්ෂයන්ට අයත් ගොනු 11ක පරීක්ෂණ අවසන් කර ගොනු පියවන ලදී. කොන්දේසි කඩවීම් සම්බන්ධයෙන් 2021 වසරේදී පැමිණිලි 11ක් සඳහා නඩු කටයුතු ආරම්භ කරන ලදී. (2020 වර්ෂයේ සිට පරීක්ෂා කරන ලද පැමිණිලි සඳහා මෙම නඩු 2021 වසරේ දී පවරන ලදී) |
| 4 | කාන්තාවන් රාත්‍රී සේවයේ යෙදවීම සඳහා අනුමැතිය ලබා දීම | 592 | දිස්ත්‍රික් කාර්යාල මඟින් අනුමැතීන් 579ක් ද උප කාර්යාල මඟින් අනුමැතීන් 13ක් ද වශයෙන් කාන්තාවන් රාත්‍රී සේවයේ යෙදවීම සඳහා අනුමැතිය ලබා දී ඇත |
| 5 | අනතුරුදායක ළමා ශ්‍රමය හා ළමා ශ්‍රමය පිළිබඳ විශේෂ කාණ්ඩායම් පරීක්ෂණ | 64 | ආයතන 318ක් පරීක්ෂා කරන ලද අතර අනතුරුදායක ළමා ශ්‍රමයක් වාර්තා නොවීය |
| 6 | කාන්තා ශ්‍රමිකයන් පිළිබඳ විශේෂ කණ්ඩායම් පරීක්ෂණ | 60 | ආයතන 302ක් පරීක්ෂා කරන ලදී. ආයතනික කොන්දේසි 30ක් කඩ කිරීම් වාර්තා වී ඇත. කොන්දේසි කඩවීම් යටතේ ආයතන 2ක් සඳහා නඩු පවරන ලදී. අනෙකුත් ආයතන 28 විසින් සුළු වැරදි මත සිදු කර ඇති කොන්දේසි කඩකිරීම් සදහා අවවාද කිරීම් කරන ලදී |
| 7 | කම්කරු නීතිය පිළිබඳව සිදුකරන ලද දැනුවත් කිරීම් | 08 | කලාප කම්කරු කාර්යාල 11 හරහා එම කලාපවලට අයත් පෞද්ගලික අංශයේ කාන්තා සේවිකාවන් 30ක පමණ කණ්ඩායම් 08ක් සඳහා කාන්තාවන් හා ළමයින් සම්බන්ධ කම්කරු නීති සම්බන්ධයෙන් දැනුවත් කිරීම් සිදු කරන ලදී |
| 8 | ධීවර ක්ෂේත්‍රය තුළ ළමා ශ්‍රමය සම්බන්ධ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම | 104 | ධීවර ක්ෂේත්‍ර බල ප්‍රදේශ ආශ්‍රිත කම්කරු කාර්යාල තෝරාගනිමින් දැනුවත් කිරීමේ වැඩසටහන් 104ක් පවත්වන ලදී. එම වැඩසටහන් මඟින් ධීවර ක්ෂේත්‍රයේ සේවක සේවිකාවන් 5,069ක් සඳහා ළමයින් සම්බන්ධ කම්කරු නීති සම්බන්ධයෙන් දැනුවත් කිරීම් සිදු කරන ලදී |

**1. අදාළ ප්‍රධාන සැමරුම් දිනයන් පැවැත්වීම සහ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම**

I. අදාළ ප්‍රධාන සැමරුම් දිනයන් පැවැත්වීම මඟින් දැනුවත් කිරීම

- **ජාත්‍යන්තර කාන්තා දිනය - 2021**

"නායකත්වයෙහි කාන්තාව" තේමාව කරගත් 2021/03/08 දිනට යෙදුන ජාත්‍යන්තර කාන්තා දිනයට සමගාමීව කම්කරු දෙපාර්තමේන්තුවේ කාන්තා දිනය සමරමින් වැඩසටහන් කිහිපයක් ගරු අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් ක්‍රියාත්මක කරන ලදී.

- කම්කරු දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා බාල දක්ෂිකා සංගමය සමඟ අත්වැල් බැඳගනිමින් බාල දක්ෂිකාවන් වෙත කම්කරු නීතිය පිළිබඳව දැනුම ලබාදීම තුළින් සමාජය දැනුවත් කිරීම සහ ඔවුන් සවිබල ගැන්වීම යන විශේෂ අරමුණු ඉලක්කකර ගනිමින් දෙපාර්ශවය අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී
- පෞද්ගලික හා අර්ධ රාජ්‍ය අංශයේ රැකියාලාභී සහ රැකියා අපේක්ෂිත පුද්ගලයන්ගේ රැකියා ජීවිතයට පිටිවහලක් වනු පිණිස උපදෙස් මාලාවක් අන්තර්ගත "රැකියා වාර්තාව" නමින් අත්පොතක් හඳුන්වාදෙන ලදී
- කම්කරු නීති, අණපනත් අතර ගැටෙමින් කාර්යාලීය ජීවිතය ගතකරන කම්කරු දෙපාර්තමේන්තුවේ නිලධාරිනියන්ගේ මානසික සුවතාවය ඉහළ නැංවීමේ අරමුණින් ප්‍රවීණ මනෝ විද්‍යා උපදේශිකා අමා දිසානායක මහත්මියගේ සම්පත් දායකත්වයෙන් කාන්තා ධාරිතා සංවර්ධන සංගීතමය වැඩසටහනක් පවත්වන ලදී
- එසේම, කටුනායක සහ කොග්ගල නේවාසිකාගාර නේවාසිකාවන් සඳහා මනෝ විද්‍යාත්මක උපදේශන හා

ඇගයුම් වැඩසටහන් පැවැත්වීමට කටයුතු කරන ලදී. ඒ අනුව, දැනට කම්කරු දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන කටුනායක නේවාසිකාගාරයේ නේවාසිකාවන් සඳහා 2021 පෙබරවාරි මස 04 වන දිනත්, දෙවන වැඩසටහන කොග්ගල නේවාසිකාගාරයේ නේවාසිකාවන් සඳහා 2021 මාර්තු මස 07 දිනත් පවත්වන ලදී

- **ජාත්‍යන්තර ළමා ශ්‍රම විරෝධී දින වැඩසටහන**

“ළමා ශ්‍රමය පිටු දැකීමේ ජාත්‍යන්තර වර්ෂය” වන 2021 වර්ෂයේ ජුනි මස 12 දිනට යෙදුන ජාත්‍යන්තර ළමා ශ්‍රම විරෝධී දිනයට සමගාමීව කම්කරු දෙපාර්තමේන්තුවේ, කාන්තා හා ළමා කටයුතු අංශය මඟින් වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කරන ලදී. ඒ අතරින් පහත විශේෂාංග ප්‍රධාන තැනක් ගන්නා ලදී.

- 2021.06.11 දින ගරු අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් ළමා ශ්‍රමය හා සම්බන්ධ නීතිමය රාමුව පිළිබඳව සමාජය තුළ පුළුල් කථිකාවතක් නිර්මාණය කිරීම හා ශ්‍රී ලංකාවේ ළමා ශ්‍රමය ශූන්‍යත්වයට පත්කිරීමේ සමාජ වගකීම පිළිබඳව මහජනතාව ඇතුළු සියලු පාර්ශවයන් දැනුවත් කිරීම සඳහා මාර්ගගත ක්‍රමය (online) ඔස්සේ වැඩමුළුවක් (Zoom තාක්ෂණය යොදාගනිමින්) පවැත්වීම

- එහිදී ළමා ශ්‍රමය සම්බන්ධ තොරතුරු රැස්කර ගැනීමේ කොටස්කරුවන් වශයෙන් මාධ්‍ය ප්‍රජාවද සම්බන්ධ කරගනිමින් ළමා ශ්‍රමය හා අනතුරුදායක ළමා ශ්‍රමය පිළිබඳව මෑතකදී සිදු කළ සංශෝධන පිළිබඳව විධිමත් අවබෝධයක් ලබා දීම

- ශ්‍රී ලංකාවේ ළමා ශ්‍රමය තුරන් කිරීමේ අභිලාශයන් සපුරා ගැනීම උදෙසා බාලදක්ෂිකා ව්‍යාපාරය සමඟ ඇති කරගත් අවබෝධතා ගිවිසුම අනුව ක්‍රියා කරමින් ළමා ශ්‍රමයට එරෙහිව ලාංඡන නිර්මාණය කිරීමේ තරඟයක් පැවැත්වීම හා එමඟින් බාලදක්ෂිකාවන්ට ළමා ශ්‍රමය පිළිබඳව පුළුල් ගවේෂණයක් සිදු කිරීමට අවස්ථාව සැලසීම

- ශ්‍රී ලංකාවේ ළමා ශ්‍රමය තුරන් කිරීමේ වැඩසටහනට ක්‍රියාකාරීව සම්බන්ධ වන හා විශේෂ කුසලතා දක්වන බාලදක්ෂිකාවන්ට ප්‍රදානය කිරීමට නියමිත ලාංඡන නිර්මාණය කිරීමට දායක වූවන්ගේ කුසලතා ඇගයීම, ප්‍රථම, දෙවන හා තෙවන ස්ථාන තේරීම හා තෝරා ගන්නා ලද ලාංඡනය එළිදැක්වීම සහ ළමා ශ්‍රමය සම්බන්ධ විශේෂ ලිපි රැසක් සහිත “කතිකාව” සඟරාව එළිදැක්වීම

- ලෝක ළමා ශ්‍රම විරෝධී දිනයට සමගාමීව ළමයින් සම්බන්ධ නීති සහ ළමයින්ගේ ආරක්ෂාව පිළිබඳ සාකච්ඡාව - 2021 ලක්විරු ගුවන් විදුලි නාලිකාවේ 2021.06.10 දින “සිත් පහන් වැට” වැඩසටහන ඔස්සේ ළමයින් සම්බන්ධ නීති සහ ළමයින්ගේ ආරක්ෂාව පිළිබඳව කාලීන සාකච්ඡාමය වැඩසටහනක් සිදු කරන ලදී

- **ලෝක ළමා දින සැමරුම**

- ගරු කම්කරු අමාත්‍යතුමාගේ ළමා දින පණිවිඩය පුවත්පත් හි පළ කිරීම
2021.10.01 දිනට යෙදී තිබූ ළමා දිනය වෙනුවෙන් “ළමා ශ්‍රමයෙන් තොර රටක් - දරුවන්ට සුරක්ෂිත හෙටක්” ලෙස කම්කරු අමාත්‍යතුමාගේ ළමා දින පණිවිඩය පුවත්පත් හි පළ කරන ලදී.

- 2021 - ලෝක ළමා දින සැමරුමට සමගාමීව “චලන රූ” කෙටි චිත්‍රපට තරඟයක් පැවැත්වීම
ලෝක ළමා දින සැමරුමට සමගාමීව “චලන රූ” කෙටි චිත්‍රපට තරඟයක් සංවිධානය කරන ලදී. සිංහල හා දමිළ මාධ්‍ය මඟින් කෙටි චිත්‍රපට තරඟය පැවැත්වූ අතර පළමු, දෙවන හා තෙවන ස්ථාන සඳහා ත්‍යාග හා සහතිකපත් ලබා දීම සිදු කරන ලදී.

- 2021- ලෝක ළමා දිනට සමගාමීව ළමයින් සම්බන්ධ නීති සහ ළමයින්ගේ ආරක්ෂාව පිළිබඳ පුවත්පත් සාකච්ඡාව
2021.09.27 දිනැති “නවලිය” පුවත්පත වෙත ළමයින් සම්බන්ධ නීති සහ ළමයින්ගේ ආරක්ෂාව පිළිබඳව කාන්තා



හා ළමා කටයුතු අංශයේ කම්කරු කොමසාරිස් විසින් සාකච්ඡාවක් ලබා දෙන ලදී. එහි දී ළමා ශ්‍රමය සම්බන්ධ කම්කරු නීති අණපනත් සම්බන්ධයෙන් ජනතාව දැනුවත් කිරීම සහ පුද්ගලයකු සේවයේ යෙදවිය හැකි අවම වයස් සීමාව ලෙස පැවති වයස අවුරුදු 14 සීමාව වයස අවුරුදු 16 දක්වා ඉහළ දැමීම සම්බන්ධ පනත සංශෝධනය 2021.01.18 වන දින පාර්ලිමේන්තුවේදී සම්මත වීම යන කරුණු ඉදිරිපත් කරන ලදී

- **2021 - ලෝක ළමා දිනට සමගාමීව ළමයින් සම්බන්ධ නීති සහ ළමයින්ගේ රක්ෂාව පිළිබඳ මාධ්‍ය සාකච්ඡාව**

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ 2021.09.30 දින “අනේකවිධ උවදුරුවලින් දරුවා රැකගනිමු” යන තේමාව පෙරටු කර ගනිමින් රජයේ මාධ්‍ය සාකච්ඡාවක් කම්කරු කොමසාරිස් ජනරාල්ගේ සහභාගීත්වයෙන් පවත්වන ලදී

## 2. ශ්‍රී ලංකාවේ ළමා ශ්‍රමය තුරන් කිරීමේ අරමුණ පෙරදැරිව සිදු කළ වැඩසටහන්

- **ළමා ශ්‍රමය තුරන් කිරීම අරමුණු කර ගනිමින් තේමා ගීතයක් නිර්මාණය කිරීම**

2021 ළමා ශ්‍රමය තුරන් කිරීමේ ජාත්‍යන්තර වර්ෂය නිමිත්තෙන් තේමා ගීතයක් එළිදැක්වීම 2021.12.14 දින පැවති විශේෂ වැඩසටහනේ දී කම්කරු අමාත්‍ය ගරු නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමාගේ සහභාගීත්වයෙන් සිදු කරන ලදී. මෙම තේමා ගීතය පද රචනය ආචාර්ය රත්න ශ්‍රී විජේසිංහ මහතා, තනුව සහ සංගීත නිර්මාණය ආචාර්ය රෝහණ වීරසිංහ මහතා විසින් සිදු කරන ලද අතර ගීත ගායනය දෙරණ ඩ්‍රීම්ස්ටාර් ගායක ගායිකාවන් සය දෙනකුගේ සහභාගීත්වයෙන් සිදු කරන ලදී (තේමා ගීතයේ YouTube දිගුව - https://youtu.be/pgBULzDz2ks වේ).

- **ළමා ශ්‍රමය තුරන් කිරීමට අදාළව ස්ටිකරයක් හා පෝස්ටරයක් නිර්මාණය කිරීම**

ළමා ශ්‍රමය තුරන් කිරීමට අදාළව සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරී කාර්යාල සහ සියලුම කම්කරු කාර්යාල තුළ ප්‍රදර්ශනය කිරීම උදෙසා සංශෝධිත නව නීති අණපනත් සහිත පෝස්ටර් නිර්මාණය කරන ලද අතර ප්‍රාදේශීය කම්කරු කාර්යාල හරහා එම පෝස්ටර් බෙදා හැරීමේ කටයුතු සිදු කරන ලදී.

එසේම, ළමා ශ්‍රමය තුරන් කිරීම අරමුණු කරගනිමින් වයස් සංශෝධනය පිළිබඳව සහ නීති විරෝධී ලෙස ළමයින් සේවයේ යෙදවීමට අදාළ දඬුවම් පිළිබඳවද සමාජය දැනුවත් කිරීම සඳහා ලං.ග.ම. බස් රථවල, දුම්රිය ස්ථානවල සහ පාසල්වල ප්‍රදර්ශනය කිරීම උදෙසා ස්ටිකරයක් නිර්මාණය කර මුද්‍රණය කරන ලදී.

- **ළමා ශ්‍රමය තුරන් කිරීම අරමුණු කර ගනිමින් පාසල් දරුවන්ගේ දැනුවත්භාවය උදෙසා “අත්තටු” සඟරාව නිර්මාණය කිරීම**

“ළමා ශ්‍රමය තුරන් කිරීමේ ජාත්‍යන්තර වර්ෂය 2021” වෙනුවෙන් පාසල් දරුවන්ගේ දැනුවත්භාවය උදෙසා නිර්මාණය කරන ලද “අත්තටු” සඟරාව පිටපත් 5000ක් මුද්‍රණය කර 2021.12.14 දින පැවති විශේෂ උත්සවයේ දී එළිදැක්වීම සිදු කරන ලදී. මෙම සඟරාව පාසල් පුස්තකාල වෙත ලබා දීම උදෙසා දිස්ත්‍රික් කම්කරු කාර්යාල වෙත බෙදා හැරීම සිදු කරන ලදී.

## 3. ළමා ශ්‍රමය තුරන් කිරීම පිළිබඳ ජාතික මෙහෙයුම් කමිටුව - 2021

2025 වර්ෂය වන විට ශ්‍රී ලංකාවේ ළමා ශ්‍රමය තුරන් කිරීමට ශ්‍රී ලංකා රජය ප්‍රතිඥා දී ඇති අතර රජයේ ආයතන කිහිපයක් මේ සඳහා කටයුතු කරමින් සිටී. එබැවින් ළමා ශ්‍රමය හා අනතුරුදායක ළමා ශ්‍රමය තුරන් කිරීම සඳහා ගනු ලබන සාමූහික ප්‍රයත්නයන් තවදුරටත් ශක්තිමත් කිරීම අත්‍යවශ්‍ය වේ. ළමා ශ්‍රමය තුරන් කිරීම පිළිබඳ ජාතික මෙහෙයුම් කමිටුව (NSC) පිහිටුවන ලද්දේ අදාළ පාර්ශවකරුවන් මෙම ඉලක්ක සාමූහිකත්වයෙන් සාක්ෂාත් කර ගැනීම සඳහා කටයුතු කිරීම සහතික කිරීම සඳහාය.

මෙම කමිටුව 2021.03.02 දින විවිධ ආයතන නියෝජනය කරමින් නිලධාරීන් 26 දෙනෙකුගේ සහභාගීත්වයෙන් කම්කරු දෙපාර්තමේන්තුවේ

සිවිවන මහළ ශ්‍රවණාගාරයේදී පවත්වන ලදී. එදින යෝජනා කරගන්නා ලද පරිදි තාක්ෂණික කමිටුව විවිධ ආයතනවල නිලධාරීන් 16 දෙනෙකුගේ සහභාගීත්වයෙන් 2021.04.07 දින කම්කරු දෙපාර්තමේන්තුවේ සිවිවන මහළ ශ්‍රවණාගාරයේ දී පවත්වන ලදී.

**4. සමාලෝචිත කාලය තුළ, වෙනත් ආයතන මගින් කාන්තාවන්, තරුණ අය සහ ළමුන්ගේ සුරක්ෂිතතාවය වෙනුවෙන් කරන ලද කාර්යයන්හිදී සහය වීම්**

- පවත්නා කොවිඩ්-19 වසංගත තත්වය යටතේ වුවද කම්කරු දෙපාර්තමේන්තු නිලධාරීන්, රටපුරා පැවති දිස්ත්‍රික් / ප්‍රාදේශීය ළමා සංවර්ධන කමිටු රැස්වීම් 28ක් සඳහා සහභාගි වූ අතර, එහිදී කමිටු සාමාජිකයන් "ළමා ශ්‍රමය" සම්බන්ධයෙන් දැනුවත් කිරීම් සිදු කරන ලදී. තවද 2021 ළමා ශ්‍රමය තුරන් කිරීමේ ජාත්‍යන්තර වර්ෂය සම්බන්ධව සියලුම දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම්වරුන් දැනුවත් කර ඇති අතර ඒ සඳහා ද ප්‍රධානත්වය දෙමින් මෙම වැඩසටහන් සිදු කිරීමට කටයුතු කරන අතර කොළඹ දිස්ත්‍රික්කයට අයත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල සමඟ සම්බන්ධ වෙමින් කාන්තා හා ළමා කටයුතු අංශයේ කම්කරු නිලධාරීන් විසින් රැස්වීම් දෙකක් ද පවත්වන ලදී
- ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් පවත්වන ලද කැපකරු මාපිය ප්‍රතිපත්තිය පිළිබඳ කමිටු රැස්වීමක් zoom තාක්ෂණය ඔස්සේ 2021.08.24 වන දින පවත්වන ලද අතර එහි පාර්ශවකරුවන් ලෙස කම්කරු දෙපාර්තමේන්තුවේ සහභාගීත්වය ලබා දෙන ලදී
- ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් පවත්වන ලද "ශ්‍රී ලංකාවේ ළමා දිවා සුරැකුම් පහසුකම් පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය" පිළිබඳ සාකච්ඡාවක් zoom තාක්ෂණය ඔස්සේ 2021.09.28 වන දින පවත්වන ලදී. එහි පාර්ශවකරුවන් ලෙස කම්කරු දෙපාර්තමේන්තුවේ සහභාගීත්වය ලබා දෙන ලදී
- 8.7 සන්ධානයට (8.7 Alliance) අදාළව 2021 ළමා ශ්‍රමය තුරන් කිරීමේ ජාත්‍යන්තර වර්ෂය පෙරදැරි කරගනිමින් අනුගාමික රටක් වශයෙන් ක්‍රියාකාරී ප්‍රතිඥාවක් ලෙසට අනතුරුදායක රැකියා ලැයිස්තුව සංශෝධනය කිරීමට 2021.01.26 දින එකඟතාව ලබා දෙන ලදී. මේ සම්බන්ධව මාර්ගගත ක්‍රමය ඔස්සේ පැවති වැඩමුළු සඳහා කම්කරු දෙපාර්තමේන්තුව සහභාගි විය
- ළමා ශ්‍රමය තුරන් කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා බාලදක්ෂිකා සංගමයේ බාලදක්ෂිකාවන් සහ කොමසාරිස්වරියන් වෙත දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන් පවත්වන ලදී. මෙම වැඩසටහන සැසි 4ක් ලෙස 2021.11.28, 2021.12.04, 2021.12.11/12 යන දිනවලදී zoom තාක්ෂණය ඔස්සේ පවත්වන ලදී

**5. අත්පත්‍රිකා මුද්‍රණය**

කම්කරු නීති අණපනත් අනුව බාල වයස්කාර ළමුන් සේවයේ යෙදවීම වැළැක්වීම උදෙසා වයස අවුරුදු 14 සීමාව වයස අවුරුදු 16 දක්වා සහ අනතුරුදායක රැකියා සඳහා වයස අවුරුදු 16 සීමාව 18 දක්වාත් ඉහළ දැමීම සම්බන්ධව සිදු කරන ලද වයස් සංශෝධනය සම්බන්ධව අත්පත්‍රිකාවක් සිංහල, ඉංග්‍රීසි සහ දමිළ මාධ්‍යයන්ගෙන් මුද්‍රණය කර ප්‍රාදේශීය කාර්යාල හරහා බෙදාහැරීම සහ විශේෂ වැඩසටහන්වලදී බෙදාහැරීමේ කටයුතු සිදු කිරීමට කටයුතු යොදා ඇත

වයස අවුරුදු 18ට අඩු කිසිම තැනැත්තෙකු යෙදවිය නොහැකි අන්තරායකාරී රැකියා 51ක ප්‍රමාණය රැකියා 71ක් දක්වා වැඩි කිරීම සම්බන්ධව එම නව රැකියා පිළිබඳ මහජනතාව දැනුවත් කිරීම උදෙසා සිංහල, ඉංග්‍රීසි සහ දමිළ මාධ්‍යන්ගෙන් අත්පත්‍රිකා නිර්මාණය කර මුද්‍රණය කරන ලදී. එම අත්පත්‍රිකා ප්‍රාදේශීය කාර්යාල හරහා බෙදාහැරීම සඳහා කටයුතු සිදු කරන ලදී.

- **අනතුරුදායක රැකියා 71 ලැයිස්තුව පිළිබඳ පුවත්පත් ලිපි පළ කිරීම**

නව රැකියා පිළිබඳ මහජනතාව දැනුවත් කිරීම උදෙසා කම්කරු අමාත්‍ය ගරු නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමාගේ පණිවිඩය සමඟ නව රැකියා 71ක ලැයිස්තුව ජනප්‍රිය පුවත්පත් වන දිනමිණ, තිනකරන්, ඩේලිනිව්ස්, දිවයින සහ ලංකාදීප යන පුවත්පත් පහක පළ කරන ලදී.

**6. නීති සංශෝධනය**

කාන්තාවන්, තරුණ අය සහ ළමුන්ගේ සුරක්ෂිතතාවය වෙනුවෙන් පවතින අදාළ නීති සංශෝධනය සහ නව නීති හඳුන්වා දීම සඳහා අවශ්‍ය නිර්ක්ෂණ හා යෝජනා ලබා දීමෙන් කම්කරු අමාත්‍යාංශයට සහාය වීම

**7. අනෙකුත් විශේෂ වැඩසටහන්**

- **2021 "ළමා ශ්‍රමය තුරන් කිරීමේ ජාත්‍යන්තර වසර" වෙනුවෙන් විශේෂ වැඩසටහන - 2021.12.14**

2021 "ළමා ශ්‍රමය තුරන් කිරීමේ ජාත්‍යන්තර වසර" වෙනුවෙන් විශේෂ වැඩසටහනක් ගරු කම්කරු අමාත්‍යතුමාගේ අනුග්‍රහයෙන් සංවිධානය කරන ලදී.

කම්කරු අමාත්‍ය ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා, කම්කරු අමාත්‍යාංශයේ ලේකම් සහ කම්කරු කොමසාරිස් ජනරාල් ඇතුළු සම්භාවනීය ආරාධිත අමුත්තන්ගේ සහභාගීත්වයෙන් ළමා ශ්‍රමය තුරන් කිරීම පිළිබඳ ජාතික මෙහෙයුම් කමිටුවේ පාර්ශවකරුවන්ගේ සහ කම්කරු දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ සහ අදාළ සියලුම පාර්ශ්වයන්ගේ අවම භෞතික සහභාගීත්වය සහ මාර්ගගත ක්‍රමය ඔස්සේ සහභාගීත්වය ඇතිව මෙම වැඩසටහන 2021 දෙසැම්බර් 14 වැනි දින පවත්වන ලදී.

"චලන රූ" කෙටි චිත්‍රපට තරඟයේ ජයග්‍රාහකයන්ට ත්‍යාග මුදල්, කුසලාන සහ සහතිකපත් ප්‍රදානය කරන ලද අතර ශ්‍රී ලංකා බාලදක්ෂිකා ව්‍යාපාරයේ ලාංඡන නිර්මාණ තරඟයේ ජයග්‍රාහකයන්ට පදක්කම් සහ සහතිකපත්‍ර ප්‍රදානය කරන ලදී. ළමා ශ්‍රමය සම්බන්ධ තේමා ගීතයක් එළිදැක්වීම, ළමා ශ්‍රමය තුරන් කිරීම පිළිබඳ අත්පොත් එළිදැක්වීම සහ මැලිබන් බිස්කට් පුද්ගලික සමාගම සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීම එහි දී සිදු කරන ලදී.

- **ළමයින් සම්බන්ධ නීති සහ ළමයින්ගේ ආරක්ෂාව පිළිබඳ සාකච්ඡාව - 2021**

TV 1 රූපවාහිනි නාලිකාවේ 2021.01.20 දින "සටන" වැඩසටහන ඔස්සේ ළමයින් සම්බන්ධ නීති සහ ළමයින්ගේ ආරක්ෂාව පිළිබඳව සාකච්ඡා කරන ලදී. එම වැඩසටහනට කම්කරු දෙපාර්තමේන්තුවේ කාන්තා හා ළමා කටයුතු අංශයේ කම්කරු කොමසාරිස් සහභාගී විය

- කාන්තාවන්ගේ වැඩපරිසරය සහ ලිංගික හිංසනය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහනක් 2021.02.12 වන දින නුන්ගමුගොඩ පාර, කැළණිය යන ලිපිනයේ පිහිටි ප්‍රින්ට් කෙයාර් ආයතනයේ සේවක සේවිකාවන් සඳහා එම ආයතන භූමියේදී සිදු කරන ලදී
- කම්කරු නීතිය කාන්තාවන්ගේ ආර්ථිකයට හිතකාමීද යන මාතෘකාව යටතේ 2021.03.05 දින පැවති සාකච්ඡාව සඳහා දෙපාර්තමේන්තුවේ සහභාගීත්වය ලබා දෙන ලදී

**2.2.8 සේවකයන්ගේ සමාජ ආරක්ෂණය**

ශ්‍රී ලංකාවේ පෞද්ගලික අංශයේ සහ අර්ධ රාජ්‍ය අංශයේ සේවයේ යෙදෙන සේවකයන් හට යහපත් ආර්ථික තත්ත්වයක් සහිත විශ්‍රාම දිවියක් උරුම කරදීමේ මූලික පරමාර්ථය පෙරදැරි කරගෙන 1958 අංක 15 දරණ සේවක අර්ථසාධක අරමුදල් පනත මගින් සේවක අර්ථසාධක අරමුදල ස්ථාපිත කර ඇත. මෙම අරමුදලෙහි පරිපාලන කටයුතු කම්කරු දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබන අතර, එහි අරමුදල් කළමනාකරණය පිළිබඳ වගකීම ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් දරනු ලැබේ. 2021.09.30 දිනට මෙම අරමුදලෙහි වටිනාකම රුපියල් මිලියන 2,540,438ක් වන අතර, අරමුදලේ සමස්ත සාමාජික ගිණුම් සංඛ්‍යාව මිලියන 19කි.

**I. සේවක අර්ථසාධක අරමුදල සඳහා සේවා ආයතන ලියාපදිංචි කිරීම**

සේවක අර්ථසාධක අරමුදල් පනත යටතේ ආවරණය වන සියලුම සේව්‍යයන් අරමුදලේ ලියාපදිංචි විය යුතුය. ඒ අනුව, 2021 වර්ෂය තුළ ලියාපදිංචි වූ සේවායෝජක සංඛ්‍යාව 2,407කි. 2021 වර්ෂය තුළ අරමුදල වෙත දායක මුදල් බැර කර ඇති සක්‍රීය සේවායෝජක සංඛ්‍යාව 84,874කි. වර්ෂය තුළ අරමුදලට බැර වූ දායක මුදල රුපියල් මිලියන 99,587ක් වේ.

## II. සේවක අර්ථසාධක අරමුදල සඳහා සාමාජිකයන් ලියාපදිංචි කිරීම

සේවක අර්ථසාධක අරමුදල් පනත මඟින් ආවරණය වන සියලු සේවකයින් වෙත සාමාජික අංක ලබා දී ඔවුන් අරමුදලේ ලියාපදිංචි කරවීම සේවායෝජකගේ වගකීම වන අතර එය අධීක්ෂණය කම්කරු දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලැබේ. ඒ අනුව, 2021 වර්ෂය තුළදී දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වූ සාමාජික සංඛ්‍යාව 314,058ක් වේ. එසේම, මේ වන විට සක්‍රීය සාමාජික ගිණුම් මිලියන 2.5ක් පවතී.

දායක මුදල් ගෙවීම පැහැර හරින සේවායෝජකයන්ගෙන් එම මුදල් අයකර ගැනීම සඳහා ප්‍රථම නිවේදන හා රතු නිවේදන නිකුත් කෙරෙන අතර ඒ සඳහා ප්‍රතිචාර නොදක්වන්නේ නම් නීති මඟින් කටයුතු කර එම දායක මුදල් හා අධිභාර අයකර ගිණුම් ගත කිරීමට ක්‍රියා කරනු ලැබේ. 2021 වර්ෂයේ දී එවැනි ප්‍රථම නිවේදන 8,491 නිකුත් කිරීම මඟින් රුපියල් මිලියන 4,242ක මුදලක්ද, රතු නිවේදන 7,858ක් නිකුත් කිරීම මඟින් රුපියල් මිලියන 4,198ක මුදලක්ද අයකර ගෙන ඇත.

## III. සේවක අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභ ගෙවීම

2021 වර්ෂයේදී සේවක අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභ ලැබූ සංඛ්‍යාව පහත පරිදි වේ.

**වගුව 2-11** සේවක අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභ ලැබූ සංඛ්‍යාව - 2021

| ප්‍රතිලාභයේ ස්වභාවය | ප්‍රතිලාභ ලැබූ සංඛ්‍යාව |
|---|---|
| සාමාන්‍ය ප්‍රතිලාභ ගෙවීම් | 95,474 |
| මියගිය සාමාජික ප්‍රතිලාභ ගෙවීම් | 4,607 |
| 30% පූර්ව ප්‍රතිලාභ ගෙවීම් | 16,015 |

## IV. අනුමත අර්ථසාධක අරමුදල් අධීක්ෂණය

2021 දෙසැම්බර් 31 දිනට සේවක අර්ථසාධක අරමුදල යටතේ අනුමත අර්ථසාධක අරමුදල් පවතින ආයතන 117ක් ලියාපදිංචිව ඇත. එම අරමුදල්වල දායක මුදල් බැර කිරීම, ප්‍රතිලාභ ගෙවීම ඇතුළුව ක්‍රියාකාරිත්වය අධීක්ෂණය කිරීම කම්කරු දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබන අතර නිසි ලෙස ක්‍රියාත්මක නොවන අරමුදල් කම්කරු කොමසාරිස් ජනරාල් යටතට පවරා ගනු ලැබේ.

**වගුව 2-12** අනුමත අර්ථසාධක අරමුදල් අධීක්ෂණ ප්‍රගතිය - 2021

| කරුණ | සංඛ්‍යාව |
|---|---|
| ලැබී ඇති පැමිණිලි | 41 |
| විසඳා ගොනු පියවා ඇති පැමිණිලි | 35 |
| ක්ෂේත්‍ර නිලධරයන් විසින් අධීක්ෂණය කරන ලද පු.අ.අ. සම්බන්ධ වාර්තා | 81 |
| අධීක්ෂණය සිදු කොට ඇති ආයතන | 88 |

## V. අරමුදල මඟින් සාමාජිකයන් වෙත ලබාදී ඇති ප්‍රතිලාභ

- **සේවක අර්ථසාධක අරමුදලෙහි සාමාජික ගිණුම් ශේෂය ඇපයට තබා නිවාස ණය ලබාදීම**

සාමාජිකයන්ගේ ජීවන තත්ත්වය උසස් කිරීමේ අරමුණින් සේවක අර්ථසාධක අරමුදල් සාමාජික ගිණුම් ශේෂය ඇපයට තබා 75%ක උපරිමයක් දක්වා නිවාස ණය ලබා ගැනීමේ පහසුකම සලසා ඇත. ඒ අනුව, 2021 වර්ෂය තුළ නිවාස ණය අයදුම්පත් 6,792ක් සඳහා අනුමැතිය ලබා දී ඇත. අනුමැතිය ලබා දී ඇති මුදල රු. බිලියන 3.8කි.

- **ජංගම සේවා වැඩසටහන් පැවැත්වීම**

සේවක අර්ථසාධක අරමුදල සම්බන්ධයෙන් සේවා ලබා දීම උදෙසා ජංගම සේවා වැඩසටහනක් 2021.12.18 දින නුවරඑළිය ලබුකැලේ වත්තහිදී පවත්වන ලදී. එමඟින් ප්‍රතිලාභ ලැබූ සංඛ්‍යාව 518කි.

ප්‍රධාන කාර්යාලය විසින් ලබා දුන් සේවා ප්‍රාදේශීය කාර්යාල දක්වා විමධ්‍යගත කිරීම තුළින් සාමාජිකයන් වෙත පෙරට වැඩි පහසුකම් සලසා ඇත.

කොවිඩ් 19 වසංගත තත්ත්වය හමුවේ සේවක අර්ථසාධක අරමුදලේ සේවාවන් සේවාලාභීන් වෙත අඛණ්ඩව සැපයීම සඳහා දුරකථන මාර්ග ඔස්සේ සේවා උපදෙස් ලබා දීම, අන්තර්ජාලය හරහා දිනයක් වේලාවක් ලබා දීමෙන් ප්‍රතිලාභ අයදුම්පත් භාරගැනීම ඇතුළු සේවාවන් සපයන ලදී.


සේවක අර්ථසාධක අරමුදල් ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් සේවක අර්ථසාධක අරමුදල සම්බන්ධයෙන් සාමාජිකයන් දැනුවත් කිරීම සඳහා දෙපාර්තමේන්තු නිල යූ ටියුබ් චැනලය වෙත ඇතුලත් කිරීම සඳහා වීඩියෝපට සකස් කරමින් පවතී. එසේම, සේවක අර්ථසාධක අරමුදල් ප්‍රවර්ධනාත්මක රූපවාහිනී දැන්වීමක්ද නිර්මාණය කර ඇති අතර එය ප්‍රචාරය කිරීම සඳහා ඉදිරි කටයුතු සිදු කරමින් පවතී.

## 2.2.9 සේවකයන්ගේ වෘත්තීය අයිතිවාසිකම් සුරැකීම සඳහා නෛතික රැකවරණය

සේවකයන්ගේ වෘත්තීය අයිතිවාසිකම් ආරක්ෂා කර දීම සඳහා කම්කරු දෙපාර්තමේන්තුව විසින් විවිධ පනත් ගණනාවක් ක්‍රියාත්මක කරනු ලබයි. ඒ අනුව, කම්කරු දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාවට නැංවිය යුතු එම අණපනත්හි ප්‍රතිපාදන දිවයින පුරා ඒකාකාරීව ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා එම නීති උල්ලංඝනය කරන්නන්ට එරෙහිව අධිකරණ ක්‍රියාමාර්ග ගැනීමත් ඒ තුළින් සේව්‍ය-සේවක අයිතීන් සුරක්ෂිත කරමින් සේව්‍ය-සේවක සහයෝගීතාවය වර්ධනය කිරීම දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබයි. ඒ අනුව, 2021 වර්ෂයේදී කම්කරු දෙපාර්තමේන්තුවේ නෛතික ක්‍රියාකාරකම්වල ප්‍රගතිය පහත පරිදි වේ

**වගුව 2-13** අධිකරණ අනුව නඩුවල කාර්යසාධනය - 2021

| අධිකරණය | 2021 වර්ෂයට ඉදිරියට ගෙන ආ ශේෂය | 2021 වර්ෂය තුළ ආරම්භ කරන ලද නඩු | 2021 වර්ෂය තුළ අවසන් කරන ලද නඩු | උපදෙස් ලිපි හා උපදෙස් ගොනු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| ශ්‍රේෂ්ඨාධිකරණය | 124 | 14 | 19 | |
| අභියාචනාධිකරණය | 160 | 132 | 12 | |
| මහාධිකරණය | 97 | 33 | 20 | |
| දිස්ත්‍රික් අධිකරණය / වාණිජ්‍ය මහාධිකරණය | 277 | 3 | 0 | |
| මහේස්ත්‍රාත් අධිකරණය | 93 | 170 | 154 | 77 |
| **එකතුව** | **751** | **352** | **205** | **77** |




**ප්‍රස්තාරය 2-3** දිස්ත්‍රික් හා උප කම්කරු කාර්යාල මඟින් පවරන ලද නඩු සහ විසඳී ඇති නඩු - 2021

කම්කරු දෙපාර්තමේන්තුවේ නීති ක්‍රියා අංශයට ලැබුණු අක්‍රීය නඩු සංඛ්‍යාව 5,151 සහ මූල්‍ය වටිනාකම රු. 3,108,693,249.34 වන අතර විවෘත වරෙන්තු නඩු සංඛ්‍යාව 2,822ක් වන අතර මූල්‍ය වටිනාකම රු. 879,249,209.85ක් විය. එම නඩු සක්‍රීය කිරීම සම්බන්ධයෙන් පහත පියවර ගන්නා ලදී.

- විදේශගත සේවායෝජකයන් සම්බන්ධව විවෘත වරෙන්තු නිකුත් කර ඇති විට ගුවන්තොටුපළ පොලීසිය දැනුවත් කිරීම හා ලිපින ඇති අවස්ථාවලදී විදේශයට සිතාසි යොමු කිරීම
- විවෘත වරෙන්තු වූ නඩු සම්බන්ධයෙන් නියෝජ්‍ය කම්කරු කොමසාරිස් වෙතින් නැවත එම වරෙන්තුවල පිටපත් ගෙන්වා ගැනීම හා ඒවා නියෝජ්‍ය පොලිස්පති වෙත යොමු කර කඩිනමින් ක්‍රියාත්මක කරවා ගැනීමට පියවර ගැනීම
- විවෘත වරෙන්තු නඩු සක්‍රීය කිරීම හා අක්‍රීය නඩු සක්‍රීය කිරීමට අවශ්‍ය උපදෙස් Check list වශයෙන් සකස්කර කලාප කාර්යාල හා දිස්ත්‍රික් කාර්යාල සඳහා යොමු කිරීම



පහත සඳහන් පරිදි නීති සංශෝධන සහ නව නීති සම්පාදනය සඳහා කම්කරු අමාත්‍යාංශයට සහාය වීම

- නව පනත් සහ රෙගුලාසි කෙටුම්පත් කිරීම
- වත්මන් නීතිමය තත්ත්වය විශ්ලේෂණය කිරීම සහ අදාළ නිරීක්ෂණ සැපයීම
- වත්මන් තත්ත්වය සහ අවශ්‍යතාව අධ්‍යයනය කිරීමෙන් පසු නව නීති සම්පාදනය සඳහා නිරීක්ෂණ සැපයීම

**2.2.10 සේවා සැපයීම සඳහා තොරතුරු තාක්ෂණය භාවිතා කිරීම**

සේවාලාභීන්ට කාර්යක්ෂම සේවයක් ලබා දීම අරමුණු කර ගනිමින් තොරතුරු තාක්ෂණය භාවිතයෙන් සේවාවන් ලබාදීමේ පහසුකම් වැඩි දියුණු කිරීම කෙරෙහි කම්කරු දෙපාර්තමේන්තුව දැඩි අවධානය යොමු කර ඇත. මේ වන විට දෙපාර්තමේන්තුව විසින් සේවක අර්ථසාධක අරමුදලේ අධීක්ෂණ පද්ධතිය, ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවක අර්ථසාධක අරමුදලේ පරිගණක දත්ත පද්ධතිය සමඟ සම්බන්ධ කර ක්‍රියාත්මකව පවතී.

එසේම, දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර සන්නිවේදන කටයුතු සඳහා ස්ලැක් යෙදවුම (Slack Application) 2020 වර්ෂයේදී හඳුන්වාදෙන ලද අතර මෙමඟින් අභ්‍යන්තර සන්නිවේදන කටයුතු ක්ෂණිකව හා කඩදාසි භාවිතය අවම කරමින් සිදු කිරීමට හැකියාව ලැබී අතර නිලධාරීන් විසින් නිවසේ සිට රාජකාරි ඉටු කරන අවස්ථාවන්හිදී එම කටයුතු කාර්යක්ෂම ලෙස සිදු කිරීමටද හැකියාව ලැබී ඇත.

මේ හැරුණු කොට මහජනතාවට සේවා ලබා ගැනීමට අවශ්‍ය අයදුම්පත්, ආකෘති හා කම්කරු අණපනත්, සේවායෝජකයින් විසින් අවධානය යොමු කළ යුතු පඩි පාලක සභා තීරණ ආදී අවශ්‍ය ලේඛන බාගත කරගත හැකි පරිදි දෙපාර්තමේන්තු වෙබ් අඩවියෙහි පළ කර ඇති අතර එම තොරතුරු නිරන්තරයෙන් යාවත්කාලීන කිරීමට කටයුතු කරනු ලැබේ. එසේම, දෙපාර්තමේන්තුව විසින් නිල යූටියුබ් චැනලයක්, ෆේස් බුක් පිටුවක් සහ ට්විටර් ගිණුමක් පවත්වාගෙන යමින් යාවත්කාලීනව තොරතුරු මහජනතාව වෙත ලබා දීමට කටයුතු කරනු ලැබේ.

ඒ අනුව, 2021 වසරේදී වෙබ් අඩවිය, ස්ලැක් යෙදවුම, ෆේස්බුක් පිටුව, ට්විටර් ගිණුම සහ යූ ටියුබ් චැනලය හරහා කම්කරු දෙපාර්තමේන්තුව විසින් සපයන ලද සේවා පහත පරිදි වේ.

- සියලුම ආකෘති පත්‍ර (ආරක්ෂක සේවා සඳහා නිෂ්කාශන සහතිකය සඳහා ඉල්ලුම් පත්‍ර ඇතුළුව)
- සංඛ්‍යාලේඛන තොරතුරු (කම්කරු සංඛ්‍යාති, වාර්ෂික රැකී රක්ෂා සමීක්ෂණ, වාර්ෂික වාර්තා, කොවිඩ් - 19 සමීක්ෂණ වාර්තා වැනි)
- සියලුම පරිපාලන තොරතුරු
- සේවක අර්ථසාධක අරමුදලේ සජීවී ප්‍රතිලාභ ගෙවීමට අදාළව අයදුම්පත්‍ර භාරදීම සඳහා මාර්ගගත ක්‍රමය ඔස්සේ වේලාවක් වෙන්කර ගැනීම
- කාන්තාවන් රාත්‍රී සේවයේ යෙදවීම සඳහා අනුමැතිය ලබාගැනීමේ අයදුම් පත්‍රය මාර්ගගත ක්‍රමය ඔස්සේ යොමු කිරීම
- කතිකාව, Prime Work, අත්තටු ආදී සඟරාවන් ඊ-පුස්තක ලෙස එළි දැක්වීම
- කොවිඩ් - 19 වසංගතය හේතුවෙන් නිවසේ සිට වැඩ කිරීමේ ක්‍රමය යටතේ රාජකාරි ඉටු කිරීමේදී දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර සන්නිවේදන මාධ්‍යයක් ලෙස SLACK යෙදුම භාවිතා කිරීම
- YouTube නාලිකාව, Facebook සහ Twitter හරහා යාවත්කාලීන තොරතුරු සැපයීම

**2.2.11 වඩා හොඳ කාර්මික සබඳතා සඳහා ත්‍රෛපාර්ශ්වීය හවුල්කරුවන් දැනුවත් කිරීම**

**කම්කරු නීතිය, කාර්මික සබඳතා සහ මානව සම්පත් සංවර්ධනය පිළිබඳ අධ්‍යාපනය**

**ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය** (NILS) කම්කරුවන්ගේ දැනුම, ආකල්ප සහ කුසලතා වර්ධනය සඳහා කම්කරු නීති, කාර්මික සබඳතා සහ මානව සම්පත් කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලා පවත්වයි. පෞද්ගලික අංශයේ හා අර්ධ රාජ්‍ය


ආයතනයන්හි සේවකයන්, සේව්‍යයන්, වෘත්තීය සමිති නායකයන් වැනි නිලධාරීන්ගේ ධාරිතා වර්ධනය සඳහා අවශ්‍ය වන අධ්‍යාපන සහ පුහුණු අවස්ථා ආයතනය මඟින් ක්‍රියාත්මක කර ඇත. මීට අමතරව, ආයතනය කෙටි කාලීන පාඨමාලා සහ ශ්‍රම අධ්‍යයනය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලා පවත්වනු ලබයි.

**1. 2021.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය**

**වගුව 2-14** ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ මූල්‍ය ප්‍රගතිය


| | ඇස්තමේන්තුගත වියදම (රු.) 000' | 2021.12.31 දිනට සත්‍ය වියදම (රු.) 000' |
|---|---|---|
| ආදායම් | 31,300 | 28,489 |
| NILS ඉපැයීම් | | |
| පුහුණු වැඩසටහන් | 20,975 | 18,730 |
| විභාග | 8,000 | 7,226 |
| ආයෝජන ආදායම් | 2,325 | 2,533 |
| භාණ්ඩාගාර ප්‍රතිපාදන | 11,000 | |
| පුනරාවර්තන | 10,000 | 10,000 |
| ප්‍රාග්ධන | 1,000 | 1,000 |
| මුළු ආදායම | 42,300 | 38,489 |
| වියදම | 35,937 | 25,195 |
| **අතිරික්තය / හිඟය** | **6,363** | **3,294** |

**2 2021 වර්ෂය තුළ පුහුණු කටයුතුවල දළ ආදායම**




**ප්‍රස්තාරය 2-4** ජා. ශ්‍ර. අ. ආ. විසින් 2021 වර්ෂය තුළ පුහුණු කටයුතුවලින් ලද ආදායම

**3. පවත්වනු ලැබූ පාඨමාලා අනුව පුහුණු කටයුතුවල ආදායම**




**ප්‍රස්තාරය 2-5** පුහුණු ක්‍රියාකාරකම්වලින් ලැබෙන ආදායම - ජා. ශ්‍ර. අ. ආ.


**4. ව්‍යාපෘති, පර්යේෂණ හා ප්‍රකාශන**

2021 වසරේ මාර්තු මස 15 වන දින "Women at Work" නමින් පර්යේෂණ සම්මන්ත්‍රණය මාර්ගගත ක්‍රමය ඔස්සේ ඉතා සාර්ථකව සංවිධානය කර පැවතුනි. එහිදී අවසානයට තේරී පත්වූ පර්යේෂණ ලිපි 10ක පර්යේෂකයින් සඳහා ඉදිරිපත් කිරීම් සිදු කිරීමට අවස්ථාව සලසා දී තිබුණි. එම තෝරා ගන්නා ලද ප්‍රකාශන ලිපි 10හි මෘදු පිටපත් එකතුව ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ වෙබ් පිටුව මඟින් ප්‍රකාශයට පත් කිරීම පසුගියදා සිදුකළ අතරම එම මෘදු පිටපත් ඇතුලත් සංයුක්ත තැටි, ඒ හා සම්බන්ධ කැමැත්තක් දක්වන හා ඉහළ කාන්තා ශ්‍රම දායකත්වයක් දක්වන බාහිර පාර්ශව වෙත බෙදා හැරීම සඳහා කටයුතු කරන ලදී.


**2.2.12 වෘත්තීය අනතුරු සඳහා වන්දි ගෙවීම**

සේවා නියුක්තියේදී තුවාල ලබන, රැකියාවේ ස්වභාවය හේතුවෙන් වැළඳෙන රෝගවලට ගොදුරු වන සේවකයන්ට සහ සේවා ස්ථානවල අනතුරු හේතුවෙන් මිය යන ශ්‍රමිකයින්ගේ යැපෙන්නන්ට **කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය** මඟින් වන්දි ගෙවීමට කටයුතු කරයි. වාර්තා වූ අනතුරු ප්‍රමාණයන් සම්බන්ධ තොරතුරු සහ වන්දි ගෙවීම සම්බන්ධ ප්‍රගතිය පහත පරිදි වේ.

## 1 2021 වර්ෂය තුළ වාර්තා වූ මාරක සහ මාරක නොවන අනතුරු




**ප්‍රස්තාරය 2-6** වාර්තා වූ මාරක අනතුරු සංඛ්‍යාව - 2021




**ප්‍රස්තාරය 2-7** වාර්තා වූ මාරක නොවන අනතුරු සංඛ්‍යාව - 2021

## 2 වාර්තා වූ මාරක සහ මාරක නොවන අනතුරුවල ස්වභාවය

**වගුව 2-15** වාර්තා වූ මාරක සහ මාරක නොවන අනතුරුවල ස්වභාවය


| ක්ෂේත්‍රය | මාරක අනතුරු ප්‍රමාණය | මාරක නොවන අනතුරු ප්‍රමාණය |
|---|---|---|
| උස් ස්ථානයකින් ඇද වැටීමක් | 20 | 18 |
| විදුලිසැර | 08 | 03 |
| ගිනි / රසායනික ද්‍රව්‍ය / අපද්‍රව්‍ය | 02 | 09 |
| රිය අනතුරු | 57 | 25 |
| සතුන්ගෙන් | 06 | 05 |
| වෙනත් ද්‍රව්‍ය පුද්ගලයා මතට පතිත වීම | 13 | 08 |
| අසනීප තත්ත්ව | 13 | - |
| දියේ ගිලීම් | 04 | - |
| ස්වභාවික අනතුරු | 02 | - |
| යන්ත්‍ර සහ ලිස්සා යෑම් | 05 | 28 |
| වෙනත් හදිසි අනතුරු | 27 | 82 |
| පහර දීම් / තුවාල කිරීම් | - | 02 |
| **එකතුව** | **157** | **180** |

## 3 වාර්තා වූ මාරක නොවන අනතුරුවල හානියේ ස්වභාවය

**වගුව 2-16** වාර්තා වූ මාරක නොවන අනතුරුවල හානියේ ස්වභාවය

| ක්ෂේත්‍රය | අනතුරු ප්‍රමාණය |
|---|---|
| තාවකාලික සුළු තුවාල | 53 |
| පිළිස්සීම් | 10 |
| ඇඟිලි අහිමිවීම් | 23 |
| අස්ථි බිඳීම් | 37 |
| අත / අත්ලේ කොටස් ඉවත්කිරීම් | 18 |
| කොන්ද / සුෂුම්නාවට හානි | 17 |
| පා ඇඟිලි / පාද අහිමිවීම් | 7 |
| ඇසට හානිවීම | 5 |
| වෙනත් | 10 |
| **එකතුව** | **180** |

## 4 සංචාරක අධිකරණ ප්‍රදේශ අනුව වාර්තා වූ අනතුරු ප්‍රමාණය




**ප්‍රස්තාරය 2-8** සංචාරක අධිකරණ ප්‍රදේශ අනුව වාර්තා වූ අනතුරු ප්‍රමාණය - 2021

## 5 වන්දි ගෙවීමේ කටයුතුවල ප්‍රගතිය

**වගුව 2-17** වන්දි ගෙවීමේ කටයුතුවල භෞතික හා මූල්‍ය ප්‍රගතිය - 2021

| ක්‍රියාකාරකම | භෞතික | | මූල්‍ය (රු. මිලි.) | |
|---|---|---|---|---|
| | අපේක්ෂිත සංඛ්‍යාව | තත්‍ය සංඛ්‍යාව | අපේක්ෂිත සංඛ්‍යාව | තත්‍ය සංඛ්‍යාව |
| අවසන් කළ මාරක හා මාරක නොවන නඩු ගොනු ගණන | 360 | 277 | 120 | 178.8 |
| ගිවිසුම් | 90 | 58 | 9 | 4.4 |
| ආරම්භ කළ බාල වයස්කාර ගිණුම් | 100 | 155 | 30 | 19.5 |
| නිදහස් කළ බාල වයස්කාර ගිණුම් | 132 | 95 | 17.1 | 23.8 |

### 2.2.13 රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ඵලදායිතාව ප්‍රවර්ධනය කිරීම

ශ්‍රී ලංකාවේ රාජ්‍ය සහ පෞද්ගලික අංශයන්හි වඩාත් කාර්යක්ෂම හා ගුණාත්මක සේවා සැපයීමක් සඳහා **ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය** විසින් ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ. සේවාලාභින් ආයතන පරිශ්‍රය තුළ රැඳී සිටීමේ කාලය අවම කිරීම සඳහා සුදුසු ක්‍රමවේද සැකසීමත්, ඒ තුළින් ආයතනික කාර්යක්ෂමතාවය සහ සඵලතාවය ඉහළ නැංවීමත් සහ සතුටුදායක හා කාර්යක්ෂම පාරිභෝගික සේවා ක්‍රියාවලි වර්ධනය කිරීම සඳහා වර්තමානයේ භාවිතා වන පාරිභෝගික සේවා ක්‍රියාවලි විශ්ලේෂණය කිරීම, පාරිභෝගික හා සේවක තෘප්තිය පිළිබඳ සංගණනයක් සිදුකිරීම, ඉහළ කළමනාකාරිත්වය සහ කාර්ය මණ්ඩලය සමඟ සාකච්ඡා සිදුකිරීම හා ක්‍රියාවලි සංශෝධන ඇතුළත් වාර්තාවක් ඉහළ කළමනාකාරීත්වය වෙත යොමුකිරීම තුළින් අදාළ වැඩිදියුණු කිරීම් සිදුකරනු ලැබේ. 2021 වර්ෂය තුළ ආයතනය විසින් අත්කරගත් ප්‍රගතිය පහත පරිදි වේ

#### 1 ක්‍රියාකාරී සැලැස්මේ කටයුතුවලට අදාළ ප්‍රගතිය

**විශේෂ වැඩසටහන්**

- **අග්‍රාමාත්‍ය කාර්යාලය සඳහා විශේෂිත වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම**

  අග්‍රාමාත්‍ය කාර්යාලය සඳහා, මාර්ගගත ක්‍රමය තුළින් ඵලදායිතා සහතික පත්‍ර පාඨමාලාවක් ක්‍රියාත්මක කරන ලදී. මෙයට අදාළ විභාග පවත්වා අවසන් කර ඇති අතර, සහතික පත්‍ර ලබාදීමට නියමිතය. මෙම විශේෂ වැඩසටහන 42කුගේ සහභාගිත්වයෙන් සිදුකරන ලදී.

- **දිවයින පුරා පිහිටි සියලු ලංකා බැංකු සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම**

  ලංකා බැංකු ශාඛාවල ඵලදායිතාවය ඉහළ නැංවීම තුළින් සේවාලාභීන්ට කාර්යක්ෂම සහ ගුණාත්මක සේවාවක් ලබාදීම සඳහා දිවයින පුරා පිහිටි ලංකා බැංකු 705ක ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහන් සහ විගණන වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

- **ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය යටතේ පිහිටි ආයතන සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම**

  ආයතන හා පුද්ගල කාර්යක්ෂමතාව තුළින් ඵලදායි සේවාවක් ප්‍රජාව වෙත ලබාදීම සඳහා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය යටතේ පිහිටි ඩිපෝ 107, රියදුරු පාසල් 4 හා ප්‍රාදේශීය වැඩපළ 9ක් සඳහා ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

**ආංශික වැඩසටහන්**

- **පුහුණු වැඩසටහන් පැවැත්වීම**



**වගුව 2-18** ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය විසින් පවත්වන ලද පුහුණු වැඩසටහන්

| | පාඨමාලාව | වැඩසටහන් ගණන | වියදම (රු. මිලි.) | ආදායම (රු. මිලි.) |
|---|---|---|---|---|
| 1 | ඵලදායිතාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව | 01 | 0.35 | 1.66 |
| 2 | 5S සහතිකකරණ පාඨමාලාව | 21 | 0.08 | 0.04 |
| 3 | කෙටිකාලීන පාඨමාලා | 05 | 0.14 | |
| 4 | සහතික පත්‍ර පාඨමාලා | 24 | 0.65 | |
| 5 | පුහුණුකරුවන් පුහුණුකිරීමේ වැඩසටහන් | 3 | | |

- ආසියානු ඵලදායිතා සංවිධානයේ මැදිහත්වීම මත තාක්ෂණික විශේෂඥ සේවා - Technical Expert Services (TES) වැඩසටහන් 3ක් පහත පරිදි පවත්වන ලදී.

  Smart Transformation for Service Sector
  Performance Management
  Big Data for Public Sector

- Trendy Talk මාර්ගගත සැසි මාලා පැවැත්වීම

සාර්ථක ජීවිතයකට අවශ්‍ය ඵලදායිතා සංකල්ප හා ප්‍රායෝගික භාවිතයන් පිළිබඳ දැනුම ලබාදීම සඳහා Trendy Talk නමින් මාර්ගගත සැසි මාලා 7ක් අදියර දෙකකින් පවත්වා අවසන් කරන ලදී. පළමු අදියර යටතේ "ඵලදායිතාවය තුළින් සාර්ථකත්වය, තිරසර ගෙවතු වගාව, වසංගතය හමුවේ රසවින්දනය, සහ කොවිඩ් 19 වසංගතය හමුවේ ධනාත්මකව සිතමු", යන මාතෘකාවන්ට අදාළ සැසිමාලාවන් පවත්වන ලද අතර, දෙවන අදියර යටතේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකත්වය පිළිබඳ දැනුම ලබාදීම සඳහා "ඵලදායිතාවය හා ව්‍යවසායකත්වය" යන මාතෘකාව යටතේ සැසිමාලාවන් 3ක් ක්‍රියාත්මක කරන ලදී. මෙම සැසිමාලාව සමග මේ වනවිට නරඹන්නන් 435ක් ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය සමග සම්බන්ධ වී ඇත

- ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

දිවයින පුරා පිහිටි ආයතනවල ඵලදායිතා සංකල්ප ප්‍රචලිත කිරීමේ අරමුණින් ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක වන අතර, ඵලදායිතා මෙවලම් හා තාක්ෂණය පිළිබඳ දැනුවත් වීම හා ප්‍රායෝගික භාවිතය තුළින් මෙම සංකල්ප ආයතන වෙත ප්‍රවේශ කිරීම මෙමඟින් සිදු වේ. එමෙන්ම ක්‍රියාවලි වැඩිදියුණු කිරීම තුළින් ආයතනික ඵලදායිතාවය වර්ධනය කර සේවා කාර්යක්ෂමතාවය වර්ධනය කිරීමට අවශ්‍ය පසුබිම ද මෙමඟින් ලැබෙනු ඇත. 2021 වසර තුළදී පහත සඳහන් ආයතන වෙත ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

- සංවර්ධන ලොතරැයි මණ්ඩලය
- බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව
- සංචාරක අමාත්‍යාංශය
- සමාජ සේවා දෙපාර්තමේන්තුව
- ශ්‍රී ලංකා ජාතික රෝහල
- අධිකරණ අමාත්‍යාංශය
- සුරාබදු දෙපාර්තමේන්තුව
- ශ්‍රම වාසනා අරමුදල් කාර්යාලය
- රෙජිස්ට්‍රාර් ජෙනරාල් දෙපාර්තමේන්තුව
- පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශය
- කාර්මික අධ්‍යාපන පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව
- පොල් සංවර්ධන අධිකාරිය
- සේවා නියුක්තිකයනිගේ භාර අරමුදල් ප්‍රධාන කාර්යාලය
- සංවර්ධන ලොතරැයි මණ්ඩල
- ළමා ලේකම් කාර්යාලය
- ආයුර්වේද ඖෂධ සංස්ථාව
- පූර්ව ළමාවිය සංවර්ධන ලේකම් කාර්යාලය
- රාජගිරිය ජනාධිපති විදුහල
- ජාතික මානව සම්පත් සංවර්ධන ආයතනය
- බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
- කාර්මික හා තාක්ෂණ දෙපාර්තමේන්තුව

- **පිරිවෙන් සඳහා ගුණාත්මක දර්ශක හඳුන්වා දීම**

පිරිවෙන් අධ්‍යාපන පරමාර්ථ සාධනය කර ගැනීම සඳහා ඵලදායිතා සංකල්ප පිරිවෙන් පද්ධතියට හඳුන්වා දීම අරමුණු කර ගනිමින් පිරිවෙන් 187 සහ සීලමාතා පිරිවෙන් 15ක් සඳහා ගුණාත්මක දර්ශක හඳුන්වා දීම 2021 වසර තුළදී ක්‍රියාත්මක කරන ලදී.

- **කුඩා පරිමාණ ව්‍යවසායක සංවර්ධන වැඩසටහන**

එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකින් ව්‍යවසායකයින් 20 බැගින් දිවයින පුරා ව්‍යවසායකයින් 6,620ක් තෝරා අදාළ තොරතුරු එක්රැස් කර, ප්‍රතිලාභීන් තෝරා ගැනීමට කටයුතු කර ඇති අතර, සුළු පරිමාණ ව්‍යවසායකයින් හා කාන්තා ව්‍යවසායකයින් සවිබල ගැන්වීම සඳහා පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන් 13ක් පවත්වා 93%ක භෞතික ප්‍රගතියක් ලබා ඇත. මෙම ව්‍යවසායකයින් සඳහා Zoom තාක්ෂණය ඔස්සේ සියලු දැනුවත් කිරීම් සිදුකර ඇති අතර, කොවිඩ් වසංගත තත්ව යටතේ වුවද, මෙම දැනුවත් කිරීම් අඛණ්ඩව පවත්වා ගෙන යාමට කටයුතු කරන ලදී.

- **දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ආයතන තුළ ඵලදායිතා සංකල්ප ක්‍රියාත්මක කිරීම**

දිස්ත්‍රික් ලේකම් කාර්යාල සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත අනුයුක්ත ඵලදායිතා සංවර්ධන නිලධාරීන් සඳහා වාර්ෂික ඉලක්ක අගයන් ලබාදීම තුළින් ආයතනවල ඵලදායිතා සංකල්ප ක්‍රියාත්මක කිරීම සිදුකර ඇත. නවීකරණය, කාර්යක්ෂමතාවය, හා ඵලදායි වැඩ පරිසරයක් තුලින් ආයතනික සේවාවන් කාර්යක්ෂම කිරීම මෙහි මූලික අරමුණ වේ. දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත අනුයුක්ත නිලධාරීන් සඳහා පහත සඳහන් ආයතනවල වැඩසටහනක් බැගින් සිදු කිරීමට ඉලක්ක ලබාදී ඇත.

- රෝහල්
- ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය
- කලාප අධ්‍යාපන කාර්යාලය
- දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
- අධිකරණ / පොලිස් ස්ථාන
- පෞද්ගලික අංශයේ ආයතන

ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත අනුයුක්ත නිලධාරීන් සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල, රාජ්‍ය අංශයේ ආයතන, පිරිවෙන් සඳහා වැඩසටහනක් බැගින් සහ පෙර පාසැල් සඳහා වැඩසටහන් දෙකක් බැගින් සිදු කිරීමට ඉලක්ක ලබාදී ඇත.

**ආදායම් උත්පාදනය**

2021 වසර තුළදී සිදුකරන ලද ක්‍රියාකාරකම් ආශ්‍රයෙන් රු. මිලි. 2.5ක ආදායමක් උත්පාදනය කිරීමට ජතික ඵලදායිතා ලේකම් කාර්යාලය සමත් වී ඇත.

**වගුව 2-19** ජතික ඵලදායිතා ලේකම් කාර්යාලයේ ආදායම් උත්පාදනය

| ආදායම් උත්පාදනයට දායක වූ ක්ෂේත්‍ර | උපයන ලද ආදායම (රුපි. මිලි.) |
|---|---|
| පුහුණු වැඩසටහන් මඟින් (ඩිප්ලෝමා පාඨමාලාව, කෙටිකාලීන සහ සහතික පත්‍ර පාඨමාලා මඟින්) | 1.70 |
| 5S සහතිකකරණ පාඨමාලා | 0.05 |
| පළාත් පාලන නිලධාරීන් සඳහා පවත්වන ලද පුහුණු පාඨමාලා | 0.15 |
| 2020 ජාතික ඵලදායිතා සම්මාන උළෙලට අදාළ කාර්යයන් මඟින් හා ප්‍රකාශන නිකුත් කිරීම් මඟින් | 0.60 |
| **එකතුව** | **2.5** |

2021 වසරේ සැප්තැම්බර් මාසය වනතුරුම කොවිඩ් 19 වසංගත තත්වයන්ට අදාළව ආරක්ෂිත ක්‍රියාමාර්ග අනුගමනය කිරීමට සිදුවූ හෙයින් (පුද්ගල ඒකරාශීවීම් අවලංගු කිරීම, නිවසේ සිට රාජකාරි කිරීමට සිදුවීම වැනි), ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලයේ විෂය පථයට අදාළ ඇතැම් වැඩසටහන් ඉටු කිරීමේ හැකියාවක් නොපැවතුනි. හැකි සෑම අවස්ථාවකදීම මාර්ගගත ක්‍රමයට අනුගත වුවද, ඇතැම් ආයතන මෙම ක්‍රමය මගින් විගණන කටයුතු සිදුකිරීම හා උපදේශන සේවාවන් ලබා ගැනීම ප්‍රතික්ෂේප කරන ලද අවස්ථාවන්ද පැවතුනි.

### 2.2.14 සුනිසි මෙහෙවර වැඩසටහන

සංවර්ධනය කරා යන මාර්ගයට ශ්‍රී ලංකාව අවතීර්ණ වීමට නම් යහපත් රැකියා ප්‍රවර්ධනය කළ යුතු වේ. මෙමගින් නිදහස, සාධාරණත්වය, ආරක්ෂාව හා මානව ගරුත්වය යන තත්ත්වයන් තුළ ඵලදායී වැඩ ලබා ගැනීමට කාන්තාවන්ට හා පිරිමින්ට සමාන අවස්ථා ප්‍රවර්ධනය කිරීමට අපේක්ෂිතය. එසේම, රැකියා නිර්මාණය කිරීම පමණක් අපේක්ෂා නොකරන අතර එම නිර්මාණය කෙරෙන රැකියා පිළිගත හැකි තත්ත්වයේ ඒවා විය යුතු වීම විශේෂත්වයකි. සුනිසි මෙහෙවර වැඩසටහන ප්‍රධාන ස්ථම්භයන් හතරක් තුළ ක්‍රියාත්මක වේ.

- රැකියා උත්පාදනය, ප්‍රවර්ධනය හා ජාතික ඵලදායීතාව
- වැඩබිමෙහි හිමිකම
- සමාජ ආරක්ෂණය
- සමාජ කතිකාවත

මෙම ප්‍රධාන ස්ථම්භ 4ට අමතරව පහත දැක්වෙන විෂය ක්ෂේත්‍රයන් ආවරණය වන පරිදි වැඩසටහන් ක්‍රියාත්මක කරමින් සෑම අංශයක්ම සම්බන්ධීකරණය කරනු ලැබේ.

- ඵලදායිතා ප්‍රවර්ධනය
- ස්ත්‍රී පුරුෂ සමාජභාවය තහවුරු කිරීම

2021 වර්ෂය තුළ සුනිසි මෙහෙවර වැඩසටහන යටතේ විවිධ වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට රුපියල් මිලියන 33ක් පහත සඳහන් ආයතනවලට වෙන් කර ක්‍රියාත්මක කරන ලදී.

**වගුව 2-20** සුනිසි මෙහෙවර වැඩසටහනෙහි ප්‍රගතිය

| ආයතනය | ශුද්ධ ප්‍රතිපාදනය (රු. මිලි.) | වියදම (රු. මිලි.) | වියදම් ප්‍රතිශතය |
|---|---|---|---|
| කම්කරු දෙපාර්තමේන්තුව | 15.92 | 11.81 | 74% |
| ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | 10.14 | 10.14 | 100% |
| ජාතික වෘත්තිය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය | 1.35 | 1.35 | 100% |
| කම්කරු අමාත්‍යාංශය | 3.38 | 3.38 | 100% |
| කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය | 2.09 | 2.09 | 100% |
| **එකතුව** | **32.88** | **28.77** | **87%** |
| මහභාණ්ඩාගාර උපදෙස් මත ඉතිරිකිරීම් | 12.12 | | |
| **මුළු එකතුව** | **45.00** | | |

### 2.2.15 වඩා හොඳ සේවාවක් සැපයීම වෙනුවෙන් ආයතන ඇගයීම

**1 ජාතික වෘත්තීය සුරක්ෂිතතා සහ සෞඛ්‍ය විශිෂ්ටතා සම්මාන උළෙල**

සේවා ස්ථානවල යහපත් සෞඛ්‍ය සහ ආරක්ෂිත පිළිවෙත් අනුගමනය කරන ආයතන ඇගයීම සඳහා ජාතික වෘත්තීය සුරක්ෂිතතා සහ සෞඛ්‍ය ආයතනය විසින් වසර දෙකකට වරක් ජාතික මට්ටමින් වෘත්තීය සුරක්ෂිතතා සහ සෞඛ්‍ය විශිෂ්ටතා සම්මාන උළෙල පවත්වයි. සම්මානලාභීන් විසින් වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍ය සඳහා වන සුවිශේෂී කැපවීම හඳුනා ගැනීමට අවස්ථාව සලසන සංකීර්ණ ක්‍රියාවලියක් හරහා හොඳම වෘත්තීය

ආරක්ෂාව සහ සෞඛ්‍ය සම්බන්ධ ක්‍රියාමාර්ග අනුගමනය කරනු ලබන කර්මාන්ත තෝරා ගනු ලැබේ. කුසලතා සම්මාන, අංශ සම්මාන සහ විශිෂ්ටතා සම්මාන වශයෙන් ප්‍රධාන කාණ්ඩ තුනක් සඳහා සම්මාන පිරිනමනු ලැබේ. 2021 වසරේ පැවැත්වීමට නියමිත සම්මාන ප්‍රදානෝත්සවය සඳහා අයදුම්පත් කැඳවූ අතර එහි මූලික සූදානම් කිරීමේ කටයුතු මේ වනවිට සිදුවෙමින් පවතී.

2 ජාතික ඵලදායිතා සම්මාන උළෙල

ශ්‍රී ලංකාවේ රාජ්‍ය, අර්ධ රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ ආයතනවල පාරිභෝගිකයන් වෙත හොඳම ඵලදායි සේවාවක් සපයන ආයතන ඇගයීම සඳහා ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය විසින් ජාතික ඵලදායිතා සම්මාන උළෙල පවත්වනු ලබයි

සම්මාන උළෙල සඳහා 2020 වර්ෂයේදී අයදුම්පත් කැඳවන ලද අතර, මහජනතාව, නිෂ්පාදන, සේවා අංශයේ ආයතන සහ පාසල්වලින් අයදුම්පත් 1,820ක් ලැබී ඇත. සම්මාන උළෙල 2022.03.28 දින අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වීමට කටයුතු සූදානම් කරමින් පවතී.

### 2.2.16 සැලසුම්, පර්යේෂණ, සංවර්ධන සහ ප්‍රකාශන කටයුතු

1 කම්කරු අමාත්‍යාංශය

I. මෙම අමාත්‍යාංශය විසින් වාර්ෂිකව කම්කරු ක්ෂේත්‍රයේ විවිධ කාලෝචිත තේමාවන් පාදක කර ගනිමින් විද්වත් කතිකාවතක් සංවිධානය කරන අතර එහි පර්යේෂණාත්මක ලිපි අඩංගු කරමින් ජර්නලයක් ප්‍රකාශයට පත් කරයි. ඒ අනුව, 2021 වර්ෂයේ "Guaranteeing Workers' Right; Expanding the Horizon" යන තේමාව පදනම් කර ගනිමින් පර්යේෂණාත්මක ලිපි කැඳවීම සිදු කර අවසන් අතර ඒවා කම්කරු විෂය පිළිබඳ හසළ දැනුමැති විද්වත් කමිටුවක් විසින් ඇගයීමෙන් අනතුරුව ජර්නලයක් ලෙස ප්‍රකාශයට පත් කිරීමට නියමිතය. මේ වන විට රටේ පවතින වාතාවරණය හේතුවෙන් මෙවර විද්වත් කතිකාවතක් නොපවත්වා ජර්නලය ප්‍රකාශයට පත් කිරීම පමණක් සිදු කෙරේ

II. සුනිසි මෙහෙවර වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අදාළ සියලු සම්බන්ධීකරණ කටයුතු සිදු කරන ලද අතර එහි ප්‍රගතිය 2.2.14 යටතේ දක්වා ඇත

III. ශ්‍රී ලංකා සේවක සඟරාව ප්‍රකාශයට පත් කිරීම සම්බන්ධ සියලු කටයුතු සිදු කිරීම. වර්තමානයේ දී අර්ධ වාර්ෂිකව ප්‍රකාශයට පත් කරනු ලබන ශ්‍රී ලංකා සේවක සඟරාවේ සමාලෝචිත කාලයට අදාළව කාණ්ඩ අංක 72හි 1 කලාපය නිකුත් කරන ලද අතර 2 කලාපය ප්‍රකාශයට පත් කිරීම සඳහා කටයුතු සූදානම් කෙරෙමින් පවතී

IV. අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතන විසින් සිදු කරනු ලබන සංවර්ධන ඉලක්කයන් ඇතුලත් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කර අදාළ පාර්ශව වෙත යොමු කිරීම. ශුන්‍ය පාදක අයවැය සංවර්ධන වැඩසටහන යටතේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ සෑම මසකම ප්‍රගතිය ඇගයීම මගින් ඉලක්ක වෙත ළඟාවීම අධීක්ෂණය හා දිරිගැන්වීම

V. ජාතික අයවැය චක්‍රලේඛ අනුව ජනාධිපති ලේකම් කාර්යාලය, මුදල් අමාත්‍යාංශය, ව්‍යාපෘති කළමණාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව හා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණය පැවැත්වීම හා ප්‍රගති වාර්තා මාසිකව හා ත්‍රෛමාසිකව ඉදිරිපත් කිරීම

VI. අමාත්‍යාංශය විසින් 2020 වර්ෂයේදී අත්කරගත් ප්‍රගතිය ඇතුලත් වාර්ෂික කාර්යසාධන වාර්තාව සකස් කිරීම

VII. අමාත්‍යාංශයේ 2022 වර්ෂයට අදාළ අයවැය ප්‍රතිපාදන අනුමත කර ගැනීම සඳහා පවත්වනු ලබන පාර්ලිමේන්තුවේ අයවැය කාරක සභා විවාදයට ඉදිරිපත් කිරීම සඳහා ප්‍රගති වාර්තාව සකස් කිරීම

2 කම්කරු දෙපාර්තමේන්තුව

**I. දෙපාර්තමේන්තු කාර්යයන් අධීක්ෂණය මඟින් ඉලක්කයන් කරා මෙහෙයවීම**

දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරී සැලැස්ම හා උපාය මාර්ගික සැලැස්ම සකස් කිරීම සහ ඒ යටතේ වන ඉලක්කයන්ට අදාළව දෙපාර්තමේන්තුවේ සියලුම අංශයන් හා ප්‍රාදේශීය කාර්යාල මෙහෙයවීමේ කටයුතු සම්බන්ධීකරණය, දෙපාර්තමේන්තුවේ අංශයන්හි ප්‍රගතිය සහ ඉදිරි කටයුතු පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා පවත්වනු ලබන කම්කරු කොමසාරිස්වරුන්ගේ මාසික රැස්වීමේ කටයුතු සම්බන්ධීකරණය කිරීම, කම්කරු අමාත්‍යාංශය විසින් ප්‍රගති සමාලෝචනය සඳහා මාසිකව පවත්වනු ලබන කළමනාකරණ මෙහෙයුම් කමිටු රැස්වීම සඳහා දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය සකස් කිරීම සහ එම රැස්වීමේ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම, කම්කරු අමාත්‍යාංශය හා අනෙකුත් අමාත්‍යාංශ විසින් ඉල්ලුම් කරනු ලබන දත්ත හා වාර්තා සැපයීම, සැලසුම් පර්යේෂණ, පුහුණු හා ප්‍රකාශන අංශයේ සැලසුම් හා ප්‍රගති සමාලෝචන කාර්යභාරය වේ.

කම්කරු දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාලයන්හි ප්‍රගති සමාලෝචන කටයුතු මෙහෙයවීමේ වගකීම මෙම අංශය මඟින් දරනු ලබයි. ඒ යටතේ, ප්‍රාදේශීය කාර්යාලයන්හි වාර්ෂික ප්‍රගති සමාලෝචන සැලැස්ම සකස් කිරීම හා අධීක්ෂණය මෙම අංශය විසින් සිදු කරනු ලබයි. එහිදී කලාප භාර නියෝජ්‍ය කම්කරු කොමසාරිස්වරුන් මඟින් එක් එක් කලාපයන්හි ප්‍රගති සමාලෝචන කටයුතු සිදු කිරීම මෙන්ම අංශය මඟින් අධීක්ෂණ කණ්ඩායම් යොමු කර එක් එක් කාර්යාලයන්හි ප්‍රගතිය පිළිබඳ පරීක්ෂා කිරීමද සිදු කරනු ලබයි.

දෙපාර්තමේන්තුවේ සියලුම කාර්ය මණ්ඩලය සඳහා අවශ්‍ය වන පුහුණුව ලබා දීම බාහිර ආයතන විසින් පවත්වන පුහුණු පාඨමාලා වෙත නිලධරයන් යොමු කිරීම, විශ්ව විද්‍යාල උපාධි හා පශ්චාත් උපාධි සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන සැපයීම සහ විදේශ පුහුණු සඳහා අවශ්‍ය සම්බන්ධීකරණ කාර්යය ඉටු කිරීම මෙම අංශය විසින් ඉටු කරනු ලබන මානව සම්පත් සංවර්ධනය පිළිබඳ කාර්යභාරය වේ.

එසේම, දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා අවශ්‍ය කම්කරු නීති සම්බන්ධ අණපනත් සහ පඩි පාලක සභා තීරණ මුද්‍රණය කර ලබා දීම, කම්කරු නිලධාරීන්ට ක්ෂේත්‍ර කටයුතු සඳහා උපයෝගී කර ගැනීම පිණිස අවශ්‍ය වන ශ්‍රමික පරීක්ෂණ වාර්තා, මාසික දින පොත් ආදී පොදු ආකෘති පත්‍ර මුද්‍රණය කර ලබා දීම ආදී මුද්‍රණ කටයුතු ද මෙම අංශය විසින් සිදු කරනු ලැබේ.

- **දිස්ත්‍රික් / උප කම්කරු කාර්යාල අධීක්ෂණය**

2021 වර්ෂය තුළ දිස්ත්‍රික් හා උප කම්කරු කාර්යාල 57ක ප්‍රගතිය අධීක්ෂණය කරන ලදී. එහිදී කම්කරු නිලධරයන්ගේ ක්ෂේත්‍ර පරීක්ෂණ කටයුතු සහ අධිකරණ කටයුතු, හිඟ සේවක අර්ථසාධක අරමුදල් අය කර ගැනීමේ ක්‍රියාවලිය සහ සේවක අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභ ගෙවීම් කටයුතු, දෙපාර්තමේන්තුව වෙත ලැබෙන කාර්මික ආරවුල් සහ ව්‍යවස්ථාපිත හිමිකම් උල්ලංඝනය වීම පිළිබඳ පැමිණිලි කාර්යක්ෂමව විසඳීමේ කටයුතු සහ කාර්යාලයන්හි පරිපාලන කටයුතු ක්‍රියාකාරකම් පිළිබඳව අධීක්ෂණය කර තවදුරටත් කාර්යක්ෂම විය යුතු ක්‍රියාකාරකම් සඳහා උපදෙස් ලබා දීමට කටයුතු කරන ලදී.


පැවති කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් 2021 වර්ෂය තුළදී ප්‍රාදේශීය කම්කරු කාර්යාලයන්හි ප්‍රගතිය සමාලෝචනය සඳහා කලාප මට්ටමින් ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම සිදු කළ නොහැකි විය.

- **කම්කරු නිලධරයන්ගේ ක්ෂේත්‍ර පරීක්ෂණ කටයුතු**

ක්ෂේත්‍ර පරීක්ෂණ කටයුතු සැලසුම් කිරීම හා අනුමැතිය ලබා ගැනීම, ඒ සඳහා

ආයතන තෝරා ගැනීමේදී ප්‍රමුඛතාවය ලබා දිය යුතු ආයතන හා එම ආයතන සහකාර කම්කරු කොමසාරිස් විසින් ලබා දීම, ක්ෂේත්‍ර පරීක්ෂණවල ගුණාත්මකභාවය වර්ග කිරීම, කම්කරු නිලධරයන් විසින් වාර්තා නියමිත දිනයන්ට ලබාදීම හා එම වාර්තාවල නිර්දේශයන් ක්‍රියාත්මක කිරීමේ කාර්යක්ෂමතාවයද අධීක්ෂණය කරන ලද අතර එහි ප්‍රගතිය පහත පරිදි වේ.

2021 වර්ෂය තුළ සිදු කරන ලද කම්කරු පරීක්ෂණ සංඛ්‍යාව ක්‍රමිකව වැඩි වී ඇති නමුත් පැවති කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් ශ්‍රමික පරීක්ෂණ සිදු කිරීම වර්ෂයේ ඇතැම් මාසයන්හිදී සම්පූර්ණයෙන්ම අත්හිටුවා තිබීම සහ පරීක්ෂණ සිදු කිරීම සීමා කිරීම හේතුවෙන් 2020 සහ 2021 වර්ෂයන්හි පරීක්ෂණ සංඛ්‍යාව පෙර වර්ෂයන්ට සාපේක්ෂව අඩු අගයක් ගෙන ඇත.




**ප්‍රස්තාරය 2-9** 2016 සිට 2021 දක්වා සිදු කරන ලද කම්කරු පරීක්ෂණ සංඛ්‍යාව

- **සේවක අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභ ගෙවීම් කටයුතු**


සේවක අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභ ගෙවීම් කටයුතුවල ක්‍රමික ප්‍රගතියක් දක්නට ඇති අතර 2017 වර්ෂයට සාපේක්ෂව 2021 වර්ෂය අවසාන වන විට දින 14ක් තුළ ප්‍රතිලාභ ගෙවූ ප්‍රතිශතය 43% සිට 65% දක්වා වර්ධනය වී ඇත. ඒ අනුව, ප්‍රතිලාභ ගෙවීමේ කාර්යක්ෂමතාවය වර්ධනය වී ඇති බව ප්‍රස්තාරය 2-10 මඟින් පිළිබිඹු වේ.

- **පෙත්සම් කටයුතු**

ඒ ඒ දිස්ත්‍රික් හා උප කාර්යාල වෙත ලැබී ඇති පැමිණිලි විසඳීමේ ක්‍රියාවලිය සහ විසඳීමේ කටයුතු ප්‍රමාද වී ඇති ගොනු ප්‍රමාණයන් හඳුනාගෙන ඒවා සඳහා වහාම පියවර ගැනීම සඳහා අදාළ උපදෙස් හා නිර්දේශ ලබාදෙන ලදී. දෙපාර්තමේන්තුව වෙත ලැබෙන පෙත්සම් විසඳීම සඳහා සම්මත කාර්ය පටිපාටියක් 2021 වර්ෂයේ නොවැම්බර් මාසයේ සිට හඳුන්වාදෙන ලද අතර 2022 වර්ෂයේදී එහි ප්‍රගතිය සමාලෝචනය කිරීමට අපේක්ෂිතය.

එසේම, සියලුම දිස්ත්‍රික් හා උප කම්කරු කාර්යාලයන්හි ප්‍රගතිය සමාලෝචනය කිරීම සඳහා කම්කරු කොමසාරිස් ජනරාල්ගේ ප්‍රධානත්වයෙන් මාර්ගගත ක්‍රමවේදය භාවිතයෙන් රැස්වීම් මාලාවක් පවත්වන ලදී.






**ප්‍රස්තාරය 2-10** සේවක අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභ ගෙවීම සඳහා ගතවූ කාලය - 2017 සිට 2021 දක්වා

### II. මානව සම්පත් සංවර්ධනය

දෙපාර්තමේන්තු නිලධාරීන් වෙත තම කාර්යභාරය පිළිබදව පවත්නා දැනුම හා ප්‍රායෝගිකව ක්‍රියාත්මක වීමට ඇති අවබෝධය වර්ධනය කරමින් දෙපාර්තමේන්තුව විසින් සපයන සේවාවල ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම උදෙසා නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය අත්‍යවශ්‍ය ක්‍රියාකාරකමක් වේ. ඒ අනුව, දෙපාර්තමේන්තුව විසින් පුහුණුව ලබා දීමේදී නිලධාරීන්ගේ පුහුණු අවශ්‍යතා හඳුනාගෙන ඒ අනුව අදාළ පුහුණුව ලබා දීම මඟින්ද බාහිර අධ්‍යාපන ආයතන විසින් පවත්වන පාඨමාලා සඳහා සහභාගී වීමට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන ලබා දීම මඟින් මෙන්ම විදේශ පුහුණුවීම් සඳහා යොමු කිරීමට අවස්ථා ලද විට ඊට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන හා සම්බන්ධීකරණය සිදු කිරීම මඟින් ද මෙම පුහුණු කාර්යයන් සිදු කරනු ලැබේ.

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 අනුව ඉදිරි දෙවසර සඳහා දෙපාර්තමේන්තුවේ මානව සම්පත් සංවර්ධන සැලැස්ම 2020 වර්ෂයේදී කෙටුම්පත් කරන ලද අතර ඒ අනුව, 2021 වර්ෂය තුළ පුහුණු වැඩසටහන් පැවැත්වීම සැලසුම් කරන ලදී.

2021 වර්ෂයේදී පවත්වන ලද පුහුණු වැඩසටහන් පිළිබඳ වැඩිදුරටත් තොරතුරු සයවන පරිච්ඡේදයේ මානව සම්පත් සංවර්ධනය යටතේ සඳහන් කර ඇත.

කම්කරු දෙපාර්තමේන්තුව විසින් නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් 19 සංවිධානය කර පවත්වන ලද අතර ඒ සඳහා නිලධරයන් 2,328ක් සහභාගි වන ලදී. පශ්චාත් උපාධි, නීතිවේදී උපාධි වැනි බාහිර පුහුණු ආයතන්හි පුහුණුව සඳහා දෙපාර්තමේන්තු නිලධාරීන් 69ක් වෙත ප්‍රතිපාදන ලබා දී ඇත.

**වගුව 2-21** කම්කරු දෙපර්තමේන්තුවේ ධාරිතා වර්ධන ක්‍රියාකාරකම් සඳහා 2021.12.31 දිනට සමස්ත වියදම

| වැය ශීර්ෂය | 2021 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රු) | 2021.12.31 දිනට වියදම (රු) | 2021.12.31 දිනට ශේෂය (රු) | ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස වියදම |
|---|---|---|---|---|
| 221-01-01-2401 | 5,500,000 | 2,232,264 | 3,267,736 | 41% |
| 221-02-02-2401 | 300,000 | - | 300,000 | 0% |
| 221-02-03-2401 | 1,500,000 | 103,500 | 1,396,500 | 7% |
| 221-02-04-2401 | 1,500,000 | 19,790 | 1,480,210 | 1% |
| **එකතුව** | **8,800,000** | **2,355,554** | **6,444,446** | **27%** |

### 2.2.17 සංඛ්‍යාලේඛන කටයුතු

ශ්‍රී ලංකාවේ කම්කරු ක්ෂේත්‍රයේ දිශානතිය පිළිබඳව අවබෝධයක් ලබා ගැනීම, ප්‍රතිපත්තිමය තීරණ ගැනීම, පවතින කම්කරු නීති සහ අණපනත් සංශෝධනය කිරීමේ අවශ්‍යතාවය හඳුනා ගැනීම හා ක්ෂේත්‍රය පිළිබඳව අනාගත පුරෝකථනය සඳහා කම්කරු ක්ෂේත්‍රයට අදාළව දත්ත එක් රැස් කර විශ්ලේෂණය කිරීම සැලසුම්, පර්යේෂණ, පුහුණු හා ප්‍රකාශන අංශයේ කම්කරු කොමසාරිස්ගේ අධීක්ෂණය යටතේ ඇති සංඛ්‍යාලේඛන අංශය විසින් සිදු කරනු ලැබේ. ඒ අනුව, 2021 වර්ෂයේදී පහත කාර්යයන් සිදු කරන ලදී.

I. කම්කරු සංඛ්‍යාති 2019 (වාර්ෂික වාර්තාව) පිටපත් 150ක් මුද්‍රණය කර බෙදාහරින ලදී
II. කම්කරු සංඛ්‍යාති 2020 (වාර්ෂික වාර්තාව) සකස් කරන ලද අතර නැවත පරීක්ෂා කිරීමේ කටයුතු සිදු කරමින් පවතී
III. වැඩකළ පැය ගණන හා ශ්‍රම පිරිවැය පිළිබඳ සමීක්ෂණය 2020 සඳහා අදාළ දත්ත විශ්ලේෂණය කර අවසන් කරන ලද අතර වගු සකස් කරමින් පවතී
IV. වැඩකළ පැය ගණන හා ශ්‍රම පිරිවැය පිළිබඳ සමීක්ෂණය 2021 සඳහා තොරතුරු ලබා ගැනීමට ප්‍රශ්නාවලි සකස් කර අදාළ ආයතන වෙත තැපැල් කිරීමේ කටයුතු සිදු කරන ලදී
V. සේවක සඟරාව සඳහා අවශ්‍ය දත්ත ලබා දීම සිදු කරන ලදී
VI. අවම වැටුප් අනුපාත දර්ශකය සඳහා දත්ත රැස් කිරීම හා දර්ශකය සකස් කිරීම සිදු කරන ලදී
VII. සේවක අර්ථසාධක අරමුදල් නව ලියාපදිංචි කිරීම් පරිගණකගත කිරීම සඳහා නිර්මාණය කර ඇති දත්ත පද්ධතිය වෙත 2020 වර්ෂය සඳහා ඇති සියලුම ලියාපදිංචි කිරීම් කේත කිරීම හා පරිගණකගත කිරීම සිදු කරන ලදී
VIII. ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ ප්‍රමිතීන්ට යටත්ව ශ්‍රී ලංකාවේ ශ්‍රම වෙළඳපොළ ප්‍රධාන දර්ශකාංක (Key Indicators of Labour Market - KILM) 14ක් සකස් කර ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලදී

### 2.2.18 පාලන සහ ආයතන කටයුතු

#### 1 කම්කරු අමාත්‍යාංශය

I. 2021 වර්ෂය තුළ මෙම අමාත්‍යාංශය විසින් අමාත්‍ය මණ්ඩල සංදේශ 26ක් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇති අතර එම සංදේශ 26 සඳහාම අනුමැතිය ලැබී ඇත. ඒ අතර ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ 205, 206 වැනි නිර්දේශ හා 190 වැනි සම්මුතිය පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම, විදේශගතව සේවය කරන ශ්‍රී ලාංකිකයින් සඳහා සමාජ ආරක්ෂණ අරමුදලක් පිහිටුවීම, කොවිඩ් -19 වසංගතය හේතුවෙන් ඇති වී තිබෙන අර්බුදය හමුවේ පුද්ගලික අංශයේ සේවකයින්ට වැටුප් ගෙවීම, වතු කම්කරුවන්ගේ අවම වැටුප ඉහළ නැංවීම, පෞද්ගලික අංශයේ සේවකයින් සඳහා අවම විශ්‍රාම වැටුපක් හඳුන්වා දීම සහ කාර්මික ආරවුල් පනත, සේවක අර්ථසාධක අරමුදල් පනත හා සේවය අවසන් කිරීමේ (විශේෂ විධි විධාන) පනත සංශෝධනය ආදිය වේ

II. ජූලි වර්ජකයින්ට සහන සැලසීම යටතේ වයස අවු. 65 සම්පූර්ණ වන ජූලි වර්ජකයින් 49ක් වෙනුවෙන් එක් වරක් පමණක් ගෙවන සහන දීමනාව, ගෙවීම් කටයුතු සඳහා අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත නිර්දේශ ඉදිරිපත් කර ඇත

III. මහජන පැමිණිලි 1,396ක් සමාලෝචිත කාලය තුළ ලැබී ඇති අතර සියල්ල ඉදිරි පියවර ගැනීම සඳහා අදාළ අංශ වෙත යොමු කර ඇත

IV. තොරතුරු දැන ගැනීමේ පනත යටතේ ඉල්ලීම් 13ක් ලැබී ඇති අතර ඉල්ලීම් 10ක් සම්බන්ධයෙන් තොරතුරු ලබා දී ඇත. ඉල්ලීම් 3ක් තොරතුරු ලබා දීම ප්‍රතික්ෂේප කර ඇත

V. විවිධ ආයතන මඟින් පවත්වනු ලබන පුහුණු පාඨමාලා 18ක් සඳහා අමාත්‍යාංශ සහ අනුබද්ධ ආයතන නිලධරයන් 364ක් සමාලෝචිත කාලය තුළ සහභාගි කරවා ඇත. ප්‍රසම්පාදන ක්‍රියාවලිය, පාරිභෝගික සේවා සැපයීම, වෘත්තීය සංවර්ධනය, කාර්යාල කළමනාකරණය හා මුදල් රෙගුලාසි සහ රාජ්‍ය සේවයේ විනය පටිපාටිය ආදී විවිධ විෂය ක්ෂේත්‍රයන් ඔස්සේ වන පාඨමාලාවන් සඳහා නිලධාරීන් යොමු කරවා ඇත

VI. අමාත්‍යාංශය මෙහෙවර පියෙස ගොඩනැගිල්ලේ 6 සහ 7 මහල්වල ස්ථාපිත කිරීමෙන් අනතුරුව, සේවා ඵලදායිතාව හා කාර්යක්ෂමතාවය වැඩි කර ගැනීමට මෙන්ම, ආයතන පරිසරය වඩාත් ආකර්ෂණීය අයුරින් සකස් කරගැනීමටත් ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය මඟින් ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහනක් ආරම්භ කරන ලදී

VII. රටේ පවතින තත්ත්වය සැලකිල්ලට ගනිමින් "මෙහෙවර පියෙස" ගොඩනැගිලි සංකීර්ණයේ විවිධ ආයතනවල සේවය කරන නිලධාරීන් සඳහා කොවිඩ් - 19 එන්නත් තුන ලබාදීමට කටයුතු කරන ලදී. ආරක්ෂක නිලධාරීන්, නඩත්තු කාර්ය මණ්ඩලය සහ අනෙකුත් ඉදිරිපෙළ නිලධාරීන් මෙයට ඇතුළත් විය

VIII. විදේශීය ශිෂ්‍යත්ව වැඩමුළු සහ පුහුණු වැඩසටහන් සඳහා මෙම අමාත්‍යාංශයට අදාළ අනෙකුත් ආයතන සහ කම්කරු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සහභාගි කිරීමට පියවර ගැනීම. 2021 වර්ෂය තුළ නිලධාරීන් 17ක් විදේශ පුහුණු පාඨමාලා සහ වැඩමුළු සඳහා මාර්ගගත ක්‍රමය ඔස්සේ සහභාගි කරවා ඇති අතර එක් නිලධාරිනියක් ජපන් රජයේ ශාස්ත්‍රපති ශිෂ්‍යත්ව පාඨමාලාව සඳහා සහභාගි වී ඇත

IX. මීට අමතරව, සමාලෝචිත කාල සීමාව තුළ පහත ආයතනික කාර්යයන් සිදු කරන ලදී

**වගුව 2-22** ආයතන කටයුතුවල ප්‍රගතිය

| අ. අං. | ක්‍රියාකාරකම | ප්‍රගතිය |
|---|---|---|
| 01 | වාචික ප්‍රශ්න සඳහා පිළිතුරු | 16 |
| 02 | කල් තැබීමේ යෝජනා සහ ස්ථාවර නියෝග සඳහා පිළිතුරු | 06 |
| 03 | මහජන පෙත්සම් කමිටුවට වාර්තා | 04 |
| 04 | ජාතික කම්කරු උපදේශක සභාව වෙත වාර්තා | 05 |
| 05 | අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ | 03 |
| 06 | නව සාමාජිකයන් පත් කළ පඩිපාලක සභා | 04 |
| 07 | තීරණ සංශෝධනය කරන ලද පඩිපාලක සභා | 07 |

#### 2 කම්කරු දෙපාර්තමේන්තුව

කම්කරු දෙපාර්තමේන්තුවේ පාලන අංශය ශාඛා 04කින් සමන්විත වේ. එනම්, පාලන ශාඛාව, ආයතන ශාඛාව, ගොඩනැගිලි නඩත්තු ඒකකය සහ පුස්තකාලය වේ.

##### I. කම්කරු දෙපාර්තමේන්තුවේ පරිපාලන කටයුතු

ඒ අතුරින් පාලන ශාඛාව මඟින් දෙපාර්තමේන්තුවේ සියලුම සේවා සහ සැපයීම් පිළිබඳව කටයුතු කරනු ලබයි. ඒ

යටතේ දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි ඉදි කිරීමට අදාළව ඉඩම් අවශ්‍යතා හඳුනා ගැනීම සහ ඉඩම් අත්පත් කර ගැනීම, ගොඩනැගිලි ඉදි කිරීමේ කටයුතු මෙහෙයවීම, ගොඩනැගිලි පුනරුත්ථාපනය සහ වැඩි දියුණු කිරීමට අදාළ කටයුතු මෙහෙයවීම, අවශ්‍යතාවය පරිදි ගොඩනැගිලි කුලියට ලබා ගැනීම, දෙපාර්තමේන්තුවේ වාහන පරිපාලනය, දෙපාර්තමේන්තුවේ අංශ සහ ප්‍රාදේශීය කාර්යාල සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම, ප්‍රාග්ධන භාණ්ඩ හා උපකරණ කළමනාකරණය, අතිකාල, නිවාඩු දින වැටුප්, අග්‍රහාර රක්ෂණ සහ ආපදා ණය අනුමත කිරීම ආදී කටයුතු සිදු කරනු ලබයි.

ආයතන ශාඛාව මඟින් දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩල අවශ්‍යතා හඳුනා ගැනීම, අවශ්‍යතාවය පරිදි බඳවා ගැනීම් සම්බන්ධ සියලු කටයතු, නිලධාරීන්ගේ උසස් කිරීම්, කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීම්, කාර්යසාධනය ඇගයීම, වැටුප් වර්ධක ලබා දීම, ස්ථාන මාරු කිරීම්, නිලධාරීන් විශ්‍රාම ගැන්වීම, නිලධාරීන්ගේ නිවාඩු කටයුතු සහ කාර්ය මණ්ඩලයේ විනය කටයුතු යන විෂයයන් සම්බන්ධයෙන් කටයුතු කරනු ලබයි.

ඒ අනුව, 2021 වර්ෂයේදී දෙපාර්තමේන්තුව විසින් පැවැත්වූ කාර්යක්ෂමතා කඩඉම් විභාග පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

- සහකාර කම්කරු කොමසාරිස් කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2021
- ඉංජිනේරු සේවයේ නිලධාරීන් සඳහා 1 කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය
- කම්කරු නිළධාරී කාර්යක්ෂමතා කඩඉම් විභාගය 2021 -1 හා 2
- මානව සම්පත් සංවර්ධන නිළධාරී සඳහා I සහ II කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ
- කාර්යාල සේවක සේවයේ නිලධාරීන් සඳහා I, II සහ III කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ
- රියදුරු සේවයේ නිලධාරීන් සඳහා I, II සහ III කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ

එසේම, වර්ෂය තුළදී සිදු කරන ලද නිලධාරීන් බඳවා ගැනීම් සහ උසස් කිරීම් පිළබඳ තොරතුරු පහත පරිදි වේ.

- සුදුසුකම් සම්පූර්ණ කරන ලද සියලුම කම්කරු නිළධාරීන් I ශ්‍රේණියට උසස් කිරීම
- ලඝු ලේඛකයන් බඳවා ගැනීම සඳහා විභාගය පවත්වා ලඝු ලේඛකයන් 02 දෙනෙකු බඳවා ගන්නා ලදී
- 2019 වර්ෂයේ පවත්වන ලද බඳවා ගැනීමේ විභාගය අනුව සහකාර කම්කරු කොමසාරිස්වරුන් (දෙපාර්තමේන්තුමය) දස දෙනෙකු බඳවා ගන්නා ලදී
- ශ්‍රී ලංකා තාක්ෂණ සේවය - විවෘත සහ සීමිත විභාගය නැවත පවත්වන ලෙස ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය වෙත දන්වන ලදී

සිරිත් පරිදි සිදු කෙරෙන කටයුතුවලට අමතරව කොවිඩ් 19 වසංගත තත්වය හමුවේ දෙපාර්තමේන්තුවේ සේවා අඛණ්ඩව පවත්වාගනෙ යාම සඳහා පහත ක්‍රියාකාරකම් සිදු කරන ලදී.

- 2021.11.01 දින සිට ගර්භණී නිලධාරීනියන් හැර අනෙකුත් සියලුම නිලධාරින් සේවයට කැඳවීමට කටයුතු කළ අතර 2022.01.01 දින සිට ගර්භණී නිලධාරීනියන්ද ඇතුළුව සියලුම නිලධාරින් සේවයට කැඳවීමට කටයුතු කරන ලදී
  සෞඛ්‍ය මාර්ගෝපදේශයන් යටතේ රාජකාරි ඉටු කිරීම සඳහා පහත ක්‍රියාමාර්ග ගන්නා ලදී
- කාර්ය මණ්ඩල සහ සේවාලාභීන් විසින් අනුගමනය කළ යුතු සෞඛ්‍ය මාර්ගෝපදේශයන් ප්‍රදර්ශනය කිරීම
- අංශ / කාර්යාලවල පොදුවේ භාවිතා කරන ස්ථාන, කවුන්ටර් වැනි ස්ථාන, කෑම කාමර, වැසිකිලි හා හවුල් අවකාශයන් දෛනිකව පිරිසිදුව හා සනීපාරක්ෂිතව නඩත්තු කිරීම
- කාර්යාල පරිශ්‍රයට ඇතුළුවීමට පෙර ශරීර උෂ්ණත්වය පරීක්ෂා කිරීම, අත් සේදීම වැනි පහසුකම් සැපයීමට කටයුතු කිරීම
- සේවා ලබා ගැනීමට පැමිණෙන මහජනතාව සීමිත ඉඩකඩ තුළ රැස්වීමෙන් ඇති වන අවධානම් තත්ව මඟ හරවා ගැනීමට විධිමත් ක්‍රමවේද සකස් කර ක්‍රියාත්මක කරන අතර ඒ සඳහා සුදුසු අධීක්ෂණ නිලධාරියකු පත් කර එම කටයුතු නිසි ලෙස අධීක්ෂණය කිරීම
- හැකි සෑම අවස්ථාවකදීම නිලධාරීන් සමූහ වශයෙන් එකතු වන අවස්ථාවන් හා අංශ අතර සංචරණයන් අවම වන ලෙස කටයුතු කිරීම
- දෙපාර්තමේන්තු නිලධාරීන් සඳහා කොවිඩ් 19 මර්ධන එන්නත් පළමු සහ දෙවන මාත්‍රා ලබා දීමට අදාළ කටයුතු සිදු කිරීම
- භෞතිකව සිදු කරන සාකච්ඡා, සම්මන්ත්‍රණ, රැස්වීම් හා සමූහ ඒකරාශී වීම් අවම කිරීම හා ඒ වෙනුවට Zoom, Teams හෝ ඒ හා සමාන තාක්ෂණික ක්‍රමවේද යොදා ගැනීම

### II. කම්කරු දෙපාර්තමේන්තුවේ ඉදි කිරීම් කටයුතු

ගොඩනැගිලි නඩත්තු ඒකකය මඟින් දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි ඉදි කිරීමට සහ ගොඩනැගිලි පුනරුත්ථාපනයට හා වැඩි දියුණු කිරීමට අදාළ කටයුතු සම්බන්ධයෙන් වාර්ෂික අයවැය ඇස්තමේන්තු සහ ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම සඳහා සහය වීම, ගොඩනැගිලි ඉදි කිරීම සම්බන්ධයෙන් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව ඇතුළු අනෙකුත් ආයතන සමඟ සම්බන්ධීකරණ කටයතු සිදු කිරීම, ගොඩනැගිලි පුනරුත්ථාපනය සහ වැඩි දියුණු කිරීමට අදාළ කටයුතු අධීක්ෂණය මෙන්ම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ සහ ප්‍රාදේශීය කාර්යාලවල සියලුම නඩත්තු කටයුතු සම්බන්ධයෙන්ද කටයතු කරනු ලබයි.

ඒ අනුව, 2021 වර්ෂයේදී පහත කාර්යාලයන්හි යටිතල පහසුකම් සංවර්ධනය කරන ලදී.

**වගුව 2-23** කම්කරු දෙපාර්තමේන්තුවේ ඉදි කිරීම් කටයුතුවල ප්‍රගතිය

| සැලසුම් කළ ප්‍රධාන ක්‍රියාකාරකම් / ව්‍යාපෘති | 2021 වසර සඳහා ප්‍රතිපාදනය (රු.) | 2021.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය රු. | 2021.12.31 දිනට භෞතික ප්‍රගතිය |
|---|---|---|---|
| බදුල්ල දිස්ත්‍රික් කම්කරු කාර්යාලය ඉදිකිරීම (අදියර 1) | 126,080,000.00 | 126,080,000.00 | 95% |
| හැටන් දිස්ත්‍රික් කම්කරු කාර්යාලය ඉදිකිරීම (අදියර 1) | 71,719,000.00 | 71,719,000.00 | 95% |
| කුරුණෑගල දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ අතිරේක වැඩ ඇස්තමේන්තුව කිරීම සහ ගිනි ආරක්ෂණ පද්ධතිය සවි කිරීම | 2,200,000.00 | 2,200,000.00 | 96% |

අළුතින් ඉදිකරන ලද කුරුණෑගල දිස්ත්‍රික් කම්කරු කාර්යාලය සහ අම්බලන්ගොඩ උප කම්කරු කාර්යාලය 2021 වර්ෂයේදී ගරු කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමාගේ සුරතින් විවෘත කර කාර්යාල කටයුතු ආරම්භ කරන ලදී. එසේම, මෙහෙවර පියෙස ගොඩනැගිල්ලේ 8, 9, 10, 11 සහ 12 මහල්වල අභ්‍යන්තර නිර්මිත සකස් කිරීමේ කටයුතු සඳහා ආයතනයක් තෝරා ගෙන කොන්ත්‍රාත් පිරිනැමීමට කටයුතු කර ඇත.

### III. පුස්තකාලය, කෞතුකාගාරය සහ තොරතුරු සේවාව

කම්කරු දෙපාර්තමේන්තුවේ පුස්තකාලය කම්කරු ක්ෂේත්‍රයට අදාළ අණපනත්, පොත්පත් හා ප්‍රකාශන සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ පවතින ප්‍රධානතම පුස්තකාලය වේ. මෙමඟින් කම්කරු

දෙපාර්තමේන්තුවේ, කම්කරු අමාත්‍යාංශයේ සහ ඒ යටතේ පවතින අනෙකුත් ආයතනවල කාර්ය මණ්ඩල සඳහා මෙන්ම බාහිර පාඨකයන් සඳහා ද කම්කරු ක්ෂේත්‍රයට අදාළ සියලුම අණපනත්, පොත් පත්, ප්‍රකාශන ආදිය පරිශීලනය සඳහා පහසුකම් සලසනු ලබයි. කම්කරු දෙපාර්තමේන්තුවේ පුස්තකාලය තුළ පොත්පත්, ප්‍රකාශන හා සඟරා 180,000කට අධික සංඛ්‍යාවක් තැන්පත් කර ඇත. පුස්තකාලය විසින් පොත් බැහැරදීමේ සේවාව, විමර්ශන සේවාව, ඡායා පිටපත් සේවාව, පුවත්පත් ලිපි එකතුව, පටුන පිටු සේවාව සහ අන්තර් පුස්තකාල පිරුළු සේවාව යන සේවා ද සපයනු ලැබේ. 2021 වර්ෂයේදී පුස්තකාලය සඳහා දේශීය පොත් 246ක් දේශීය සඟරා 05ක් සහ විදේශීය සඟරා 36ක් ලබා ගැනීමට කටයුතු කරන ලදී

කම්කරු ක්ෂේත්‍රය හා බැඳී පවතින පැරණි අණපනත් හා කම්කරු ක්ෂේත්‍රය හා ලේඛණ සංරක්ෂණය කිරීම සඳහා කම්කරු දෙපාර්තමේන්තුව විසින් කෞතුකාගාරයක් ද පවත්වා ගෙන යනු ලැබේ. ශ්‍රී ලංකාවේ කම්කරු ක්ෂේත්‍රය ආරම්භයේ සිට අද දක්වා විකාශනය වූ අයුරු එම කෞතුකාගාරය මඟින් මැනවින් පිළිබිඹු කරයි.

### 2.2.19 අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රගතිය

2021 අයවැයෙන් අමාත්‍යාංශයට සහ අනුබද්ධ ආයතනවලට වෙන් කර ඇති මූල්‍ය සම්පත් රාජ්‍ය ප්‍රතිපත්තිවලට අනුකූලව කාර්යක්ෂම, ඵලදායී සහ ආර්ථික පරිපාලනය සඳහා අවශ්‍ය පියවර ගෙන ඇත.

**වගුව 2-24** අමාත්‍යාංශයේ සමස්ත මූල්‍ය ප්‍රගතිය


| | ආයතනය | වැය විෂය | | ශුද්ධ ප්‍රතිපාදනය (රු. 000%) | වියදම (රු. 000%) | ඉතිරි ප්‍රතිපාදනය (රු. 000%) | වියදම් ප්‍රතිශතය (%) |
|---|---|---|---|---|---|---|---|
| 1 | අමාත්‍යාංශ කාර්යාලය | 193 | පුනරාවර්තන | 209,151 | 160,668 | 47,483 | 77% |
| | | | ප්‍රාග්ධන | 55,000 | 50,007 | 4,993 | 91% |
| 2 | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | | පුනරාවර්තන | 10,000 | 10,000 | 0 | 100% |
| | | | ප්‍රාග්ධන | 1,000 | 1,000 | 0 | 100% |
| 3 | ජාතික වෘත්තීය සුරක්ෂිතතා සහ සෞඛ්‍ය ආයතනය | | පුනරාවර්තන | 4,000 | 4,000 | 0 | 100% |
| | | | ප්‍රාග්ධන | 3,500 | 3,500 | 0 | 100% |
| 4 | ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය | | පුනරාවර්තන | 475,200 | 465,556 | 9,644 | 98% |
| | | | ප්‍රාග්ධන | 25,700 | 21,823 | 3,877 | 85% |
| 5 | කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය | | පුනරාවර්තන | 33,595 | 33,282 | 313 | 99% |
| | | | ප්‍රාග්ධන | 6,405 | 6,222 | 183 | 97% |
| | **උප එකතුව** | | **පුනරාවර්තන** | **731,946** | **673,506** | **58,440** | **92%** |
| | | | **ප්‍රාග්ධන** | **123,105** | **82,552** | **40,553** | **67%** |
| 6 | කම්කරු දෙපාර්තමේන්තුව | 221 | පුනරාවර්තන | 2,511,565 | 2,079,466 | 432,099 | 83% |
| | | | ප්‍රාග්ධන | 1,733,830 | 784,402 | 949,428 | 45% |
| | **එකතුව** | | **පුනරාවර්තන** | **3,243,511** | **2,752,972** | **490,539** | **85%** |
| | | | **ප්‍රාග්ධන** | **1,856,935** | **866,954** | **989,981** | **47%** |
| | **මුළු එකතුව** | | | **5,100,446** | **3,619,926** | **1,480,520** | **71%** |

### 2.2.20 අභ්‍යන්තර විගණන කටයුතු

#### 1 කම්කරු අමාත්‍යාංශය

අනෙකුත් සියලුම රාජ්‍ය අංශයේ ආයතන මෙන්ම, කම්කරු අමාත්‍යාංශය ද සිය සියලු කටයුතු මූල්‍ය රෙගුලාසි, රජය විසින් වරින් වර නිකුත් කරන චක්‍රලේඛ සහ අභ්‍යන්තර චක්‍රලේඛ අනුව ක්‍රියා කළ යුතුය. එවැනි ක්‍රියාකාරකම් ප්‍රශස්ත මට්ටමේ සම්පත් උපයෝජනයකින් සහ විනිවිදභාවයකින් සිදු කරන්නේද යන්න අධීක්ෂණය දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සෘජු අධීක්ෂණය යටතේ පවතී. ඒ අනුව, 2021.01.01 සිට 2021.12.31 දක්වා සිදු කරන ලද කටයුතු පහත පරිදි වේ.

**විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් සහ සිදුකළ විගණන පරීක්ෂණ**




| | කම්කරු අමාත්‍යාංශය | කම්කරු දෙපාර්තමේන්තුව | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය | කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය | ජාතික එළදායිතා ලේකම් කාර්යාලය |
|---|---|---|---|---|---|---|
| පැවැත් වූ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් ගණන | 4 | 3 | 4 | 3 | 4 | 4 |
| සිදුකළ විගණන පරීක්ෂණ ගණන | 4 | 9 | 4 | 4 | 4 | 4 |
| නිකුත් කළ විගණන විමසුම් හැර අනෙකුත් වාර්තා ගණන | 19 | 6 | 9 | 9 | 9 | 9 |

**ප්‍රස්තාරය 2-11** අභ්‍යන්තර විගණන කටයුතුවල ප්‍රගතිය

සටහන:

i. කම්කරු දෙපාර්තමේන්තුව වෙනුවෙන් අමාත්‍යාංශය විසින් සිදුකරන ලද විශේෂ විගණන විමර්ශන වාර්තා 02ක් ද ඇතුළත් කර ඇත.

ii. රැස්වීම් සඳහා සකස් කරනු ලබන වාර්තා, විශේෂ විගණන විමර්ශන වාර්තා සහ මූලික වාර්තාව ඇතුළත් කර ඇත.

#### 2 කම්කරු දෙපාර්තමේන්තුව

අනෙකුත් සියලුම රාජ්‍ය ආයතන මෙන්ම කම්කරු දෙපාර්තමේන්තුව විසින්ද සිය සියලු ක්‍රියාකාරකම් මුදල් රෙගුලාසි, රජය විසින් කලින් කලට නිකුත් කරන ලද චක්‍රලේඛ සහ දෙපාර්තමේන්තුව විසින්ම නිකුත් කරන ලද චක්‍රලේඛ ප්‍රකාරව විධිමත් පරිදි සිදු කළ යුතු වේ. ඒ අනුව, එම කටයුතු සම්පත්වල ඉහළ උපයෝගිතාවයක් සහිතව මනා විනිවිදභාවයකින් සහ ප්‍රශස්ත මට්ටමින් සිදුවේද යන්න අධීක්ෂණය කම්කරු කොමසාරිස් ජනරාල්ගේ සෘජු අධීක්ෂණය යටතේ සිදු වේ. ඒ අනුව, 2021 වර්ෂයේදී සිදු කරන ලද කාර්යයන් පහත පරිදි වේ.

- 2021 වර්ෂයේදී අභ්‍යන්තර විගණන අංශය විසින් වර්ෂයට අදාළව සකස් කරන ලද විගණන සැලැස්ම අනුව දිස්ත්‍රික් කම්කරු කාර්යාල සහ ප්‍රධාන කාර්යාලයේ අංශද ආවරණය වන පරිදි අභ්‍යන්තර විගණන පරීක්ෂණ නවයක් සිදු කරන ලදී
- රජයේ විගණන අංශය මඟින් දෙපාර්තමේන්තුවේ විවිධ කාර්යාල පරීක්ෂා කර නිකුත්කර තිබූ විගණන විමසුම් 12ක් සඳහා පිළිතුරු සපයන ලදී
- 2021 වර්ෂය තුළ කාර්තුමය වශයෙන් විගණන හා කළමනාකරණ රැස්වීම් තුනක් පවත්වන ලදී

# තුන්වන පරිච්ඡේදය

## 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්යසාධනය

## 3.1 2021.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

| | | | | | ඒසීඒ-එෆ් |
|---|---|---|---|---|---|
| | | | තතය | | |
| අයවැය 2021 | | සටහන | 2021 (රු.) | නැවත ගලපන ලද 2020 (රු.) | |
| - | **ආදායම් ලැබීම්** | | - | - | |
| - | ආදායම් බදු | 1 | - | - | |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - | ඒසීඒ-1 |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | - | - | |
| - | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | - | - | |
| - | **මුළු ආදායම් ලැබීම් (අ)** | | - | - | |
| - | **ආදායම් නොවන ලැබීම්** | | | | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 709,243,000 | 597,229,588 | ඒසීඒ-3 |
| - | තැන්පතු | | 185,421,121 | 145,447,356 | ඒසීඒ-4 |
| - | අත්තිකාරම් ගිණුම් | | 18,019,240 | 10,393,617 | ඒසීඒ-5 |
| - | වෙනත් ලැබීම් | | - | 28,682,525 | |
| **-** | **මුළු ආදායම් නොවන ලැබීම් (ආ)** | | **912,683,361** | **781,753,086** | |
| **-** | **මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ) + (ආ)** | | **912,683,361** | **781,753,086** | |
| | **භාණ්ඩාගාර ප්‍රේෂණ (ඈ)** | | | | |
| | **ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ) - (ඈ)** | | | | |
| | **අඩුකළා : වියදම්** | | | | |
| - | **පුනරාවර්තන වියදම්** | | | | |
| 502,440,000 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 483,931,657 | 448,056,510 | |
| 169,642,000 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 111,842,416 | 127,232,243 | |
| 78,513,000 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 7 | 77,435,090 | 54,723,510 | ඒසීඒ-2 (ii) |
| - | පොලී ගෙවීම් | 8 | - | - | |
| 400,000 | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | 297,910 | - | |
| **750,995,000** | **මුළු පුනරාවර්තන වියදම් (ඊ)** | | **673,507,073** | **630,012,263** | |
| | **මූලධන වියදම්** | | | | |
| 11,300,000 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් | 10 | 8,551,062 | 3,007,462 | |
| 18,905,000 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | 11 | 17,456,540 | 2,078,047 | |
| 4,500,000 | ප්‍රාග්ධන මාරුකිරීම් | 12 | 4,500,000 | 2,200,000 | ඒසීඒ-2(ii) |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | 13 | - | - | |
| 67,300,000 | හැකියා වර්ධනය | 14 | 21,613,741 | 6,023,249 | |
| 47,000,000 | වෙනත් මූලධන වියදම් | 15 | 30,431,303 | 4,465,785 | |
| **149,005,000** | **මුළු මූලධන වියදම් (උ)** | | **82,552,646** | **17,774,542** | |
| - | තැන්පතු ගෙවීම් | | 191,277,136 | 151,093,603 | ඒසීඒ-4 |
| - | අත්තිකාරම් ගෙවීම් | | 20,563,393 | 5,229,218 | ඒසීඒ-5 |
| - | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම් | | - | - | |
| | **ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)** | | **211,840,529** | **156,322,821** | |
| - | **මුළු වියදම් එ = (ඊ + උ + ඌ)** | | 967,900,249 | 804,109,627 | |
| - | **2021 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය ඒ = (ඉ - එ)** | | (55,216,888) | (22,356,541) | |
| | අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය | | (55,216,888) | - | ඒසීඒ -7 |
| | දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය | | - | - | ඒසීඒ-3 |
| | | | (55,216,888) | (22,356,541) | |

## 3.2 2021.12.31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

| | | | ඒසීඒ-පී |
|---|---|---|---|
| | | තතය | |
| | සටහන | 2021 (රු.) | 2020 (රු.) |
| **මූල්‍ය නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ-6 | 665,072,565 | 582,687,237 |
| **මූල්‍ය වත්කම්** | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඒ-5 | 58,068,525 | 55,524,372 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ-3 | | |
| **මුළු වත්කම්** | | **723,141,091** | **638,211,609** |
| **ශුද්ධ වත්කම් / ස්කන්ධය** | | | |
| ශුද්ධ වත්කම් | | 47,449,805 | 38,779,611 |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 665,072,565 | 582,687,237 |
| **ජංගම වගකීම්** | | | |
| තැන්පතු ගිණුම් | ඒසීඒ-4 | 10,618,721 | 16,474,737 |
| අග්‍රිම ශේෂය | ඒසීඒ-3 | | 270,024 |
| **මුළු වගකීම්** | | **723,141,091** | **638,211,609** |

පිටු අංක 9 සිට 55 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 56 සිට 67 දක්වා ඇතුළත් අනෙකුත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක්, වාර්තාකරන ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචනය සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

.............................................
**ප්‍රධාන ගණන්දීමේ නිලධාරී**
නම : එම් පී ජී යූ කේ මායා පතිරණ
තනතුර : ලේකම්
කම්කරු අමාත්‍යාංශය
දිනය : 7 වන මහල, "මෙහෙවර පියස"
නාරාහේන්පිට
කොළඹ - 05

.............................................
**ගණන්දීමේ නිලධාරී**
නම : [illegible]
තනතුර : ප්‍රධාන ගණකාධිකාරී
කම්කරු අමාත්‍යාංශය,
දිනය : 8 වන මහල, "මෙහෙවර පියස"
නාරාහේන්පිට,
කොළඹ 05.



## 3.3 2021.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

| | | ඒසීඒ-සී |
|---|---|---|
| | තතය | |
| | 2021 (රු.) | නැවත ගලපන ලද 2020 (රු.) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |
| මුළු බදු ලැබීම් | - | - |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | - | - |
| ලාභ | | |
| වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | 27,145,688 | 28,682,525 |
| අග්‍රිම ලැබීම් | 709,243,000 | 628,523,532 |
| අත්තිකාරම් අයකරගැනීම් | 17,971,754 | 7,517,242 |
| තැන්පතු ලැබීම් | 185,421,121 | 145,447,356 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)** | **939,781,563** | **810,170,655** |
| **අඩුකළා : මුදල් වැය කිරීම්** | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | 627,442,551 | 612,095,558 |
| සහනාධාර සහ මාරුකිරීම් | 81,935,090 | 11,200,000 |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | 974,412 | 2,134,705 |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | | 31,293,944 |
| අත්තිකාරම් ගෙවීම් | 20,695,833 | 6,856,889 |
| තැන්පතු ගෙවීම් | 191,277,136 | 151,093,603 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)** | **922,325,023** | **814,674,699** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ) = (අ) - (ආ)** | **17,456,540** | **(4,504,044)** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |
| පොළී | - | - |
| ලාභාංශ | - | - |
| හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | - | - |
| උපණය අයකර ගැනීම් | | - |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)** | **-** | **-** |
| **අඩුකළා : මුදල් වැය කිරීම්** | | |
| භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම් | 17,456,540 | 6,788,450 |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)** | **17,456,540** | **6,788,450** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ) = (ඈ) - (ඉ)** | **(17,456,540)** | **(6,788,450)** |
| **මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ) = (ඇ) + (ඊ)** | **-** | **(11,292,494)** |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |
| දේශීය ණය ගැනීම් | - | - |
| විදේශීය ණය ගැනීම් | - | - |
| ප්‍රදානයන් ලැබීම් | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)** | **-** | **-** |
| **අඩුකළා : මුදල් වැය කිරීම්** | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| තැන්පත් ගිණුම් හා අනෙකුත් වගකීම්වල වෙනස්වීම් | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)** | **-** | **-** |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ) = (ඌ) - (එ)** | **-** | **-** |
| **මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ) - (ඒ)** | **-** | **-** |
| **ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය** | **-** | **-** |
| **දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය** | **-** | **-** |

### 3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදු කර ඇති අතර මෙහි දී වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. අවසන් ගිණුමෙහි ඇති සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් සහ අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති අතර ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වේ.

1. **වාර්තාකරන කාලපරිච්ඡේදය**
   2021 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරන කාලපරිච්ඡේදය වේ.
2. **පිළියෙල කිරීමේ පදනම**
   මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම්වල ඓතිහාසික පිරිවැය නැවත තක්සේරු කරන ලද වටිනාකමට වැඩිදියුණු කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.
   මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.
3. **ආදායම හඳුනා ගැනීම**
   හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවායේ බදු වන කාලසීමාව නොසළකා, ගිණුම් කාලසීමාව තුළ මුදල් ලැබීම් අනුව හඳුනාගනු ලැබේ.
4. **දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම**
   වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.
   දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.
5. **දේපළ, පිරියත හා උපකරණ සංචිතය**
   **මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.**
6. **මුදල් හා මුදල් සමාන දෑ**
   2021 දෙසැම්බර් 31 දිනට අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් මුදල් හා මුදල් සමාන දෑ සමන්විත වේ.
7. **මූල්‍ය ප්‍රකාශන ආකෘතියෙහි සිදුකරන ලද වෙනස්කම් හා පෙර වර්ෂයේ සංසන්දනාත්මක අගයන් නැවත ගැලපීම**
   2021 වසර සඳහා වන මූල්‍ය ප්‍රකාශන ආකෘතිවල සිදුකරන ලද වෙනස්කම් අනුව 2020 වසර සඳහා වන සංසන්දනාත්මක සංඛ්‍යාවල අදාළ ගැලපුම් සිදුකර ඇත.

### 3.5 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය

**වගුව 3-1** ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය

රු. ,000

| ආදායම් කේතය | ආදායම් කේතයේ විස්තරය | ආදායම් ඇස්තමේන්තුව | | එකතු කරන ලද ආදායම | |
|---|---|---|---|---|---|
| | | මුල් ඇස්තමේන්තුව | අවසන් ඇස්තමේන්තුව | ප්‍රමාණය (රු.) | අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස |
| හිස් වාර්තාවකි | | | | | |

### 3.6 වෙන් කරන ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය

**වගුව 3-2** වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය

රු. ,000

| ප්‍රතිපාදන වර්ගය | වෙන් කරන ලද ප්‍රතිපාදනය | | තත්‍ය වියදම | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදනය | අවසාන ප්‍රතිපාදනය | | |
| පුනරාවර්තන | 753,600 | 750,995 | 673,507 | 90 |
| ප්‍රාග්ධන | 146,400 | 149,005 | 82,553 | 55 |



### 3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම අමාත්‍යාංශයට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

**වගුව 3-3** වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම අමාත්‍යාංශයට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු. ,000

| අ. අ. | ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදනයේ අරමුණු | වෙන් කරන ලද ප්‍රතිපාදනය | | තත්‍ය වියදම | උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදනවල % ලෙස |
|---|---|---|---|---|---|---|
| | | | මූල් ප්‍රතිපාදනය | අවසාන ප්‍රතිපාදනය | | |
| 01 | රාජ්‍ය සේවා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය | නවක උපාධිධාරී අභ්‍යාසලාභීන්ගේ දීමනා ගෙවීම සඳහා | - | 600 | 540 | 90 |
| 02 | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව | විශ්‍රාම ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු මුදල් නිරවුල් කිරීම | - | 434 | 434 | 100 |

### 3-8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

**වගුව 3-4** මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

රු. ,000

| වත්කම් කේතය | කේත විස්තරය | 2021.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය | 2021.12.31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය | ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත | ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැගිලි හා ව්‍යුහයන් | 31,823 | 31,823 | - | - |
| 9152 | යන්ත්‍රෝපකරණ | 633,249 | 633,249 | - | - |
| 9153 | ඉඩම් | - | - | - | - |
| 9154 | අස්පෘශ්‍ය වත්කම් | - | - | - | - |
| 9155 | ජීව විද්‍යාත්මක වත්කම් | - | - | - | - |
| 9160 | කෙරීගෙන යන වැඩ | - | - | - | - |
| 9180 | බදු දෙන ලද වත්කම් | - | - | - | - |

### 3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No.: LSW/B/MOL/SR/01/2021 — ඔබේ අංකය / உமது இல. / Your No.: — දිනය / திகதி / Date: 2022 ... දින

1466
2 .. JUN 2022
28 JUN 2022
MINISTRY OF LABOUR
SECRETARY'S OFFICE
Time:.............

ලේකම්,
කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය.

**කම්කරු අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11 (1) වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව**

---

යථෝක්ත වාර්තාව හා මූල්‍ය ප්‍රකාශනයේ මුල් පිටපත (සිංහල,දෙමළ, ඉංග්‍රීසි) මේ සමඟ එවා ඇත.

ජේ.සී.පී.සේනාරත්න.
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති,
විගණකාධිපති වෙනුවට.

පිටපත : අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව.

+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No.: එල්එස්ඩබ්/බී/එම්ඕඑල්/එස්ආර්/01/2021 — ඔබේ අංකය / உமது இல. / Your No.: — දිනය / திகதி / Date: 2022 ජූනි 22 දින

ලේකම්,
කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය

**කම්කරු අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

කම්කරු අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශයවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කම්කරු අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව ඉදිරියේදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට කම්කරු අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

පිටුව 1 | 14

+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්





ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධින් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

### 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

#### 1.6.1.1 මූල්‍ය නොවන වත්කම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම්වල ශේෂය රු.582,687,237 ක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දක්වා තිබුණද, මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයට අනුව එය රු.647,939,499 ක් වීමෙන් ආරම්භක ශේෂයන්ගේ රු.65,252,262 ක වෙනසක් නිරීක්ෂණය විය. මෙම වෙනසට හේතුව ගිණුම් සටහනක් මගින් හෝ අනාවරණය කර නොතිබුණි.

(ආ) 2021 වර්ෂයේදී ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය සඳහා ආසියානු ඵලදායිතා සංවිධානය මගින් ආධාර වශයෙන් ලබාදී තිබූ USD 20,000 ක පරිගණක උපාංග විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හරහා ලබාගෙන නොතිබුණු අතර මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයටද ඇතුලත් කර නොතිබුණි.

(ඇ) මූල්‍ය ප්‍රකාශනවල ACA-6 ආකෘතිය මගින් ඉදිරිපත් කර තිබූ මූල්‍ය නොවන වත්කම්වල වටිනාකම රු.633,226,812 හා විගණනයට ඉදිරිපත් කර තිබූ තොරතුරු අනුව මූල්‍ය නොවන වත්කම්වල වටිනාකම රු.575,624,796 වීමෙන් රු.57,602,016 ක වෙනසක් නිරීක්ෂණය විය. මේ අනුව 2021 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි මුළු වත්කම් එම ප්‍රමාණයෙන් අධිගණනය වී තිබුණි.

### 1.6.2 නොසැසඳුනු ශේෂයන්

විගණනයට ඉදිරිපත් කරන ලද කම්කරු අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනට ශේෂ පිරික්සුමට වර්ෂය තුලදී භාණ්ඩාගාරයෙන් ලැබී තිබූ රු.709,243,000 ක් ඇතුලත් කර නොතිබුණු අතර ශේෂ පිරික්සුමට ඇතුලත් කර තිබූ 249/21 අග්‍රිම ගිණුමෙහි ලැබීම් හා ගෙවීම් අතර රු.707,153,000 ක වෙනසක් ද පැවතුණි.





## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයන් 17 කට අදාලව සලසා තිබූ රු.32,500,000 ක් වූ අයවැය ප්‍රතිපාදනයෙන් වැය විෂයන් 10 ක් සඳහා වූ රු.24,287,000 ක ප්‍රතිපාදන අමාත්‍ය මණ්ඩල ලේකම්වරයාගේ 2021 අගෝස්තු 31 දිනැති අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 21/1596/304/134 අනුව නැවත පවරා දී තිබුණි. මෙයට වැය විෂයන් 5 ක් සඳහා වන මූල්‍ය ප්‍රතිපාදන ඇතුලත්ව තිබූ අතර වැය විෂයන් 4 ක් සඳහා ප්‍රතිපාදන පැවරීමෙන් පසු ඉතිරි වූ රු.1,013,000 ක් හා ඉතිරි වැය විෂයයන් 7 සඳහා වූ මුළු ප්‍රතිපාදනය වූ රු.1,650,000 ක එකතුව රු.2,663,000 කින් 2021 වර්ෂය තුල කිසිදු වියදමක් දරා නොතිබුණි. එහි ඉතිරිය සියයට 100 ක් ව පැවතුණි.

(ආ) වැය විෂයන් 27 කට අදාලව සලසා තිබූ රු.104,400,000 ක ප්‍රතිපාදනයෙන් රු.45,122,000 නැවත පවරාදී තිබූ අතර 2021 වර්ෂය අවසන් වන විට උපයෝජනය කර තිබුණේ රු.32,813,486 ක් පමණි. මෙම වැය විෂයන් අතරින් වැය විෂයන් 16 ක් සඳහා ඉතිරිවීමේ ප්‍රතිශතය සියයට 50 සිට සියයට 98 දක්වා පරාසයක පැවතුණි.

(ඇ) 193-02-05-2001 වැය විෂයය යටතේ වෙන්කර තිබූ රු.4,000,000 ක ප්‍රතිපාදනය සියයට 100 ක් උපයෝජනය කල ලෙසට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණද වන්දි කොමසාරිස් කාර්යාලයේ බෙදුම් ඇදි සවි කිරීමේ කාර්යය වෙනුවෙන් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත මෙම ගෙවීම සිදුකර තිබුණු අතර 2022 ජුනි 17 වන විටද මෙම ව්‍යාපෘතිය ආරම්භ කිරීම හෝ සිදුකර නොතිබුණි.

(ඈ) 2021 වර්ෂයේදී 193-2-5-2103 වැය විෂයය යටතේ යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ අත්පත් කර ගැනීම හා 193-2-5-2102 ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ අත්පත් කර ගැනීම සඳහා වූ ඇස්තමේන්තුව [illegible] සියයට 400 කට අධික ප්‍රමාණයකින් වැඩිවන පරිදි සංශෝධනය වී තිබූ අතර එයට හේතුව ලෙස නිලධාරීන්ට තම රාජකාරිය නිසි ආකාරව සිදුකිරීමට තිබෙන පරිගණක ප්‍රමාණවත් නොවන බව දක්වා තිබුණි. ඒ අනුව මෙය වර්ෂය ආරම්භයට පෙර හඳුනානොගත් බැවින් මු.රෙ. 3 අනුව වියදම් සැලසුම් කිරීම නිසි පරිදි සිදුවී නොතිබුණි.

## 2.2 බලය නොලත් කාරක පාඩු

රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම සඳහා වූ අවම ලැබීම් සීමාව ඇස්තමේන්තුවට අනුව රු.20,000,000 ක් වුවද, 2021 වර්ෂය තුළ ලැබීම්වල වටිනාකම රු.13,916,095 කි. මෙම ලැබීම් සීමාව රු.12,000,000 ක් දක්වා සංශෝධනය කල බව මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර තිබුණද, භාණ්ඩාගාර ගිණුම්වල අවම ලැබීම් සීමාව රු.20,000,000 ලෙස දක්වා තිබුණි. ජාතික අයවැය දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්ගේ 2021 දෙසැම්බර් 31 දිනැති ලිපිය මගින් මෙම සීමාවන් සංශෝධනය කිරීම සඳහා නිර්දේශ කිරීමට කටයුතු කරන  බව දන්වා තිබුණද, භාණ්ඩාගාර ගිණුම්වල එම සංශෝධනය සිදුවී නොතිබුණි. එසේම, 2021 මුදල් වර්ෂය සඳහා රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම් මුදල් සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සීමා වෙනස් කිරීම සඳහා 2022 මැයි මස 30 දින බලය ලබාදෙන සීමා වෙනස් කිරීම් මැයෙන් 2022 ජූනි 08 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇත.

## 2.3 බැරකම් හා බැදීම්වලට එළඹීම

මූල්‍ය ප්‍රකාශනවල පෙන්වන රු.153,730 ක බැරකම් භාණ්ඩාගාර පොත්වල සටහන් නොවීම, 193-1-7-0-2401 වැය විෂය යටතේ පෞද්ගලික ආයතනයකට ගෙවිය යුතු රු.308,000 ක් වැඩිපුර මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් වීම හා එම වැය විෂයය යටතේම බදුල්ල දිස්ත්‍රික් කාර්යාලය විසින් භාණ්ඩාගාරයට වාර්තා කර තිබූ රු.4,518,165 ක් මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් නොවීම යන හේතූන් මත භාණ්ඩාගාර සටහන්වලට වඩා මූල්‍ය ප්‍රකාශනයෙහි රු.4,056,435 ක් අඩුවෙන් බැරකම් වාර්තා කර තිබුණි.

## 2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම.

| නීතිරීති / විධානයට යොමුව | නිරීක්ෂණ |
|---|---|
| (අ) විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අංක SC & PMU/Grant/20 හා 2020 අගෝස්තු 14 දිනැති ලිපියේ හා මු.රෙ. 610 සිට 626 දක්වා සඳහන් විධිවිධාන | මෙම ලිපියෙහි උපදෙස් අනුගමනය කිරීමකින් තොරව හා ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල් ඇමතීමක් නොමැතිව ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය විසින් 2021 වර්ෂයේදී ආසියානු ඵලදායිතා සංවිධානයෙන් රු.18,427,300 ක්වූ විදේශාධාර සෘජුවම ලබාගෙන තිබුණි. එයින් 2021 වර්ෂයේදී රු.12,757,400 ක් හා 2022 වර්ෂයේදී රු.5,669,900 පොදු තැන්පත් ගිණුමට බැර කර තිබුණු අතර උපයෝජනය කිරීමට පෙර පරිපූරක හා විරමෝං ක්‍රියා පටිපාටිය මගින් ඇස්තමේන්තු ප්‍රතිපාදන සලසා ගෙන නොතිබුණි. |





## 2.5 අත්තිකාරම් නිකුත් කිරීම හා පියවීම

සේවය අතහැර ගොස් වසර 5 කට වැඩි කාලයක් ඉක්ම ගොස් තිබූ කළමණාකරණ සහකාරවරියකගෙන් අයවිය යුතු 138,501 ක මුදල, 2022 මැයි 04 දින වන විටත් අයකර ගත නොහැකිව පැවතුණි.

## 2.6 තැන්පතු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2021 වර්ෂයේදී විදේශාධාර ලෙස ලද රු.12,757,400 ක් ඵලදායිතා ලේකම් කාර්යාලයේ පොදු තැන්පත් ගිණුමට බැර කර තිබුණි.

(ආ) 2021 දෙසැම්බර් 31 වන විට රු.10,014,543 ක වන්දි මුදල් 6000-0-0-17-0-26 දරන පොදු තැන්පත් ගිණුමෙහි රඳවා තිබුණි. මේ තුළ ඇතුලත් වන්දි ලැබී වසර 2 ඉක්මවූ වටිනාකම රු.536,326 ක් වූ අතර වන්දි මුදල් තැන්පත් කර වසර 1 ත් 2 ත් අතර අගය රු.1,371,986 ක් විය. තැන්පත් කර මාස 6 ත් වසරත් අතර අගය රු. 2,971,667 ක් විය.

(ඇ) වන්දි මුදල් ලැබීමෙන් පසුව විවිධ හේතූන් මත හිමිකරුවන් වෙත ලබානොදුන් වන්දි මුදල්වලින් රු.2,023,096 ක් සඳහා වන්දි කොමසාරිස් නමින් ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ ගිණුම් ආරම්භකර තිබුණි. මෙම මුදල් ගිණුම්වල තැන්පත් කර මාස 22 සිට මාස 48 දක්වා කාලයක් ගතවී තිබුණද උසාවි කටයුතු අවසන් නොවීම හේතුවෙන් හිමිකරුවන් වෙත නිදහස් කිරීමට නොහැකි වී තිබුණි.

## 2.7 බැංකු ගිණුම් මෙහෙයවීම

අමාත්‍යාංශයේ ගිණුම් අංක 10015902566 ට අදාලව 2021 දෙසැම්බර් 30 හා 31 දිනවලදී ආයතන 5 ක් සඳහා ලියා තිබූ රු.9,724,913 ක් වටිනා චෙක්පත් 7 ක් අතරින් 5 ක් අදාල පුද්ගලයන් වෙත නිකුත් කිරීම 2022 මැයි මසද චෙක්පත් 2 ක් 2022 මාර්තු මස ද සිදුවී තිබීම හේතුවෙන් මෙම චෙක්පත් ලිවීම, වැඩ නිම නොවූ කාර්යයන් වෙනුවෙන් ප්‍රතිපාදන රඳවා තබාගැනීමේ අරමුණින් සිදුකර තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

#### 3.1.1 දැක්ම හා මෙහෙවර

අමාත්‍යාංශය ප්‍රධාන කාර්යයක් ලෙස දක්වා තිබූ කම්කරු අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල විෂයන්ට අදාල ප්‍රතිපත්ති, වැඩසටහන් සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම පසුවිපරම කිරීම හා ඇගයීම යන කාර්යය හා සේවක අර්ථසාධක අරමුදල, පරිපාලනය කිරීම යන කාර්යය විධිමත් පරිදි ඉටුවී නොමැති බව පහත කරුණු අනුව හෙළිදරව් වේ.

(අ) සේවක අර්ථසාධක අරමුදලෙහි 2021 දෙසැම්බර් 31 දින වන විට කේවල ගිණුම්වලට බැර නොවූ රු.9,933,449,162 ක් ශ්‍රී ලංකා මහ බැංකුවේ කම්කරු කොමසාරිස් දායක ගිණුමේද රු.301,779,837 ක් දෙපාර්තමේන්තුවේ සේවක අර්ථසාධක අරමුදල් තැන්පත් ගිණුමේ හා දෙපාර්තමේන්තු උප කාර්යාලවලද තැන්පත් ගිණුම්වල රැඳී තිබීම.

(ආ) 2021 වර්ෂය වන විටද පෞද්ගලික ආර්ථසාධක අරමුදලද නිසි අධීක්ෂණයක් සිදුවී නොතිබීම.

(ඇ) විශේෂ විමර්ශන අංශයට ලැබුණු පෙත්සම්වලින් 2021 සැප්තැම්බර් වන විට 2015 සිට 2020 දක්වා වර්ෂයට අදාලව පැමිණිලි 308 ක් ලැබී තිබූ අතර ඉන් සියයට 57 ක් එනම්, 178 ක් විසදා නොතිබීම.

(ඈ) 2021 දෙසැම්බර් 31 වන විට අක්‍රියව පැවති නඩු සංඛ්‍යාව 5,151 ක් වන අතර එහි අයකර ගතයුතු වටිනාකම රු.3,108,693,249 ක් විය. විවෘත වරෙන්තු නඩු සංඛ්‍යාව 2,822 ක් හා අයකර ගතයුතු වටිනාකම රු.879,249,209 ක් වී තිබීම. වසර 1 සිට වසර 30 දක්වා කාලයකට අදාල නඩු මෙයට ඇතුලත්ව තිබීම.

(ඉ) 1934 අංක 19 දරණ කම්කරු වන්දි ආඥා පනත යටතේ පිහිටුවා ඇති වන්දි කොමසාරිස් කාර්යාලයේ දැක්ම ලෙසට, "ආපදාවකට හෝ මරණයකට පත්වන සේවකයන් වෙනුවෙන් සේවායෝජකයන්ගෙන් අප්‍රමාදව වන්දි අයකරදීම මගින් සේවක තෘප්තිය ඇති කිරීම" දක්වා තිබුණද, සේවයේ යෙදී සිටියදී සිදුවන මාරක හා මාරක නොවන අනතුරු සම්බන්ධව වන්දි අයකරදීමේ ක්‍රියාවලියේදී අධික ප්‍රමාදයන් සිදුවන බව විගණනයේදී අනාවරණය වීම.

පිටුව 8 | 14



#### 3.1.2 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලයේ වන්දි උසාවිය සඳහා බෙදුම් ඇදි සවි කිරීමේ කොන්ත්‍රාත්තුව අමාත්‍යාංශයේ වැය වැය ශීර්ෂයේ වැඩ සටහන් 2 ක් වන 193-1-2-2509 යටතේ හා 193-2-5-2001 යටතේ සලසා තිබූ ප්‍රතිපාදන උපයෝජනය කරගෙන රු.6,090,000 ක් 2021 දෙසැම්බර් 29 දින ගොඩනැගිලි අධ්‍යක්ෂ ජනරාල් වෙත ගෙවීම් කර තිබුණි. මේ සඳහා ලිඛිත ගිවිසුමක් නොතිබුණු අතර 2022 මාර්තු 15 දිනට කාර්ය නිමකරන බවට දැනුම් දී තිබුණ ද 2022 මැයි 25 දින වන විටද මෙම කාර්යය ආරම්භකර නොතිබුණු බැවින් ව්‍යාපෘතිය ඉටු කිරීමේ අධික ප්‍රමාදයන් සිදු වී තිබුණි.

#### 3.1.3 වාර්ෂික කාර්යසාධන වාර්තාව

2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කල මාර්ගෝපදේශ අංක 14 හි 01 පරිච්ඡේදයේ 1.5 අනුව විදේශාධාර ලබන ව්‍යාපෘති තිබේ නම් ඒවායේ තොරතුරු වාර්ෂික කාර්යසාධන වාර්තාව ඇතුලත් කල යුතු වුවද අමාත්‍යාංශය යටතේ ඇති ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලයට ආසියානු ඵලදායිතා සංගමය මගින් ලබාදී තිබූ ඩොලර් 90,000 ක මුදලින් මහියංගන රෝහලට අවශ්‍ය වෛද්‍ය උපකරණ ලබාදීමේ ව්‍යාපෘතිය පිළිබඳ තොරතුරු ඇතුලත් කර නොතිබුණි.

### 3.2 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අම්පාර නිවාඩු නිකේතනය පිහිටි ඉඩමෙහි රියදුරන් සඳහා නවාතැන් ගන්නා ස්ථානයක් (Driver's Lodge) ඉදිකිරීම වෙනුවෙන් වූ කොන්ත්‍රාත්තුව 2021 අගෝස්තු මස රු.5,095,983 ක වටිනාකමකට පුද්ගලික ආයතනයකට පවරා තිබුණි. කොන්ත්‍රාත් ගිවිසුමට අනුව ගෙවිය යුතු අත්තිකාරම් වටිනාකම 20% ක් වුවද ගිවිසුම් කොන්දේසි කඩකරමින් 2021 දෙසැම්බර් 29 දින රු.1,149,855 ක්ද 2021 දෙසැම්බර් 31 දින රු.3,617,753 ක් වශයෙන් (රඳවා ගැනීම් මුදල් අඩුකල පසු) කොන්ත්‍රාත්තුවේ මුළු වටිනාකම අත්තිකාරම් ලෙස ගෙවීමට කටයුතු කර තිබුණි.

(ආ) කොන්ත්‍රාත් ගිවිසුමට අනුව 2022 ජනවාරි මස අවසන් කල යුතුව තිබූ මෙම කොන්ත්‍රාත්තුව 2022 මැයි 25 වන විටද නිම වී නොතිබුණු අතර ගිවිසුම් ප්‍රකාරව ප්‍රමාද ගාස්තු අයකර ගැනීමටද කටයුතු කර නොතිබුණි.

පිටුව 9 | 14

**3.3 පාඩු හා හානි**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) හානිවීම් සිදුවී වසර 6 සිට 8 දක්වා කාලයක් ඉක්ම ගියද 2013 – 2015 කාලය තුල වාහන 5 කට වූ රු.403,939 ක හානි සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි අනුව කටයුතු කර අයකර ගැනීමට හෝ පොතෙන් කපාහැරීමට කටයුතු නොකර දිගින් දිගටම මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර තිබුණි.

(ආ) ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලයේ කාර්යමණ්ඩල වැටුප් සැකසීමේදී වැටුප් අංශයේ කළමණාකරණ සහකාර නිලධාරිනියක විසින් වැටුප් වංචාවක් සිදුකර තිබූ අතර ඒ සම්බන්ධයෙන් 2022 ජනවාරි 11 දින හෙළිදරව් කරගෙන තිබුණි. මෙම වැටුප් වංචාව 2018 අගෝස්තු මාසයේදී පමණ සිට 2020 දෙසැම්බර් දක්වා සිදුකර තිබූ අතර දළ වශයෙන් එහි වටිනාකම රු 5,133,520 ක් වී තිබුණි. ඒ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමක් සිදුකර නොතිබුණු අතර මාස 5 ½ ගතවී තිබුණ ද මූලික විමර්ශන අවසන් කර නොතිබුණි.

**3.4 අනාර්ථික ගණුදෙනු**

අමාත්‍යාංශ කාර්යය මණ්ඩලයට ආහාර අනුභවය සඳහා මෙහෙවර පියෙස ගොඩනැගිල්ලෙහි 6 වන මහලෙහි ස්ථානයක් සකක් කිරීම වෙනුවෙන් රාජ්‍ය දැව සංස්ථාවට රු.1,159,662 ක් 2021 දෙසැම්බර් 06 දින ගෙවීම කර තිබුණි. මෙහෙවර පියෙස 4 වන මහලෙහි වර්ග අඩි 11,286 ක ආපන ශාලාවක් ස්ථාපිත කර තිබිය දී අමාත්‍යාංශයේ නිලධාරීන් වෙනුවෙන් පමණක් ආහාර ගැනීමේ ස්ථානයක් සඳහා රු.1,159,662 ක් වැය කර තිබුණි. (ප්‍රසම්පාදන සැලැස්මට අනුව මේ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන 193-01-02-2001 වැය විෂයය යටතේ වෙන්කර තිබුණද, ගෙවීම කිරීමේදී 193-01-02-2102 වැය විෂයය යටතේ සිදුකර තිබුණි.)

**3.5 කළමනාකරණ දුර්වලතා**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ලීසිං වාරික ගෙවා අවසන්ව තිබූ ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය විසින් භාවිත කරනු ලබන වාහන 5 ක් අයිතිය පවරා ගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් එම වාහනවල පරම අයිතිය ලංකා බැංකුව සතුව තිබූ අතර තවත් වාහන 4 ක වර්තමාන අයිතිය ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය නමින් නොතිබුණි.

පිටුව 10 | 14

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

(ආ) 1934 අංක 19 දරණ කම්කරු වන්දි ආඥා පනතෙහි XII කොටසේ 57 (1) වගන්තිය අනුව සේවකයෙකුට සේවයේ යෙදී සිටියදී අනතුරක් සිදු වී දින 14 ක් තුල සේවායෝජකයා විසින් කම්කරු කොමසාරිස් වෙත වාර්තාවක් ඉදිරිපත් කලයුතු වුවද මේ සඳහා කිසියම් ක්‍රමවේදයක් සකස්කර නොතිබීම නිසා කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය වෙත වාර්තා වී තිබූ අනතුරු මාස 5 සිට අවුරුදු 12 දක්වා ප්‍රමාද වී ලැබී තිබූ බව ලේඛණ අනුව අනාවරණය විය.

(ඇ) කම්කරු අමාත්‍යාංශයේ භෞතිකව නොතිබුණු නමුත් කම්කරු අමාත්‍යාංශය නමින් ලියාපදිංචි කර ඇති වාහන 8 කින් එක් වාහනයක් හදිසි අනතුරකින් පසුව ගර්හිත තත්ත්වයට පත්කර 2018 වර්ෂයේදී රක්ෂණභාර අරමුදල වෙත පවරාදී තිබූ බව දරනුම් දී තිබුණද එම වාහනය 2021 වර්ෂයේදී නව ආදායම් බලපත්‍රයක් ලබාගෙන භාවිතා කරන බවත් අනෙක් වාහන 7 සම්බන්ධයෙන්ද තොරතුරු ලබාගෙන අදාල ආයතන වෙත පැවරීම 2021 වර්ෂය අවසන් වන විටද සිදු වී නොතිබුණි.

(ඈ) යහපත් රැකියා වාතාවරණයක් සඳහා වූ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම(සුහිසි මෙහෙවර) සඳහා වාර්ෂික ඇස්තමේන්තු මගින් සලසා තිබූ රු.45,000,000 ක ප්‍රතිපාදනය උපයෝජනය කරමින් වෙනත් මූලධන වැය විෂයයන් 03 ක් සඳහා රු.11,856,138 ක්ද 2021 වර්ෂයේ ප්‍රතිපාදන සලසා ගෙන නොතිබුණු කාර්යයක් වෙනුවෙන් රු.3,028,506 ක් වශයෙන් රු.14,884,644 ක් වැය කර තිබුණි.

(ඉ) ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලයේ ඵලදායිතා සංවර්ධන නිලධාරීන් 690 ක දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත කර ඇති අතර 2021 වර්ෂය තුල එම නිලධාරීන්ට වැටුප් ලෙස රු.383,416,233 ක් ගෙවා තිබුණි. ඵලදායිතා සංකල්ප ක්‍රියාත්මක කිරීම එම නිලධාරීන්ගේ ප්‍රධාන කාර්යයක් වුවද එම සංකල්ප ක්‍රියාත්මක කිරීම ඉතාමත් අවම මට්ටමක පැවති අතර ඇතැම් නිලධාරීන්ට ඵලදායිතා සංකල්ප පිළිබඳ විධිමත් අවබෝධයක්ද නොතිබුණි. ප්‍රධාන කාර්යාලය විසින් එම නිලධාරීන්ගේ කාර්යභාරය විධිමත් පරිදි නියාමනයක් සිදුවී නොතිබීමෙන් එම නිලධාරීන්ගේ කාර්යභාරය සම්බන්ධයෙන් ඵලදායීතාවය දුර්වල මට්ටමක පැවතුණි.

(ඊ) ඵලදායිතා සංවර්ධන නිලධාරීන් 138 ක් සේවයේ යෙදී සිටින ප්‍රදේශීය ලේකම් කාර්යාල හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල 75 ක් 2020 වර්ෂයේ ඵලදායිතා සම්මාන තරඟාවලියටද ඉදිරිපත් වී නොතිබුණි.

(උ) 1980 ජූලි වර්ජකයන්ට දීමනා ගෙවීම සඳහා ජාතික අයවැය දෙපාර්තමේන්තුවෙන් අයදුම්පත් නිර්දේශ කිරීමේදී කම්කරු අමාත්‍යාංශය විසින් එකම ප්‍රතිලාභීන්ගේ

පිටුව 11 | 14

අයදුම්පත් දෙකක් නිර්දේශ කිරීම හේතුවෙන් රු.1,000,000 ක වැඩිපුර ගෙවීමක් සිදුව තිබූ බව පසුගිය විගණන වාර්තාවෙන් පෙන්වාදීමෙන් පසුව අදාල දත්ත පද්ධතිය නිවැරදි කල බව විගණනය වෙත දන්වා තිබුණද, 2022 වර්ෂයට කරන ලද ගෙවීම් අනුව දත්ත පද්ධතිය යාවත්කාලීන කලද 2022 වර්ෂයට පෙර ගෙවීම් කරන ලද ප්‍රතිලාභීන් පිලිබඳ අයවැය දෙපාර්තමේන්තුවෙන් ලබාගත් තොරතුරු අනුව දත්ත පද්ධතිය යාවත්කාලීන නොවීම මත එම පුද්ගලයින් සඳහා නැවත අයදුම්පත් නිර්දේශ කිරීමේ අවධානම තවදුරටත් පැවතුණි. මාණ්ඩලික නිලධාරියෙකු විසින් අයදුම්පතෙහි නිවරද්‍යතාවය පරීක්ෂා කලද දත්ත පද්ධතිය යාවත්කාලීනවීම අධීක්ෂණය කර නොතිබුණි.

(ඌ) අම්පාර නිවාඩු නිකේතනය පිහිටි ඉඩම 2022 මැයි මස වන විටද කම්කරු අමාත්‍යාංශය වෙත පවරාගෙන නොතිබුණි.

## 4. යහපාලනය

### 4.1 මහජනයා වෙත සේවා ඉටු කිරීම

(අ) 2021 නොවැම්බර් 30 දින වන විට කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය වෙත වාර්තා වී තිබූ අනතුරු අතරින් මාරක අරතුරු 140 ක් හා මාරක නොවන අනතුරු 424 ක් සඳහා වන්දි අයකර දීමේ ක්‍රියාවලිය අවසන්ව නොතිබුණු අතර අනතුර වාර්තා වී වසර 5 ඉක්මවූ මාරක අනතුරු 14 ක් හා මාරක නොවන අනතුරු 29 ක් ද මේ තුල ඇතුලත්ව තිබුණි.

(ආ) කම්කරු අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණකගේ 2021 මාර්තු 22 දිනැති වාර්තාවට අනුව කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලයේ අහඹු ලෙස තෝරාගත් වසර 5 ඉක්මවූ ගොනු 10 ක් පරීක්ෂා කිරීමේදී වසර 03 සිට වසර 09 ක් දක්වා වූ කාලයක් පුරාවට නඩු වාර 13 සිට 52 දක්වා වූ වාර ගණනක් කැඳවා තිබූ නමුත් 2021 ජනවාරි වන විටත් විසඳුමක් ලැබී නොතිබුණු බව නිරීක්ෂණය විය.

ඒ අනුව වන්දි ඉල්ලුම්පත්‍රයක් ඉදිරිපත් කර වන්දි ලබා ගැනීමට අධික කාලයක් ගතවීමෙන් ලැබෙන වන්දි මුදලින් ලබාගත හැකි ප්‍රතිලාභයද ඔවුන්ට නොලැබී යා හැකි බැවින් වන්දි ලබාදීමේ ක්‍රියාවලියේදී අධික ප්‍රමාදයන් ඇති වීමට හේතුවන කරුණු විමසා බලා නිවැරදි කිරීමට පියවර ගෙන නොතිබුණි.

(ඇ) කම්කරු වන්දි උසාවියේ තීරණයන්ට එරෙහිව අභියාචනා කරන ලද ගොනු 13 කට අදාල සේවායෝජක විසින් වන්දි කාර්යාලයේ තැන්පත් කරන ලද රු.4,947,535 ක්





සඳහා ඉතිරි කිරීම් ගිණුම් ආරම්භ කර තිබූ අතර මින් රු.3,729,505 ක ඉතිරි කිරීම් තැන්පත් ගිණුම් 10 ක් ආරම්භ කර වසර 1 ත් 4 ත් අතර කාලයක් ගතවී තිබුණි.

(ඈ) රැකියාවේ යෙදී සිටියදී සිදුවන මාරක අනතුරු හේතුවෙන් මියයන සේවකයින්ගේ බාලවයස්කාර දරුවන්ට හිමිවන වන්දි මුදල් ඔවුන් වයස් සම්පූර්ණත්වයට පත්වන තෙක් ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ වන්දි කොමසාරිස් නාමින් වූ ස්ථාවර තැන්පතුවක ආයෝජනය කර වයස් සම්පූර්ණත්වයට පත්වූ පසු ඔවුන් වෙත නිදහස් කිරීම සිදුකල යුතු වුවද 2021 දෙසැම්බර් 20 වන විට පැවති එලෙස වයස් සම්පූර්ණත්වයට පත්ව නිදහස් නොකල ස්ථාවර තැන්පතුවල වටිනාකම රු.6,100,788 ක් විය.

(ඉ) අගතියට පත් පාර්ශවය සඳහා හිමිවිය යුතු බවට වන්දි උසාවියේදී තීරණය වුවද නඩු නියෝගය අනුව සේවායෝජක වන්දි මුදල නොගෙවීම හේතුවෙන් 2021 දෙසැම්බර් 31 දින වන විට නඩු 46 ක් වරෙන්තු වශයෙන් පැවති අතර එමගින් හිමිවිය යුතු වන්දි මුදල රු.13,419,197 ක් විය. මේ අතර වරෙන්තු නිකුත් කර වසර 10 ක් ඉක්ම වූ නඩු 10 කට අදාල රු.1,873,352 ක් ද වසර 5 – 10 ත් අතර නඩු 21 කට අදාල රු.6,917,546 ක් හා අවුරුදු 1 – 4 අතර නඩු 15 කට අදාල රු.4,628,298 ක් ද ඇතුලත් විය. මේ ආකාරයට වන්දි උසාවිය මගින් තීරණය වුවද වන්දිලාභියාට මෙම මුදල නොලැබීම මත වන්දි කොමසාරිස් කාර්යාලයේ අරමුණු ඉටු වී නොතිබුණි.

## 5. මානව සම්පත් කළමනාකරණය

### 5.1 අනුමත කාර්ය මණ්ඩලය, සත්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම

(අ) වන්දි කොමසාරිස් කාර්යාලයේ අනුමත කාර්ය මණ්ඩල තුල අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන අධිකරණ නිලධාරීන් වන කම්කරු වන්දි කොමසාරිස්, අතිරේක කම්කරු වන්දි කොමසාරිස් හා නියෝජ්‍ය කම්කරු වන්දි කොමසාරිස් යන තනතුරු 3 ක් හා සහකාර කම්කරු කොමසාරිස් තනතුරු 1 ක් ඇතුලත්ව තිබූ නමුත් දීර්ඝ කාලයක සිට මින් තනතුරු 3 ක්ම පුරප්පාඩුව පැවතුණි. මෙම පුරප්පාඩු පුරවා ගැනීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි. වන්දි නඩුවක් උසාවියට කැඳවීමට දීර්ඝ කාලයක් ගතවී තිබුණු අතර දිවයින පුරා පිහිටි කම්කරු උසාවි 14 ක වන්දි නඩු විභාග කිරීම එක් විනිශ්චයකාර වරයෙකු විසින් සිදුකිරීමද මෙයට හේතුවී තිබිය හැකිය. නිදසුනක් ලෙස කොළඹ කලාපය තුල පමණක් වාර්තා වී තිබූ මාරක අනතුරු අතරින් තීන්දුවක් නොලද, අවසන්වරට උසාවි කැඳවා වසර 2 සිට වසර 7 දක්වා කාලයක් ගත වී තිබූ ලිපිගොනු 26 ක් නිරීක්ෂණය විය.

(ආ) 2021 වර්ෂයේදී කම්කරු අමාත්‍යාංශයේ පුද්ගල පඩිනඩි සඳහා රු.483,931,657 ක් වැය වී තිබූ අතර අනුමත හා තත්‍ය කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තත්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 45 | 22 | 23 |
| (ii) | තෘතියික මට්ටම | 10 | 06 | 04 |
| (iii) | ද්විතියික මට්ටම | 897 | 783 | 114 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 57 | 32 | 25 |
| | එකතුව | 1,009 | 843 | 166 |

ජේ.සි.පි.සේනාරත්න
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට





# සිව්වන පරිච්ඡේදය

## කාර්යසාධන දර්ශක

## 4.1 ආමාත්‍යාංශයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

**වගුව 4-1** අමාත්‍යාංශයේ කාර්යසාධන දර්ශක

| | විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම | | |
|---|---|---|---|---|
| | | 100% - 90% | 75% - 89% | 50% - 74% |
| 1 | ශ්‍රමික අයිතිවාසිකම් තහවුරු කිරීම සඳහා අළුතින් පනවන ලද / සංශෝධනය කරන ලද නීති සංඛ්‍යාව * | 13 | 5 | 1 |
| 2 | අපරානුමත කරන ලද ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ සම්මුතීන් සඳහා වාර්ෂික වාර්තා කිරීම් සංඛ්‍යාව | 100% | | |
| 3 | කාර්මික සාමය වර්ධනය සඳහා එළඹි ප්‍රතිපත්තිමය තීරණ සංඛ්‍යාව * | 7 | | |
| 4 | වර්ෂය තුළ සිදු කළ සමස්ත කම්කරු පරීක්ෂණයන්ගෙන් ගුණාත්මකභාවයෙන් ඉහළ (A සහ B) කම්කරු පරීක්ෂණ සංඛ්‍යාවේ ප්‍රතිශතය | | ** | |
| 5 | ඉලක්කගත කම්කරු පරීක්ෂණ සංඛ්‍යාවෙන් සිදු කරන ලද පරීක්ෂණ සංඛ්‍යාවේ ප්‍රතිශතය | | | ** |
| 6 | ළමා ශ්‍රමය පිළිබඳ ලද පැමිණිලිවලින් පරීක්ෂණ සිදු කර අවසන් සංඛ්‍යාවේ ප්‍රතිශතය | | 69% | |
| 7 | සමාජ කතිකාව උදෙසා පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව ඉලක්කයෙහි ප්‍රතිශතයක් ලෙස | | | 17%*** |
| 8 | සේවක අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභ දින 14ක් තුළ ගෙවීම් ප්‍රතිශතය | | | 65% |
| 9 | සේවකයින්ගේ වෘත්තීය සෞඛ්‍ය හා ආරක්ෂාව වෙනුවෙන් බිහි කළ සුරක්ෂිතතා නිලධරයන් සංඛ්‍යාව | 100% | | |
| 10 | කම්කරු නීති පිළිබඳ ශ්‍රම බලකාය දැනුවත් කිරීම වෙනුවෙන් පවත්වන ලද පාඨමාලාවන් සංඛ්‍යාව | | | 72% |
| 11 | වෘත්තීය අනතුරු (මාරක හා මාරක නොවන) සම්බන්ධයෙන් අවසන් කළ යුතු නඩු සංඛ්‍යාවෙන් අවසන් කරන ලද සංඛ්‍යාව | | 77% | |
| 12 | එලදායිතා සංකල්ප පිළිබඳ අධ්‍යාපනය හා පුහුණුව ලබා දුන් සංඛ්‍යාව | 108% | | |

සටහන

* අවශ්‍යතා ඇති වන පරිදි එම ක්‍රියාකාරකම් සිදු කරන බැවින් අවසන් නිමැවුම නිශ්චිත නැත. එබැවින් ප්‍රතිශත වශයෙන් ඉදිරිපත් කළ නොහැක

** වර්ෂය තුළ පැවති කොඩිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් ක්ෂේත්‍ර පරීක්ෂණ සිදු කිරීම වර්ෂයේ ඇතැම් මාසයන්හිදී සම්පූර්ණයෙන්ම නවතා තිබීම සහ ක්ෂේත්‍ර පරීක්ෂණ සිදු කිරීම සීමා කිරීමට සිදු විය. එසේම, දිස්ත්‍රික් හා උප කම්කරු කාර්යාලයන්ගෙන් ප්‍රගති වාර්තා තවමත් ලැබෙමින් පවතින බැවින් මෙම අගයන් මේ අවස්ථාවේදී නිශ්චිතව සකස් කිරීම අපහසුව ඇත

*** කොවිඩ් 19 වසංගත තත්ත්වය යටතේ පැවති සීමා හේතුවෙන් සේව්‍ය සේවක දෙපාර්ශවය වැඩසටහන් සඳහා රැස්කිරීමට නොහැකි වීම හේතුවෙන් සමාජ කතිකා වැඩසටහන් පැවැත්වීමේ ප්‍රතිශතය වර්ෂය තුළ ඉලක්ක මට්ටම කරා ළඟා වීමට අපහසු වී ඇත

# පස්වන පරිච්ඡේදය

## තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

## 5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු

**වගුව 5-1** අමාත්‍යාංශයට අදාළ තිරසර සංවර්ධන අරමුණු

| ඉලක්කය / අරමුණ | | ඉලක්ක | | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය |
|---|---|---|---|---|---|
| 05 ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ළඟාකර සියලු කාන්තාවන් සහ ගැහැණු ළමුන් සවිබල ගැන්වීම | 5.1 | කාන්තාවන්ට හා ගැහැණු ළමුන්ට එරෙහිව සියලුම ස්ථානයන්හි සිදුවන්නා වූ සියලුම ආකාරයේ වෙනස්කොට සැලකීම් තුරන් කිරීම | 5.1.1. | ස්ත්‍රී පුරුෂභාවයට අදාළව සමානාත්මතාවය සහ වෙනස්කොට නොසැලකීම ප්‍රවර්ධනය, බලාත්මක කිරීම සහ අධීක්ෂණය පිණිස වන නෛතික රාමුවක් පවතින්නේද නැද්ද යන්න | • කාන්තාවන්ගේ සේවා කොන්දේසි පිළිබඳව කම්කරු දෙපාර්තමේන්තුවේ කාන්තා හා ළමා කටයුතු අංශය වෙත ලැබුණු පැමිණිලි අතරින් 2021 වර්ෂයට අයත් පැමිණිලි 02ක පරීක්ෂණ අවසන් කර ගොනු පියවන ලදී. 2018, 2019 හා 2020 වර්ෂයන්ට අයත් ගොනු 11කද පරීක්ෂණ අවසන් කර ගොනු පියවන ලදී. කොන්දේසි කඩවීම් සම්බන්ධයෙන් 2021 වසරේදී පැමිණිලි 11ක් සඳහා නඩු කටයුතු ආරම්භ කරන ලදී. (2020 වර්ෂයේ සිට පරීක්ෂා කරන ලද පැමිණිලි සඳහා මෙම නඩු 2021 වසරේ දී පවරන ලදී)<br>• ආයතන 302ක් ආවරණය වන පරිදි කාන්තා ශ්‍රමිකයන් පිළිබඳ විශේෂ කණ්ඩායම් පරීක්ෂණ සිදු කරන ලදී. මෙහිදී ආයතනික කොන්දේසි කඩ කිරීම් 30ක් වාර්තා වී ඇති අතර කොන්දේසි කඩවීම් යටතේ ආයතන 2ක් සඳහා නඩු පවරන ලදී |
| | 5.2 | මානව කූට්ටනය ලිංගික සහ වෙනත් ආකාරයේ දූෂණයන්ද ඇතුළත්ව කාන්තාවන්ට සහ ගැහැණු ළමුන්ට එරෙහිව පොදු සහ පෞද්ගලික ස්ථානයන්හි සිදුවන්නා වූ සියලුම ආකාරයේ ප්‍රචණ්ඩත්වයන් තුරන් කිරීම | 5.2.1 | පසුගිය මාස 12ක කාලය තුළදී, හිංසනයේ ස්වභාවය, සහ වයස අනුව, සහකරුවෙක් සිටි / සිටින, වයස අවුරුදු 15ට වැඩි කාන්තාවන් සහ ගැහැණු ළමුන් අතරින් කායික, ලිංගික, හෝ මානසික හිංසනයට ලක්වූ ප්‍රමාණය | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | 5. ඇ | ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානත්වය සහ සියලුම මට්ටම්වල කාන්තාවන් සහ ගැහැණු ළමුන් සවිබල ගැන්වීම සඳහා යහපත් ප්‍රතිපත්ති යොදා ගැනීම, ශක්තිමත් කිරීම සහ නීතිමය ලෙස බලාත්මක කිරීම | 5.ඇ.1 | ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සහ කාන්තාවන් සවිබල ගැන්වීම හඳුනා ගැනීමට සහ රාජ්‍ය මුදල් වෙන් කිරීමක් සහිත ක්‍රමයන් පවත්නා රටවල් ප්‍රමාණය | • කලාප කම්කරු කාර්යාල 11 හරහා එම කලාපවලට අයත් පෞද්ගලික අංශයේ සේවිකාවන් 30ක පමණ කණ්ඩායම් 8ක් සඳහා කාන්තාවන් හා ළමයින් සම්බන්ධ කම්කරු නීති සම්බන්ධයෙන් දැනුවත් කිරීම් සිදු කරන ලදී<br>• 2021 වර්ෂයේ කාන්තා දිනයට සමගාමීව කම්කරු දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා බාල දක්ෂිකා සංගමය සමඟ අත්වැල් බැඳ ගනිමින් බාල දක්ෂිකාවන් වෙත කම්කරු නීතිය පිළිබඳව දැනුම ලබා දීම තුළින් සමාජය දැනුවත් කිරීම සහ ඔවුන් සවිබල ගැන්වීම ඉලක්ක කර ගනිමින් දෙපාර්ශවය අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී<br>• "ශ්‍රී ලංකාවේ කම්කරු නීතිය කාන්තාවන්ගේ ආර්ථිකයට හිතකාමීද?" යන මාතෘකාව යටතේ 2021.03.05 දින Facebook සමාජ මාධ්‍ය ජාලය ඔස්සේ සජීවීව විකාශනය වූ සාකච්ඡාව සඳහා කම්කරු දෙපාර්තමේන්තුවේ සහභාගීත්වය ලබා දෙන ලදී. එහිදී කාන්තා සේවිකාවන්ගේ සේවා කාලය තුළ කම්කරු නීති අණ පනත් බලපාන ආකාරය පිළිබඳව දැනුවත් කිරීම සිදු කරන ලදී<br>• කාන්තාවන්ගේ වැඩපරිසරය සහ ලිංගික හිංසනය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහනක්ද කැළණිය පිහිටි පෞද්ගලික ආයතනයක සේවක සේවිකාවන් සඳහා පවත්වන ලදී<br>• කටුනායක සහ කොග්ගල නේවාසිකාගාර නේවාසිකාවන් සඳහා මනෝ විද්‍යාත්මක උපදේශන හා ඇගයුම් වැඩසටහන් පැවැත්වීමටද කටයුතු කරන ලදී |
| 08 | සියල්ලන් සඳහාම පෝෂිත, පරිපූර්ණ සහ තිරසර ආර්ථික වර්ධනය, පූර්ණ, ඵලදායී සහ යහපත් රැකියා ප්‍රවර්ධනය කිරීම | 8.5. | 2030 වන විට ආබාධිත පුද්ගලයින් සහ යෞවනයින් ද ඇතුළත්ව සියලුම කාන්තාවන් සහ පිරිමින් සඳහා ඵලදායී හා සුනිසි රැකියා අවස්ථාවන් ලබා දීම | 8.5.1 | රැකියාව, වයස සහ ආබාධ සහිත පුද්ගලයන් යන සාධක අනුව පිරිමි සහ ගැහැණු සේවා නියුක්තයන්ගේ පැයක සාමාන්‍ය ආදායම ඉපැයීම | කම්කරු නීති අනුව පෞද්ගලික හා අර්ධ රාජ්‍ය ආයතනයන්හි සේවා නියුක්තිකයන්ගේ පැයක සාමාන්‍ය ආදායම රැකියාව, වයස සහ ආබාධ සහිත පුද්ගලයන් යන සාධක අනුව හෝ ස්ත්‍රී පුරුෂභාවය අනුව වෙනස් නොවේ<br><br>ළමා ක්‍රියාකාරකම් වාර්තාව (Child Activity Survey - 2016) අනුව මෙරට ළමා ශ්‍රමය 1% වන අතර ශූන්‍ය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කෙරෙමින් පවතී |
| | | | | 8.5.2 | ස්ත්‍රී පුරුෂභාවය, වයස සහ ආබාධ සහිත පුද්ගලයන්ට අදාළව විරැකියා අනුපාතය | |
| | | 8.7 | බලහත්කාරයෙන් ශ්‍රමය ලබා ගැනීම තුරන් කිරීම සඳහා වහාම ඵලදායී ක්‍රියාමාර්ග ගැනීම, කාන්තාවන් වහල් සේවයේ යෙදවීම සහ මානව කුට්ටනය අවසන් කිරීම සහ ළමුන් සොල්දාදුවන් වශයෙන් බඳවා ගැනීම ද ඇතුළත්ව අතිශය නරක ආකාරයෙන් ළමා ශ්‍රමය යොදා ගැනීම තහනම් කිරීම සහ තුරන් කිරීම සහ 2025 වන විට සියලුම ආකාරයේ ළමා ශ්‍රමය යොදා ගැනීම අවසන් කිරීම | 8.7.1 | ස්ත්‍රී පුරුෂභාවය සහ වයස අනුව අවුරුදු 5-17 අතර ළමා ශ්‍රමිකයින් ලෙස යොදාගෙන ඇති ප්‍රමාණය සහ සංඛ්‍යාව | |

| | | | | | |
|---|---|---|---|---|---|
| | 8.8 | කම්කරු අයිතිවාසිකම් ආරක්ෂා කරගැනීම, විශේෂයෙන්ම සංක්‍රමණික කාන්තාවන් ඇතුළු සංක්‍රමණිකයින් සහ අවධානම් සහගත රැකියාවල නිරත වූවන් ඇතුලත්ව වැඩ කරන සියලුදෙනා සඳහා ආරක්ෂාකාරී සහ ප්‍රවේසම් සහගත සේවා ස්ථාන සහිත පරිසරයන් ප්‍රවර්ධනය කිරීම | 8.8.1 | ස්ත්‍රී පුරුෂභාවය සහ සංක්‍රමණික තත්ත්වය අනුව රැකියාව ආශ්‍රිත මාරක සහ මාරක නොවන අනතුරු සිදුවීමේ අනුපාතයන් | රැකියාව සම්බන්ධ මාරක හා මාරක නොවන අනතුරු සිදු වීම වාර්තා වුවත් එය ස්ත්‍රී පුරුෂභාවය අනුව සහ සංක්‍රමණික තත්වය අනුව වාර්තා තබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී |
| | | | 8.8.2 | ස්ත්‍රී පුරුෂභාවය සහ සංක්‍රමණික මට්ටම් අනුව, අන්තර්ජාතික කම්කරු සංවිධානයේ ලේඛන මූලාශ්‍ර ජාතික ව්‍යවස්ථාව පදනම්ව කම්කරු අයිතිවාසිකම් (රැස්වීමේ සහ සාමූහික කේවල් කිරීමේ නිදහස) සම්බන්ධයෙන් ඇති ජාතික අනුකූලතාවයේ මට්ටම | රැස්වීමේ හා කේවල් කිරීමේ නිදහස පවතින අතර, ඒ අනුව, 2020.12.31 දිනට මෙරට ලියා පදිංචි වෘත්තීය සමිති සංඛ්‍යාව 1,936කි<br>එසේම, 2021 වර්ෂය සඳහා අදාළ වාර්ෂික වාර්තා ILO වෙත යැවීමට කටයුතු කර ඇත. එම වාර්තාවල සඳහන් වූ කරුණුවල අඩුපාඩු ඉතා අවම බව ILO විද්වත් කමිටුවේ නිරීක්ෂණ තුළ සඳහන්ව ඇත. |



## 5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

2030 වර්ෂය වන විට ශ්‍රී ලංකාව විසින් සාක්ෂාත් කර ගත යුතු තිරසාර සංවර්ධන අභිමතාර්ථයන් අතරින්, කම්කරු අමාත්‍යාංශයේ මෙහෙවර අනුව අමාත්‍යාංශය වෙත සෘජුව අදාළ වනුයේ 08 වන අභිමතාර්ථයයි. එනම්, සියල්ලන් සඳහාම පෝෂිත, පරිපූර්ණ සහ තිරසර ආර්ථික වර්ධනය, පූර්ණ ඵලදායී සහ යහපත් රැකියා ප්‍රවර්ධනය කිරීම යන අභිමතාර්ථය වේ. ඒ අනුව, කම්කරු අමාත්‍යාංශයේ දැක්ම සහ මෙහෙවර මෙම අභිමතාර්ථය හා සමපාත වන අතර කම්කරු අමාත්‍යාංශයේ හා අනුබද්ධිත ආයතනවල සියලු ක්‍රියාකාරකම්හි අවසාන නිමැවුම වනුයේ මෙම අභිමතාර්ථය සාර්ථකව සාක්ෂාත් කර ගැනීම වේ. ඒ අනුව, ගත් කල අමාත්‍යාංශයේ සමස්ත ප්‍රගතිය මඟින් 08 වන අභිමතාර්ථය සාක්ෂාත් කර ගැනීමේ ප්‍රගතිය විද්‍යමාන වේ. මේ හැරුණු කොට 05 වන අභිමතාර්ථය වන ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ළඟාකර සියලු කාන්තාවන් සහ ගැහැණු ළමුන් සවිබල ගැන්වීම යන අභිමතාර්ථය ද අමාත්‍යාංශයේ ක්‍රියාකාරකම් අනුව අදාළ වේ.

## සයවන පරිච්ඡේදය

මානව සම්පත් පැතිකඩ

## 6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

**වගුව 6-1** 2021.12.31 දිනට අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලය

| තනතුර | අනුමත සංඛ්‍යාව | 2021.12.31 දිනට තත්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව අනුමත සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 273 | 171 | 102 | 37% |
| තෘතිය මට්ටම | 694 | 494 | 200 | 29% |
| ද්විතිය මට්ටම | 2,679 | 2,342 | 337 | 13% |
| ප්‍රාථමික මට්ටම | 558 | 467 | 91 | 16% |
| **එකතුව** | **4,204** | **3,474** | **730** | **17%** |

## 6.2 ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපා ඇති ආකාරය

අමාත්‍යාංශය හා අනුබද්ධිත ආයතනවල මානව සම්පත් හිඟය පහත පරිදි වේ.

**හිඟය**

- ජ්‍යෙෂ්ඨ මට්ටම 102
- තෘතීය මට්ටම 200
- ද්විතීය මට්ටම 337
- ප්‍රාථමික මට්ටම 91

**එකතුව 730**

මෙම මානව සම්පත් හිඟය හේතුවෙන් නිලධාරීන්ට තමාට නියමිත රාජකාරිවලට අමතරව පුරප්පාඩු තනතුරුවල ද රාජකාරි ඉටු කිරීමට සිදුවේ. විශේෂයෙන් විධායක නිලධාරි හිඟය ආයතනික ධූරාවලිය තුළ තීරණ ගැනීම, මූල්‍ය බලතල ආදී වගකීම් භාර ගැනීම මෙන්ම මඟ පෙන්වීම් පහසු කිරීම හා විධිමත් කිරීම වැනි අවස්ථාවලදී ප්‍රායෝගික ගැටළු උද්ගත වේ. ඒ හේතුවෙන් නිලධාරීන් කායිකව හා මානසිකව පීඩාවට පත් වන අතර නිලධාරීන්ගේ ප්‍රශස්ත කාර්යක්ෂමතාවය සහතිකව අපේක්ෂා කළ නොහැකි වනු ඇත. මේ තත්වය අමාත්‍යාංශයේ සමස්ත ඵලදායිතාවයට අහිතකර බලපෑමක් එල්ල කරනු ලබන බැවින් අමාත්‍යාංශයේ කාර්යක්ෂමතාවය පහත යෑමේ සම්භාවිතාවක් පවතින බව නිරීක්ෂණය වේ.

## 6.3 මානව සම්පත් සංවර්ධනය

### 6.3.1 අමාත්‍යාංශ නිලධරයන් දේශීය පුහුණු පාඨමාලා සඳහා සහභාගීත්වය

**වගුව 6-2** අමාත්‍යාංශ නිලධරයන් දේශීය පුහුණු පාඨමාලා සඳහා සහභාගීත්වය

| | වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසටහනේ කාල සීමාව | සමස්ත ආයෝජනය (රු.) | නිමැවුම / ලබාගත් දැනුම |
|---|---|---|---|---|---|
| 1 | විනය කාර්ය පටිපාටිය | 1 | පැය 06 | 3,500.00 | වඩාත් කාර්යක්ෂමව හා නිවැරදිව තම විෂයානුකූල කටයුතු සිදු කිරීම |
| 2 | කාර්යාල කළමනාකරණය හා මුදල් රෙගුලාසි | 1 | පැය 24 | 7,000.00 | වඩාත් කාර්යක්ෂමව හා නිවැරදිව තම විෂයානුකූල කටයුතු සිදු කිරීම |

| | | | | | |
|---|---|---|---|---|---|
| 3 | දේපළ / උපකරණ සබැඳිව වත්කම් පවත්වාගෙන යාම, නඩත්තු කිරීම | 1 | පැය 06 | 3,500.00 | වඩාත් කාර්යක්ෂමව හා නිවැරදිව තම විෂයානුකූල කටයුතු සිදු කිරීම |
| 4 | ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | 1 | පැය 06 | 3,500.00 | වඩාත් කාර්යක්ෂමව හා නිවැරදිව තම විෂයානුකූල කටයුතු සිදු කිරීම |
| 5 | පුහුණුව හා සංවර්ධනය | 1 | පැය 06 | 3,500.00 | වඩාත් කාර්යක්ෂමව හා නිවැරදිව තම විෂයානුකූල කටයුතු සිදු කිරීම |
| 6 | අභ්‍යන්තර විගණක නිලධාරීන් සඳහා වන පුහුණු වැඩසටහන | 1 | පැය 08 | - | වඩාත් කාර්යක්ෂමව හා නිවැරදිව තම විෂයානුකූල කටයුතු සිදු කිරීම |
| 7 | කාන්තා ධාරිතා සංවර්ධන වැඩසටහන | 9 | පැය 03 | - | යහපත් ආකල්පමය වෙනසක් ඇති කිරීම |
| 8 | සේවාරම්භක පුහුණුව (න්‍යායාත්මක දැනුම හා ක්ෂේත්‍ර චාරිකා සමඟ) | 22 | පැය 34 | 25,000.00 | වැඩ පරිසරය හඳුන්වා දීම හා රාජ්‍ය සේවයේ රාජකාරි කටයුතු සම්බන්ධව මූලික දැනුමක් ලබා දීම තුළින් වඩාත් කාර්යක්ෂමව හා නිවැරදිව තම විෂයානුකූල කටයුතු සිදු කිරීම |
| 9 | රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා වන උපායමාර්ගික සැලැස්ම වලංගුකරණය සඳහා වන වැඩමුළුව | 1 | පැය 06 | 19,240.00 | රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ඵලදායීව හා කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම |
| 10 | රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය | 1 | පළමු වසර | 175,000.00 | විෂය ක්ෂේත්‍රය පිළිබඳ පුළුල් දැනුමක් ලබා ගැනීම තුළින් වඩාත් කාර්යක්ෂමව හා රාජකාරී කටයුතු සිදු කිරීම<br>සේවා ව්‍යවස්ථාව අනුව සම්පූර්ණ කළ යුතු අවශ්‍යතාවකි |
| 11 | රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ පුහුණුව | 6 | පැය 45 | 7,200.00 | වඩාත් කාර්යක්ෂමව හා නිවැරදිව තම විෂයානුකූල කටයුතු සිදු කිරීම |
| 12 | පාරිභෝගික සේවා සැපයීම පිළිබඳ පුහුණුව | 3 | පැය 51 | 3,600.00 | වඩාත් කාර්යක්ෂමව හා නිවැරදිව තම විෂයානුකූල කටයුතු සිදු කිරීම |
| 13 | භෞතික වත්කම් සත්‍යාපනය පිළිබඳ පුහුණුව | 4 | පැය 37 | 4,000.00 | වඩාත් කාර්යක්ෂමව හා නිවැරදිව තම විෂයානුකූල කටයුතු සිදු කිරීම |



| | | | | | |
|---|---|---|---|---|---|
| 14 | රාජ්‍ය සේවකයන්ගේ විනය පිළිබඳ පවත්වනු ලබන පුහුණු වැඩසටහන | 6 | පැය 35 | 4,200.00 | වඩාත් කාර්යක්ෂමව හා නිවැරදිව තම විෂයානුකූල කටයුතු සිදු කිරීම |
| 15 | වෘත්තීය සංවර්ධනය පිළිබඳ පුහුණුව | 6 | පැය 25 | 4,200.00 | වඩාත් කාර්යක්ෂමව හා නිවැරදිව තම විෂයානුකූල කටයුතු සිදු කිරීම |
| 16 | නායකත්වය හා අභිප්‍රේරණය පිළිබඳ පුහුණුව | 6 | පැය 50 | 9,600.00 | වඩාත් කාර්යක්ෂමව හා නිවැරදිව තම විෂයානුකූල කටයුතු සිදු කිරීම |
| 17 | සේවා අංශය සඳහා සුහුරු පරිවර්තනය පිළිබඳ වැඩමුළුව | 20 | දින 03 | - | වඩාත් කාර්යක්ෂමව හා නිවැරදිව තම විෂයානුකූල කටයුතු සිදු කිරීම |
| 18 | ඉහළ කාර්යසාධන කළමනාකරණය පිළිබඳ වැඩමුළුව | 10 | දින 03 | - | වඩාත් කාර්යක්ෂමව හා නිවැරදිව තම විෂයානුකූල කටයුතු සිදු කිරීම |
| 19 | තාක්ෂණික විශේෂඥ සේවා වැඩසටහන - රාජ්‍ය අංශය සඳහා විශාල දත්ත පිළිබඳ වැඩමුළුව | 2 | දින 03 | - | වඩාත් කාර්යක්ෂමව හා නිවැරදිව තම විෂයානුකූල කටයුතු සිදු කිරීම |
| 20 | බැහැරගත නායකත්ව හා පෞරුෂ සංවර්ධන වැඩමුළුව | 50 | දින 02 1/2 | 440,000.00 | කණ්ඩායම් හැඟීම් වර්ධනය තුළින් සමස්ත කාර්යක්ෂමතාව හා ඵලදායීතාව ඉහළ නැංවීම |

### 6.3.2 කම්කරු දෙපාර්තමේන්තුවේ නිලධරයන් දේශීය පුහුණු පාඨමාලා සඳහා සහභාගීත්වය

**වගුව 6-3** කම්කරු දෙපාර්තමේන්තුවේ නිලධරයන් දේශීය පුහුණු පාඨමාලා සඳහා සහභාගීත්වය

| | වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසටහනේ කාල සීමාව | සමස්ත ආයෝජනය (රු.) | නිමැවුම / ලබාගත් දැනුම |
|---|---|---|---|---|---|
| 1 | කාන්තා දිනයට සමගාමීව පැවැත්වූ ධාරිතා සංවර්ධන පුහුණු වැඩසටහන | 150 | දින 01 | 95,720.00 | නිලධාරීන්ගේ රස වින්දනය ඉහළ නැංවීම හා ධාරිතා සංවර්ධනය |

| | | | | | |
|---|---|---|---|---|---|
| 2 | ශ්‍රමික පරීක්ෂණ වාර්තා සංශෝධනය පිළිබඳ දැනුවත් කිරීම හා වෘත්තීය ස්වස්ථතාවය හා කර්මාන්තමය සුරක්ෂතතාව පිළිබඳව නිලධාරීන් පුහුණු කිරීම | 175 | දින 02 | 162,650.00 | සංශෝධිත ශ්‍රමික පරීක්ෂණ වාර්තා අත්හදා බැලීම සඳහා අවශ්‍ය උපදෙස් සහ ක්‍රියා පිළිවෙල හඳුන්වාදීම |
| 3 | සේ.අ.අ. අය කිරීම් දත්ත පද්ධතිය සම්බන්ධයෙන් කාර්යාල මට්ටමින් නිලධාරීන් දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන | 68 | දින 01 | 128,875.00 | සේ.අ.අ. අය කිරීම් දත්ත පද්ධතිය සම්බන්ධයෙන් නිලධාරීන් සතු දැනුම යාවත්කාලීන කිරීම සහ ගැටළු නිරාකරණය කිරීම |
| 4 | බහුකාර්ය සංවර්ධන සහයක සේවාරම්භක පුහුණු වැඩසටහන | 18 | දින 01 | 11,740.00 | රාජකාරි කටයුතු සඳහා අවශ්‍ය දැනුම ලබා දීම |
| 5 | විශේෂ විමර්ශන අංශයේ සංවර්ධන නිලධාරීන් සඳහා වන පුහුණුව | 04 | දින 02 | 8,280.00 | විමර්ශන කණ්ඩායමෙහි කටයුතු පිළිබඳව දැනුවත් කිරීම |
| 6 | නවක සංවර්ධන නිලධාරීන් සඳහා පැවැත්වූ සේවාරම්භක පුහුණුව (මාර්ගගත ක්‍රමය) | 91 | දින 07 | 21,900.00 | ලිපි ගොනු කළමනාකරණය හා කාර්යාල ක්‍රම පිළිබඳව නිලධාරීන් පුහුණු කිරීම |
| 7 | ස.කම්.කො. සේවාරම්භක පුහුණුව | 08 | දින 02 | 112,055.00 | රාජකාරි කටයුතු සඳහා අවශ්‍ය දැනුම ලබා දීම සහ සේවාරම්භක පුහුණුව ලබා දීම |
| 8 | කම්කරු දෙපාර්තමේන්තුවට ලැබෙන පැමිණිලි හා පෙත්සම් විසඳීම සඳහා වන සම්මත කාර්ය පරිපාටිය ක්‍රියාත්මක කිරීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන (SOP - 2021) (මාර්ගගත ක්‍රමය) සිංහල හා දෙමළ මාධ්‍ය | 118 | දින 02 | - | පැමිණිලි හා පෙත්සම් විසඳීම සඳහා වන සම්මත කාර්ය පරිපාටිය ක්‍රියාත්මක කිරීම පිළිබඳ දැනුවත් කිරීම |
| 9 | 30% ගෙවීම් සහ "L" අංශයේ සේවා පිළිබඳ පුහුණු වැඩසටහන (මාර්ගගත ක්‍රමයට) | 100 | දින 02 | 3,870.00 | 30% ගෙවීම් සහ "L" අංශයේ සේවා පිළිබඳ නිලධාරීන්ගේ දැනුම යාවත්කාලීන කිරීම |
| 10 | රාජ්‍ය මූල්‍ය කළමනාකරණ ක්‍රියාවලිය හා රාජ්‍ය ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳව නිලධාරීන් දැනුවත් කිරීම - 2021 (මාර්ගගත ක්‍රමයට) | 75 | දින 03 | 11,850.00 | රාජ්‍ය මූල්‍ය කළමනාකරණ ක්‍රියාවලිය හා ප්‍රසම්පාදන ක්‍රියාවලිය සම්බන්ධයෙන් ඇති ගැටළු නිරාකරණය කිරීම |
| 11 | සුනිසි මෙහෙවර වැඩසටහන යටතේ සැඟවුණු සේවා නියුක්ති සබඳතාවය පිළිබඳව නිලධාරීන් දැනුවත් කිරීම - 2021 (මාර්ගගත ක්‍රමය) | 520 | දින 06 | 35,515.00 | සැඟවුණු සේවා නියුක්ති සබඳතාවය පිළිබඳව හඳුන්වා දීම |
| 12 | සේ.අ.අ. අයකිරීම් දත්ත පද්ධතිය හා ප්‍රතිලාභ ගෙවීම් අංශයේ සේවා පිළිබඳ පුහුණු වැඩසටහන (මාර්ගගත ක්‍රමයට) | 526 | දින 04 | 18,900.00 | සේ.අ.අ. අයකිරීම් දත්ත පද්ධතිය හා ප්‍රතිලාභ ගෙවීම් අංශයේ සේවා පිළිබඳව නිලධාරීන් සතු දැනුම යාවත්කාලීන කිරීම සහ ගැටළු නිරාකරණය කිරීම |
| 13 | පනත් හඳුන්වාදීම, නව පනත් සංශෝධන සහ පැමිණිලි විමර්ශනය, සාක්ෂි රැස් කිරීම හා නඩු පැවරීම පිළිබඳ පුහුණු වැඩසටහන - මධ්‍යම කලාපය සහ දකුණු කලාපය | 130 | එක් කලාපයක් සඳහා දින 01 බැගින් | 129,700.00 | නිලධාරීන්ගේ දැණුම යාවත්කාලීන කිරීම හා ගැටළු නිරාකරණය කිරීම |
| 14 | රා.ප.ච.18/2020 අනුව පවත්වන භාෂා පුහුණු පාඨමාලාව - ප්‍රාථමික සේවා මට්ටම | 43 | පැය 100 | 75,000.00 | නිලධාරීන්ගේ දෙමළ භාෂා දැනුම වර්ධනය කිරීම |
| 15 | රා.ප.ච.18/2020 අනුව පවත්වන භාෂා පුහුණු පාඨමාලාව - ද්විතීයික සේවා මට්ටම | 136 | පැය 150 | 225,000.00 | නිලධාරීන්ගේ දෙමළ භාෂා දැනුම වර්ධනය කිරීම |

| | | | | | |
|---|---|---|---|---|---|
| 16 | රා.ප.චි.18/2020 අනුව පවත්වන භාෂා පුහුණු පාඨමාලාව - ජ්‍යෙෂ්ඨ සේවා මට්ටම | 98 | පැය 200 | 150,000.00 | නිලධාරීන්ගේ දෙමළ භාෂා දැනුම වර්ධනය කිරීම |
| 17 | කම්කරු නීතිය සහ කාර්මික සබඳතා පිළිබඳ උසස් ජාතික පාඨමාලාව (NILS) | 05 | | 200,000.00 | වඩාත් කාර්යක්ෂමව හා නිවැරදිව තම විෂයානුකූල කටයුතු සිදු කිරීම |
| 18 | පුද්ගලික ලිපි ගොනු කළමණාකරණය පිළිබඳ පුහුණු වැඩසටහන - ශ්‍රී ලංකා පදනම් ආයතනය | 07 | 2021.03.31 | 26,600.00 | වඩාත් කාර්යක්ෂමව හා නිවැරදිව තම විෂයානුකූල කටයුතු සිදු කිරීම |
| 19 | රාජ්‍ය නිලධාරීන් සඳහා පවත්වනු ලබන ඵලදායිතා සහතික පත්‍ර පාඨමාලාව (මාර්ගගත) | 42 | පැය 20 | - | වඩාත් කාර්යක්ෂමව හා නිවැරදිව තම විෂයානුකූල කටයුතු සිදු කිරීම |
| 20 | කාර්මික සබඳතා හා මානව සම්පත් කළමණාකරණ පශ්චාත් උපාධිය | 01 | - | 100,000.00 | විෂය ක්ෂේත්‍රය පිළිබඳ පුළුල් දැනුමක් ලබා ගැනීම තුළින් වඩාත් කාර්යක්ෂමව රාජකාරී කටයුතු සිදු කිරීම සේවා ව්‍යවස්ථාව අනුව සම්පූර්ණ කළ යුතු අවශ්‍යතාවකි |
| 21 | තොරතුරු පද්ධති කළමණාකරණ පශ්චාත් උපාධිය | 01 | - | 139,250.00 | එම |
| 22 | වෘත්තීය සුරක්ෂිතතාවය හා සෞඛ්‍ය කළ. පශ්චාත් උපාධිය (මොරටුව විශ්ව විද්‍යාලය) | 01 | - | 103,500.00 | එම |
| 23 | නීතිවේදී පශ්චාත් උපාධි පාඨමාලාව | 02 | - | 303,000.00 | එම |
| 24 | නීතිවේදී උපාධි පාඨමාලාව | 03 | - | 97,050.00 | එම |
| 25 | පරිසර විද්‍යාව පශ්චාත් උපාධි පාඨමාලාව | 01 | - | 200,000.00 | එම |



| | | | | | |
|---|---|---|---|---|---|
| 26 | රාජ්‍ය පරිපාලනය සහ කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධිය | 05 | - | 425,000.00 | එම |
| 27 | දර්ශනපති උපාධිය | 01 | - | 75,000.00 | එම |

### 6.3.3 විදේශ පුහුණු පාඨමාලා සඳහා නිලධරයන්ගේ සහභාගීත්වය

**වගුව 6-4** විදේශ පුහුණු පාඨමාලා සඳහා නිලධරයන්ගේ සහභාගීත්වය

| | වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසටහනේ කාල සීමාව | නිමැවුම / ලබාගත් දැනුම |
|---|---|---|---|---|
| 1 | ILO Regional Tripartite Meeting Towards a More Resilient, Inclusive and Sustainable Garment and Textiles Sector in Asia and the Pacific | 02 | 2021.10.18/ 2021.10.20 | ආසියා සහ පැසිෆික් කලාපයේ ඇඟලුම් සහ රෙදිපිළි කර්මාන්තයන්හි තිරසරභාවය හා නව ප්‍රවණතා පිළිබඳ දැනුවත් වීම |
| 2 | Online South Asian Regional Tripartite Training Course on “Evidence – based Policy Making for Decent Work” | 02 | 2021.11.22/ 2021.11.26 | වඩාත් කාර්යක්ෂමව හා නිවැරදිව තම රාජකාරී කටයුතු සිදු කිරීම |
| 3 | Multi – Country Observation Study Mission on Data Governance in the Public Sector to Improve Productivity | 01 | 2021.11.24/ 2021.11.25 | වඩාත් කාර්යක්ෂමව හා නිවැරදිව තම රාජකාරී කටයුතු සිදු කිරීම |
| 4 | Development of APO – Certified Public Sector Productivity Specialists | 01 | 2021.12.06/ 2021.12.10 | වඩාත් කාර්යක්ෂමව හා නිවැරදිව තම රාජකාරී කටයුතු සිදු කිරීම |
| 5 | Fourth Meeting of the Special Tripartite Committee of the Maritime Labour Convention 2006, as amended (MLC, 2006), Geneva | 02 | 2021.04.19/ 2021.04.23 | සමුද්‍රීය කම්කරු සම්මුතිය, 2006ට අදාළව වාර්තා සම්පාදනය කිරීම පිළිබඳ දැනුම ලබා ගැනීම, සමුද්‍රීය අංශයේ හා වසංගතය සහ සමුද්‍ර ආශ්‍රිත ජාත්‍යන්තර ශ්‍රමය සමාලෝචනය කිරීම සම්බන්ධ දැනුම ලබා ගැනීම |

| | | | | |
|---|---|---|---|---|
| 6 | Bilateral Seminar on the "Belt and Road" International Capacity Cooperation for Sri Lanka | 05 | 2021.05.11/ 2021.05.31 | "Belt and Road" වැඩසටහන යටතේ චීනය සහ ශ්‍රී ලංකාව අතර ප්‍රායෝගික සහයෝගීතාව ප්‍රවර්ධනය කිරීම හා ශ්‍රී ලංකාවට අත්වන ප්‍රතිලාභ පිළිබඳ අවබෝධය ලබා ගැනීම |
| 7 | Scholarship for online training on "Best Practices in International Labour Standards Reporting" | 01 | 2021.03.22/ 2021.05.14 | අපරානුමත කර ඇති ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ (ILO) සම්මුතීන්වලට අදාළ වාර්ෂික වාර්තා සම්පාදනය පිළිබඳ කුසලතාවය ලබා ගැනීම |
| 8 | Technical meeting on the future of work in the education sector in the context of lifelong learning for all, skills, and the Decent Work Agenda | 01 | 2021.05.17/ 2021.05.21 | අධ්‍යාපන ක්ෂේත්‍රයේ අනාගත ප්‍රවණතා පිළිබඳ දැනුම ලබා ගැනීම |
| 9 | Meeting of experts to discuss and adopt a code of practice on safety and Health in Textiles, Clothing, Leather and Footwear, Geneva | 02 | 2021.10.04/ 2021.10.08 | රෙදිපිළි, ඇඳුම් පැළඳුම්, සම් සහ පාවහන් කර්මාන්තයන්හි ආරක්ෂාව සහ සෞඛ්‍ය පිළිවෙත් පිළිබඳ අවබෝධය ලබා ගැනීම |
| 10 | Seminar on Building and Developing of Employment Service System in Developing Countries, China | 01 | 2021.11.09/ 2021.11.22 | රැකියා සේවා පද්ධතිය ගොඩනැගීම සහ සංවර්ධනය පිළිබඳ දැනුම ලබා ගැනීම |
| 11 | Capacity building workshop on Wage Concepts and Wage Setting Process for Informal and Home-based Workers in Lower Tiers of the Supply Chains | 05 | 2021.10.11/ 2021.10.14 | සැපයුම්දාමයේ පහළ ස්ථරවල සිටින ගෘහාශ්‍රිත හා අවිධිමත් ක්ෂේත්‍රයේ කම්කරුවන් සඳහා වැටුප් සංකල්ප සහ වැටුප් සැකසීමේ ක්‍රියාවලිය පිළිබඳ, ජාතික ධාරිතා ගොඩනැගීම පිළිබඳ අවබෝධය ලබා ගැනීම |
| 12 | Technical meeting on the future of work in aquaculture in the context of the rural economy, Geneva | 02 | 2021.12.13/ 2021.12.17 | ග්‍රාමීය ආර්ථිකය සඳහා ජලජීවී වගාවේ නව ප්‍රවේශයන් උපයෝගී කර ගත හැකි ආකාරය පිළිබඳ අවබෝධය ලබා ගැනීම |
| 13 | Seminar on Industrial Park Construction for Belt and Road Countries | 04 | 2021.10.28/ 2021.11.10 | කර්මාන්තපුර ඉදිකිරීම පිළිබඳ දැනුම ලබා ගැනීම |
| 14 | The 4th ILO Employment Policy Research Symposium on "Employment policies for job-rich recovery and a better future of work" | 02 | 2021.11.15/ 2021.11.16 | රැකියා ප්‍රතිපත්ති පර්යේෂණ පිළිබඳ දැනුම ලබා ගැනීම |
| 15 | Sri Lanka Tripartite Participation in South Africa NEDLAC Annual Summit | 07 | 2021.12.07 | දකුණු අප්‍රිකාවේ NEDLAC වාර්ෂික සමුළුවට ශ්‍රී ලංකා ත්‍රෛපාර්ශවික සහභාගීත්වය සිදු කිරීම |

### 6.3.4 අමාත්‍යාංශයේ කාර්යසාධනයට පුහුණු වැඩසටහන්වල දායකත්වය

අමාත්‍යාංශයේ නිලධාරින් වෙත ලබා දෙන පුහුණු වැඩසටහන් තුළින් සාක්ෂාත් කරගැනීමට බලාපොරොත්තු වන අරමුණු කිහිපයක් වේ. නිලධාරින්ගේ ධාරිතා සංවර්ධනය හා මානව සම්පත් සංවර්ධනය ඉන් ප්‍රධානය. සීමිත ප්‍රතිපාදන සහ සම්පත් සමඟ කටයුතු කරමින් නව මාධ්‍ය හා තාක්ෂණය තම රාජකාරී වෘත්තිය සංවර්ධනය සඳහා භාවිතා කිරීමට නිලධාරින් පෙළඹවීම තුළින් ඔවුන්ගේ රාජකාරි ඵලදායිතාව ඉහළ නැංවීමට මෙම පුහුණු වැඩසටහන් ඉතා උපකාරී වේ. තවද ආකල්පමය වශයෙන් නිලධාරීන් සංවර්ධනය කිරීම තුළින් හා නිලධාරින්ගේ භාෂා නිපුණතාවය ඉහළ නැංවීම තුළින් මහජනතාවට වඩා සමීප සේවාවක් ලබාදීමට නිලධාරීන්ට හැකි වන අතර එය ඵලදායී ආයතනික අන්තර් සම්බන්ධතා ගොඩනැගීමටද ඉවහල් වේ. ක්‍රමානුකූල මනා අධ්‍යයනයකින් හඳුනාගත් පුහුණු අවශ්‍යතා සඳහා අදාළ නිලධාරින් නිසි පරිදි යොමු කිරීමෙන් රාජ්‍ය සේවයේ අත්දැකීම් බහුල පළපුරුදු තෘප්තිමත් නිලධාරි කණ්ඩායමක් බිහි කිරීම මෙම පුහුණු වැඩසටහන්වලට යොමු කිරීමේ පොදු අරමුණ වේ.

නිලධාරීන්ගේ පුහුණු වැඩසටහන් සැලසුම් කිරීම පහත ප්‍රධාන සංරචකයන් යටතේ සිදු කර ඇත.

- සේවාරම්භක පුහුණු
- නායකත්වය හා ආකල්ප සංවර්ධන පුහුණු
- විෂයානුබද්ධ පුහුණු

අදාළ සංරචක යටතේ නිලධාරීන් වෙත සිදු කරන ලද පුහුණුවීම් පිළිබඳ තොරතුරු ඉහතින් දක්වා ඇති අතර රට තුළ පැවති කොවිඩ් - 19 වසංගත තත්වය හමුවේ අපේක්ෂිත පරිදි පුහුණු පාඨමාලා සිදු කර ගත නොහැකි විය.

## සත්වන පරිච්ඡේදය

අනුකූලතා වාර්තාව

**වගුව 7-1** අනුකූලතා වාර්තාව

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දි වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **1** | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ / ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේද** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූල වේ | | |
| 1.2 | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් | අනුකූල වේ | | |
| 1.3 | ව්‍යාපාර නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්) | අදාළ නැත | | |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම් | අදාළ නැත | | |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම් | අදාළ නැත | | |
| 1.6 | වෙනත් | | | |
| **2** | **පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු. රෙ. 445)** | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන/පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීනව පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීනව පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.5 | සියලුම මාසික ගිණුම සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | - | | |

| | | |
|---|---|---|
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (GAN20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ |
| **3** | **මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)** | |
| 3.1 | ආයතනය තුළ මූල්‍ය බලතල පවරා දී තිබීම | අනුකූල වේ |
| 3.2 | මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම | අනුකූල වේ |
| 3.3 | සෑම ගණුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම | අනුකූල වේ |
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | අනුකූල වේ |
| **4** | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කර ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූල වේ |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම | අනුකූල වේ |
| **5** | **විගණන විමසුම්** | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියලුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම | අනුකූල වේ |
| **6** | **අභ්‍යන්තර විගණනය** | |
| 6.1 | මු.රෙ.134 (2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ පිළිතුරු සපයා තිබීම | අනුකූල වේ |
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම | අනුකූල වේ |
| 6.4 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ |
| **7** | **විගණන හා කළමනාකරණ කමිටු** | |
| 7.1 | DMA චක්‍රලේඛ 1-2016-9 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 4ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම | අනුකූල වේ |
| **8** | **වත්කම් කළමනාකරණය** | |
| 8.1 | අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම හා අපහරණය කිරීම පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධිකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත්කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත වාර්තා කර තිබීම | අනුකූල වේ |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදු කොට තිබීම | අනුකූල වේ |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම | අනුකූල වේ |

| | | | |
|---|---|---|---|
| **9** | **වාහන කළමනාකරණය** | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | අනුකූල වේ | |
| 9.2 | වාහන ගර්හිත වී මාස 06කෙට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම | අනුකූල වේ | |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම | අනුකූල වේ | |
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම | අනුකූල වේ | |
| 9.6 | කල්බදු කාලසීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරාගෙන තිබීම | අනුකූල වේ | |
| **10** | **බැංකු ගිණුම් කළමනාකරණය** | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | |
| 10.2 | සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම | අනුකූල නොවේ | අදාළ නැත |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුලත නිරවුල් කර තිබීම | අනුකූල වේ | |
| **11** | **ප්‍රතිපාදන උපයෝජනය** | | |
| 11.1 | සලසා තිබෙන ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | අනුකූල වේ | |
| 11.2 | මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම | අනුකූල වේ | |
| **12** | **රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්** | | |
| 12.1 | සීමවන්ට අනුකූල වීම | අනුකූල වේ | |
| 12.2 | හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම | අනුකූල වේ | |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම | අනුකූල වේ | |
| **13** | **පොදු තැන්පත් ගිණුම** | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර තිබීම | අනුකූල වේ | |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | |
| **14** | **අග්‍රිම ගිණුම** | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම | අනුකූල වේ | |
| 14.2 | මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | |
| 14.3 | මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම | අනුකූල වේ | |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම | අනුකූල වේ | |
| **15** | **ආදායම් ගිණුම** | | |
| 15.1 | අදාළ රෙගුලාසිවලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම | අනුකූල වේ | |
| 15.2 | රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම | අනුකූල වේ | |
| 15.3 | මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | |
| **16** | **මානව සම්පත් කළමනාකරණය** | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම | අනුකූල වේ | |

| | | | |
|---|---|---|---|
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම | අනුකූල වේ | |
| 16.3 | 20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | |
| **17** | **මහජනයා වෙත තොරතුරු ලබා දීම** | | |
| 17.1 | තොරතුරු දැනගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත්කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා / චෝදනා පළ කිරීමට පහසුකම් සලසා තිබීම | අනුකූල වේ | |
| 17.3 | තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | |
| **18** | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කිරීම | අනුකූල වේ | |
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම | අනුකූල වේ | |
| **19** | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම | අනුකූල වේ | |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම | අනුකූල වේ | |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ අමුණුම 01හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කර තිබීම | අනුකූල නොවේ | සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කෙරෙමින් පවතී |
| 19.4 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම | අනුකූල වේ | |
| **20** | **විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම** | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම | අනුකූල වේ | |